# භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

" ශ්‍රී ලංකාවේ ඛනිජ කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන් අපි වෙමු "

# වාර්ෂික වාර්තාව

# 2011


භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

අංක 04, ගාලු පාර, දෙහිවල.

දු.ක. : 011 2739307, 2739308

ෆැක්ස් : 0112735752

විද්‍යුත් තැපෑල : gsmb@slt.lk

වෙබ් අඩවිය : www.gsmb.gov.lk



" ශ්‍රී ලංකාවේ ඛනිජ කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන් අපි වෙමු "

නයාරු, පුල්මුඩේ (ඉල්මනයිට්, රූටයිල් සහ සර්කෝන්), තිරුක්කෝවිල් (ඉල්මයනිට්), හම්බන්තොට (ගානට්), දෙවිනුවර (ඉල්මනයිට් සහ ගානට්), ඉඳුරුව, බේරුවල, (මොනසයිට්, සර්කෝන් සහ ගානට්) කැළණි ගංගා මෝය (ඉල්මනයිට්) මීගමුව උතුර (ඉල්මනයිට්) කුදිරමලෙයි තුඩුව (මොනසයිට්) සහ මන්නාරම දකුණ (ඉල්මනයිට්) යන ස්ථානවල ලංකාවේ මුහුදු වෙරළ ආශ්‍රිත ඛනිජ නිධි පිහිටා ඇත.

ඡායාරූප : ජී. ඒ. බී. පී. චන්දිමාල් (භූ. ස. ප. කැ)
සැකසුම : කෞශල්‍යා චතුරානි

## දැක්ම සහ මෙහෙවර

### දැක්ම

භූ විද්‍යාත්මක තොරතුරු ගවේෂණය සහ ව්‍යාප්තිය සිදු කරන සහ බොහෝ සෙයින් කල් පවත්නා ආකාරයෙන් ශ්‍රී ලංකාවේ ඛණිජ සම්පත් කැනීම් ක්‍රියාවලිය නියාමනය කරනා ප්‍රධාන ජාතික භූ විද්‍යා නියෝජිතායතනය වශයෙන් කටයුතු කිරීම.

### මෙහෙවර

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ මෙහෙවර වන්නේ ප්‍රතිපත්ති සකස් කරන්නන්ට සහ ජනතාවට භූ විද්‍යා තොරතුරු උපදෙස් සහ සේවා සැපයීම සහ පාරිසරික වශයෙන් කල් පැවැත්ම පවත්වා ගැනීමට වග බලා ගනිමින් ආර්ථික සංවර්ධනය වෙනුවෙන් රටේ ඛනිජ සම්පත් කළමනාකරණය සහ ප්‍රවර්ධනය කිරීමයි. ඛනිජ ගවේෂණය, නිස්සාරණය, වටිනාකම, එකතුව, ප්‍රවාහනය සහ වෙළඳාම නියාමනය කිරීමද එය සිදු කරයි.

## භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි කාර්යයන් පහත දැක්වේ :

ශ්‍රී ලංකාවේ භූ විද්‍යා සිතියම්ගත කිරීම් ක්‍රමානුකූල ලෙස සිදු කිරීම සහ භූ විද්‍යා සිතියම් සකස් කිරීම

ශ්‍රී ලංකාවේ ඛණිජ සම්පත් හඳුනාගෙන ඒවා තක්සේරු කිරීම

ඛණිජ සැකැස්ම සහ අපනයනය කිරීම සඳහා පතල් කැනීමේ වාණිජමයශක්‍යතාවය ඇගයීම

ඛණිජ ගවේෂණය හා කැනීම සහ සැකසීම, බලපත්‍ර ලබාදීම තුළින් ඛනිජ වෙළඳාම සහ අනයනය යන කටයුතු නියාමනය කිරීම

භූ විද්‍යා විමර්ශන සිදු කිරීම, භූ කම්පන කටයුතු සමීක්ෂණය කිරීම, භූ විද්‍යා පර්යේෂණ සිදු කිරීම සහ භූ විද්‍යා උපදේශන සේවා සැපයීම

වාණිජමය පදනමක් මත ඛනිජ නිෂ්පාදනය සහ නිස්සාරණය ප්‍රවර්ධනය කිරීම උදෙසා ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් ලබා දීම

භූ ඉංජිනේරු විද්‍යාවට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ භූ විද්‍යාත්මක උවදුරු සහ විනාශයන් පිළිබඳව උපදෙස් හා ප්‍රතිකර්ම ලබා දීම

# පටුන


| | |
|---|---|
| සභාපති තුමාගේ පණිවිඩය | 1 |
| අධ්‍යක්ෂ ජෙනරාල් තුමාගේ පණිවිඩය | 2 |
| කළමනාකාරිත්ව මණ්ඩලය | 4 |
| කාර්යමණ්ඩල සාමාජිකයෝ | 4 |
| කාර්යාංශය ගැන | 6 |
| භූ. ස. ප. කා. හි කටයුතු වලට අදාළ තොරතුරු ලබා ගත හැකි ස්ථාන | 7 |
| ඓතිහාසික පසුබිම | 8 |
| ආංශයික කාර්යසාධනය | |
| භූ විද්‍යා සමීක්ෂණ අංශය | 9 |
| කැනීම් අංශය | 17 |
| මූල්‍ය සමාලෝචනය | 26 |
| පරිපාලන සමාලෝචනය | 28 |
| නීතිමය අංශයේ කාර්යසාධනය | 29 |
| මූල්‍ය වාර්තාව | 30 |
| ආදායම් ප්‍රකාශ | 32 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 37 |
| විගණකාධිපතිගේ වාර්තාව | 61 |
| විගණකාධිපතිගේ වාර්තාව සඳහා පිළිතුරු - 2011 | 74 |
| භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ආයතනික සමාජ වගකීම් | 82 |

## සභාපති තුමාගේ පණිවිඩය



භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ සභාපතිවරයා ලෙස 2008 වර්ෂයේ මුල් භාගයේදී මම වැඩ භාර ගත්තෙමි. අපගේ සියලු අංශවල ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කරමින් සමාලෝචිත වර්ෂය තුළදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ඉතා යහපත් මූල්‍යමය ප්‍රතිඵල පෙන්නුම් කරන ලදී. මෙම මූල්‍ය වර්ෂය තුළදී රු. මිලියන 618.5 ක අතිරික්තයක් කාර්යාංශය විසින් වාර්තා කරන ලදී.

ඛනිජ අංශයේ සහ කැනීම් ආශ්‍රිත කටයුතු වලදී අවුරුදු 108 ක සේවාවක් කාර්යාංශය විසින් සපුරනු ලැබ ඇත. කාර්යාංශයේ ඉතිහාසය සලකා බැලීමේදී එය 1903 වර්ෂයේදී ආනන්ද කුමාරස්වාමි මහතාගේ මූලිකත්වය යටතේ ලංකා ඛනිජ ගවේෂණ ආයතනය ලෙස ආරම්භ වූ බව ප්‍රකාශ කළ හැකිය. තම කටයුතු අතින් තවත් යෝධ පිම්මක් පැනීමට අපි දැන් සූදානම්ව සිටිමු. මෙම නව අභියෝගයන්ට මුහුණදීම සියළුම සේවකයන් සතු කාර්යභාරයක් වන අතර මේ වන විට ලබා ගෙන ඇති අත්දැකීම් තුළින් උපරිම ප්‍රයෝජනය අපි ලබා ගත යුතු වෙමු.

2011 වර්ෂය සඳහා අප කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශන ඔබ වෙත ඉදිරිපත් කිරීමේ ගෞරවය මා වෙත හිමි වී ඇති අතර එම වර්ෂය රටට පුළුල් වූ සංවර්ධන සැලසුම් යෝජනා කොට අනාගතය වෙත යෝධ පිම්මක් පැනීමට අප සූදානම් කරන ලද වර්ෂයකි.

මෙම කාලපරිච්ඡේදය තුළදී ලබා ගන්නා ලද අත්දැකීම් තුළ අපගේ කටයුතු සම්බන්ධයෙන් වන විවිධ හැකියාවන්, දුර්වලතාවයන්, අවස්ථාවන් හා තර්ජන හඳුනාගනු ලැබ ඇත. ඉදිරි වර්ෂයන් සඳහා යහපත් ප්‍රතිඵල ලබාදීම සඳහා ඉදිරියට ගමන් කරීම සඳහා අපි මැනවින් සංවිධානය වී සිටිමු.

### කාර්යසාධනය පිළිබඳ සමාලෝචනය

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් කාර්යාංශය රාජ්‍ය ආයතනයක් ලෙස මහජනතාව වෙත ගුණාත්මක සේවාවක් ලබා දීම සඳහා උපරිම සැලකිල්ලක් දක්වා ඇත. මේ සම්බන්ධයෙන් මානව සම්පත් සංවර්ධනය සහ තාක්ෂණ භුවමාරුව ප්‍රමුඛතාවය ලබා දිය යුතු ක්ෂේත්‍රයක් ලෙස සලකා එම ඉලක්කයන් අත්පත් කර ගැනීමට අපි සමත් වූයෙමු. 2011 වර්ෂය තුළදී අප ලබාගත් ජයග්‍රහණ වාර්ෂික වාර්තාව තුළ පෙන්නුම් කරනු ලබන අතර මෙම ඉහළ ගුණාත්මක තත්ත්වය ලබා ගැනීම තුළින් ලද ප්‍රතිඵල සඳහා නිසි පිළිගැනීමක් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට හිමි විය යුතු බව අපගේ දැඩි විශ්වාසයයි.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් පෙන්නුම් කරන ලද මූල්‍යමය ප්‍රතිඵල මගින් සියලු අංශවලදී අප ලබාගත් ශක්තිමත් වර්ධනය විදහා දක්වනු ලැබේ.

පසුගිය වර්ෂයේදී ලද රු. මිලියන 667.7 ට සාපේක්ෂව රු. 861.8 ක පිරිවැටුමක් මෙම වර්ෂයේදී ලබාග ැනීමට කාර්යාංශය සමත් විය. අපගේ සේවකයන්, සේවාදායකයන් සහ අනිකුත් අදාළ පාර්ශ්ව සමග එක්ව සිය කාර්යසාධනය විශාල වශයෙන් ඉහළ නැංවීම මෙයට හේතුවයි.

සමාලෝචිත වර්ෂය තුළදී මහා භාණ්ඩාගාරය වෙත අතිරික්ත මුදලක් දායක කිරීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සමත් වූ බව සඳහන් කිරීමට ලැබීම මා හට සන්තෝෂයක් වන අතර කාර්යාංශය සතු මූල්‍යමය ශක්තිය එමගින් පෙන්නුම් කරන බව කිව යුතුය.

### ඇගයීම

අවුරුදු 108 ක කාලයක් තිස්සේ කාර්යාංශයේ ප්‍රගමනය සඳහා අප හට අඛණ්ඩව සහාය දක්වන ලද අපගේ වටිනා සේවාදායකයන් වෙත ස්තුතිය සහ ප්‍රණාමය පුද කිරීමට ලැබීම මගේ සතුටකි.

පසුගිය වර්ෂයන්හිදී අපගේ කාර්යාංශය ඉතාම සාර්ථක සහ තාක්ෂණය අතින් ප්‍රමුඛත්වය ගන්නා වූ ආයතනයක් බවට පත් කිරීම සඳහා දක්වන ලද දායකත්වය සහ කැපවීම වෙනුවෙන් කාර්යාංශයේ සියලුම සේවකයන් වෙත ස්තුතිය පුද කිරීමටද මම මෙය අවස්ථාවක් කර ගනිමි.

**ආචාර්ය එන්. පී. විජයානන්ද**

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය



2011 වර්ෂය ප්‍රධානතම කාර්ය සාධන දර්ශක ගණනාවක් තුළින්ම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් අත්කරගත් සාර්ථකත්ව ගණනාවක්ම පිරි වසරක් බව මම විශ්වාස කරමි. ජනතාව කේන්ද්‍ර කරගත් රාජ්‍ය සේවයක් ලබාදීම, රාජ්‍ය භාණ්ඩාගාරයට ඉතාම සුවිශාල ආදායමක් ලබා දීම, කැනීම් කටයුතුවලදී සිදුවන පාරිසරික බලපෑම් පිළිබඳ සමීප අධීක්ෂන කටයුතු නිරන්තරවම සිදු කිරීම සඳහා ඒවා විමධ්‍යගත කිරීම, අදාල පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම, නව බලපත්‍ර නිකුත් කිරීම පුළුල් ලෙස ඉහළ නැංවීම සහ දිවයිනෙහි භූ විද්‍යා සිතියම් සම්පූර්ණ කිරීම (1 : 100,000) එම කාර්යයන් අතර වේ.

ඉහත සියළු කටයුතු සිදු කරන ලද්දේ මහින්ද චින්තනය ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්ය බවට පත් කරලීමේ වැඩපිළිවෙල හා අනුගතවය.

යුද්ධය අවසන් කිරීමත් සමග සාර්ව ආර්ථික පරිසරය තුළ පැවති ස්ථාවර තත්ත්වය මත පදනම්ව 2011 වර්ෂය තුළදී අප ලබාගත් කාර්ය සාධනය ගැන විමසා බැලිය යුතුය. පශ්චාත් යුධ සමය තුළදී ශ්‍රී ලංකාවේ ආර්ථිකය ගමන් ගත් දිශානතිය සහ පවත්වාගත් ආර්ථික වේගය තුළින් 8.3% ක ආර්ථික වර්ධනයක් අත්පත් කරගන්නා ලදී. ඉදිකිරීමේ කර්මාන්තය තුළ ඇති වූ සමෘද්ධිය සහ විශාල වශයෙන් ක්‍රියාත්මක කරන ලද යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව තුළින් ලබාග නු ලබන සේවය සඳහා ඉහළ ඉල්ලුමක් ඇති වූ අතර එය සපුරාලීමේදී එල්ල වූ තථ්‍ය අභියෝගයට සමහර අවස්ථාවලදී පරිපාලනමය වශයෙන් ඇති අනවශ්‍ය නීතිරීති ඉවත් කිරීමේ සුවිශාල වෙනස්කම් පවා ඇති කරමින් සාර්ථක ලෙස මුහුණ දීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට හැකි වූ බව මගේ විශ්වාසයයි.

මහා භාණ්ඩාගාරයට උපයා දෙන ලද ආදායම මත පදනම්ව 2011 වර්ෂය තුළදී අප කාර්යාංශය ඒ ශ්‍රේණියේ නියාමන ආයතනයක තත්ත්වයට උසස් කරන ලද බව මා සඳහන් කරනුයේ ඉමහත් ආඩම්බරයෙනි.

එලෙස 2011 වර්ෂයේදී රාජ්‍ය අංශය තුළ පවත්වනු ලද ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා සම්මාන උළෙලේදි කුසලතා සම්මානයන් දිනාගැනීමටද අපට හැකියාව ලැබුණි.

2011 වර්ෂය තුළදී සිදු කරන ලද මුළු ඉපැයීම් ප්‍රමාණය රු. මිලියන 961.8 ක් වූ අතර ඉන් වියදම් සහ බදු වලට පසු ආදායම රු. මිලියන 618.4 ක් විය. රාජ්‍ය භාණ්ඩාගාරයට රු. බිලියන එකක් ලබා දීමට කාර්යාංශයට හැකි වීම සතුටට කරුණකි. අපගේ කාර්යාංශයේ සේවය කරනා සියලුම අංශවල සේවක මහත්ම මහත්මීන්ගේ අති උදාර කැපවීම නොවන්නට මෙය සිදු කළ නොහැකි වනු ඇත.

ජනතාව ඉලක්ක කරගත් මහජන සේවයක් ලබා දීම සඳහා අපගේ කාර්ය මණ්ඩලය තවදුරටත් ශක්තිමත් කිරීමට අපි ක්‍රියා කළෙමු. කැනීම් අංශය අප ආයතනයේ ඉතාම වැදගත් අංශය වන අතර ප්‍රධාන කාර්යාලයට සහ ප්‍රාදේශීය කාර්යාල 13 ට අනුයුක්තව 150කට වැඩි සේවක සංඛ්‍යාවක් එහි සේවය කරති. ඉහළ ඉල්ලුමක් ඇති ප්‍රදේශ කරා තව තවත් ව්‍යාප්ත වීමේ පියවරක් ලෙස කන්තලේ සහ හසලක යන ප්‍රදේශවල උප කාර්යාල දෙකක් ආරම්භ කරන ලද අතර විවිධ ප්‍රදේශවල ජීවත්වන ගනුදෙනුකරුවන්ට පහසුවෙන් සේවය ලබාගැනීමට හැකියාව ලබා දීම කාර්යාංශයට අවශ්‍ය වී ඇත.

සියලුම පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම සඳහා ව්‍යුහාත්මක ප්‍රවේශයන් අප විසින් ලබා ගෙන ඇති අතර 2011 වර්ෂය තුළදී දැනුවත් කිරීමේ වැඩසටහන්ද අප විසින් ආරම්භ කරන ලදී. මෙම කාලපරිච්ඡේදය තුළදී වැඩමුළු, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ අධ්‍යාපනික වැඩසටහන් කාර්යාංශය විසින් පවත්වන ලදී. ඉහත වැඩසටහන් වල මූලික අරමුණු වූයේ ප්‍රධාන ගැටළු නිරාකරණය කිරීම, කැනීම් කර්මාන්තය ආශ්‍රිත ගැටලු සඳහා විසඳුම් ලබාදීම, රාජ්‍ය ආයතන දැනුවත් කිරීම සහ 1992 අංක 33 දරන පතල් හා ඛණිජ පනතෙහි අන්තර්ගත නීතිරීති හා රෙගුලාසි පිළිබඳව බලපත්‍ර හිමියන් දැනුවත් කිරීමයි. ප්‍රධාන වශයෙන්ම වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා උමා ඔය ව්‍යාපෘතිය සම්බන්ධයෙන්ද පොලිස් දෙපාර්තමේන්තුව සඳහා කැනීම් කටයුතුවලට අදාළ නීතිමය පැතිකඩ පිළිබඳවද වැඩමුළු 11 ක් අප විසින් සාර්ථකව පවත්වන ලදී. ප්‍රවාහන බලපත් හා සම්බන්ධ ප්‍රායෝගික ගැටළු සහ

වෙනත් ඒ ආශ්‍රිත ගැටලු පිළිබඳව විවෘත දෙදිශා අදහස් හුවමාරුවක් ඇති කිරීමට අපි කටයුතු සූදානම් කළෙමු. මෙම අවබෝධය තුළින් කාලෝචිත තීරණ ගැනීමට අපට ඉඩ ප්‍රස්ථාව සලසා දෙනු ලැබේ. මේ අවස්ථාවේදී වැලි කැනීම සිදු කරන පුද්ගලයින් සහ අදාළ රාජ්‍ය සහ පුද්ගලික ආයතන ඉලක්ක කරගනිමින් මහ ඔය ඔය, කැලණි ගඟ සහ කළු ගඟ වැනි හායනයට පත් වූ ගං ඉවුරු පිළිබඳව සහ ගං ඉවුරු ප්‍රතිසංස්කරණය හා සම්බන්ධව වෙනස් වන දෘෂ්ටිකෝණයන් පිළිබඳව සාර්ථක වැඩසටහන් අප විසින් පවත්වා ඇති බව මා විසින් සඳහන් කිරීම අවශ්‍ය වේ.

තවද, 2011 වර්ෂය තුළදී ගල්කුළු පිපිරවීම පිළිබඳ පළමු සහතිකපත්‍ර පාඨමාලාව සාර්ථකව ආරම්භ කරන ලද අතර ගල් කුළු පිපිරවීමේ කටයුතු වල ප්‍රමිතිය ඉහළ නැංවීම පිළිබඳව දීර්ඝ කාලයක් තිස්සේ පැවති අවශ්‍යතාවයන් මෙමගින් සපුරා දෙන ලදී. අප විසින් ඉමහත් උද්යෝගයෙන් යුතුව අනාගතයේදීද දිගටම පවත්වාගැනීමට බලාපොරොත්තු වන ප්‍රධානතම වැඩසටහනකි මෙය.

2011 වර්ෂයේදී කැනීම් බලපත්‍ර සඳහා කාර්යාංශය වෙත ලැබුණු ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව ගැන සලකා බැලීමේදී එම වසර තුළ නව ඉල්ලුම්පත්‍ර 8722 ලැබුණු බව සඳහන් කළ යුතු අතර මෙය පසුගිය වසරට සාපේක්ෂව 19.2% ක වර්ධනයකි. කැනීම් අංශය විසින් පිපිරීම් පරීක්ෂණ 130 සිදුකරන ලද අතර පරීක්ෂා කිරීම් 7722 ක් සිදු කරන ලදී.

භූ. ස. ප. කා. හි කළමනාකාරිත්වය විසින් තිරසාර සංවර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කොට ඇති අතර කැනීම් කටයුතුවලට අදාළව වර්තමානයේදී ඇති විය හැකි පාරිසරික බලපෑම් පිළිබඳව නිරන්තරවම අධීක්ෂණය කිරීමේ අවශ්‍යතාවය සපුරාලීම සඳහා කාර්යාංශයේ කළමනාකාරිත්වය විසින් 2011 වර්ෂය තුළදී ක්ෂේත්‍ර සහායක නිලධාරීන් බඳවා ගන්නා ලදී.

2011 වර්ෂයේදි සමස්ත දිවයිනම ආවරණය කරමින් භූ විද්‍යා සිතියම් නිසි ලෙස සම්පූර්ණ කිරීමට කාර්යාංශයේ භූ විද්‍යා අංශයට හැකි වූ බව සඳහන් කිරීමට ලැබීම මා හට ප්‍රීතියකි. භූ විද්‍යා සිතියම් සැකසීම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ප්‍රධානතම කාර්යයන්ගෙන් එකකි. 1 : 100,000 පරිමාණයේ පාදස්ථ සිතියම් කාර්යාංශය විසින් බොහෝ දුරට සම්පූර්ණ කර ඇත. 1: 100,000 පරිමාණයේ පාදස්ථ සිතියම් අතුරින් සම්පූර්ණ කිරීමට ඉතිරිව තිබූ එකම භූ විද්‍යා සිතියම අංක 12 (අරලංගන්විල - පදිරිප්පු) දරන සිතියමයි. 2011 වර්ෂය තුළදී සිතියම් අංක 12 හි සලකුණු මුද්‍රණය කිරීම් සිදු කොට සංස්කරණ මණ්ඩලයේ උපදෙස් මත සංස්කරණ කටයුතු සිදු කරන ලදී. 1 : 100,000 පරිමාණයේ භූ විද්‍යා සිතියම් මත පදනම්ව සමස්ත දිවයිනෙහිම ( 1 : 50,000) භූ විද්‍යා සිතියමක් සම්පාදනය කොට සංඛ්‍යාංකය කොට සංස්කරණය කරන ලදී. මෙම සිතියම් දෙක මේ වන විට මුද්‍රණය කිරීම සඳහා යෝග්‍ය මට්ටමක පවතී. කළුතර (සිතියම් අංක 73) සහ බලපිටිය - අම්බලන්ගොඩ (සිතියම් අංක 85/86) 1 : 50,000 පරිමාණයේ චතුර්ථමය සිතියම් සම්පූර්ණ කර ඇති අතර හලාවත (සිතියම් අංක 46) සිතියම්ගත කිරීමේ කටයුතු ද ආරම්භ කරන ලදී. පස් ආශ්‍රිත භූ රසායනික සිතියම්කරණ වැඩසටහන යටතේ තිබොල්කැටිය (82) සහ පදවිය (17) යන 1 : 50,000 පරිමාණයේ සිතියම් ප්‍රදේශ ආවරණය කරමින් පස් නිදර්ශක 1500 ක් එකතු කරගන්නා දී. විශ්ලේෂන ක්‍රියාවලිය වේගවත් කිරීම සහ වැඩි දියුණු කිරීම උදෙසා ප්‍රේරිත යුග්ම ප්ලාස්මා ප්‍රකාශන විමෝචන වර්ණාවලිමානයක් එක් කිරීම මගින් විද්‍යාගාර නවීකරණය කරන ලදී. වසරේ අග භාගය වන විට අළුතින් සවි කරන ලද මෙම උපකරණ යොදා ගෙන නිදර්ශක විශ්ලේෂණය කිරීම ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකාව තුළ සහ අවට භූකම්පන ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම තුළ සුවිශේෂ දියුණුවක් ඇති විය. (පල්ලෙකැලේ, හක්මන සහ මහකන්දරාව) යන භූකම්පන නිරීක්ෂන මධ්‍යස්ථාන වලින් ලැබෙන්නා වූ භූ කම්පන දත්ත භූකම්පන මෘදුකාංග යොදා ගෙන අර්ථ නිරූපනය කිරීම සඳහා නිලධාරීන් පුහුණු කරන ලදී. මේ හේතුවෙන් රට තුළ ඇති වූ භූ චලන කිහිපයක් පිළිබඳව ඒවා ඇති වූ ස්ථානය සහ ඒවායේ විශාලත්වය නිශ්චය කිරීමට කාර්යාංශයට හැකියාව ලැබුණි. පෞද්ගලික සහ රාජ්‍ය අංශවල ඉල්ලීම මත ඛනිජ ගවේෂන සහ සිදුරු විදීමේ ව්‍යාපෘති කිහිපයක්ද සිදු කිරීමට කාර්යාංශය කටයුතු කළ අතර මින් උපයා ගන්නා ලද ආදායම රු. මිලියන 41 ක් විය.

අතිගරු ජනාධිපතිතුමාගේ දූරදර්ශී නායකත්වය හේතු කොටගෙන ලබාගන්නා ලද සීඝ්‍ර ආර්ථික වර්ධනය හේතු කොටගෙන රටෙහි ආර්ථික පරිසරය වේගයෙන් වෙනස්වෙමින් පැවතීම කරණ කොට ගෙන අප හට ඉදිරි කාලයේදී දියුණු වෙනසක් ඇති කරගැනීමට නව අභියෝග ජයගැනීමට ඉඩ ප්‍රස්ථාව ලැබෙනු ඇත. 2011 වර්ෂය සදා අමතක නොවන සාර්ථක වසරක් වූ අතර ශ්‍රී ලංකාව 'ආසියාව තුළ මතුවෙමින් පවතින ආශ්චර්යය' බවට පත් කිරීමේ සිහිනය යථාර්ථයක් කරමින් අනාගතයේදීද අඛණ්ඩව රටේ ආර්ථික වර්ධනයට දායක වීමට අපි අපේක්ෂා කරමු.

**බී. ඒ. පීරිස්**

## කළමනාකාරිත්ව මණ්ඩලය

සභාපති : ආචාර්ය එන්. පී. විජයානන්ද මහතා

සාමාජිකයින්: බී. ඒ. පීරිස් මහතා

ටී. ද එස් ඒ. විජේනායක මහත්මිය

ආර්. එස්. එස්. අධිකාරි මහතා

එම්. ඒ. තජුඩීන් මහතා

කේ.එච්. ඩබ්. කේ. නාරද සුමනරත්න මහතා

එන්. කේ. පී. කේ. නැම්මවත්ත මහතා

කළමනාකාරිත්ව මණ්ඩලයේ ලේකම් / නීති නිලධාරී

එම්. එස්. කේ. ප්‍රනාන්දු මහත්මිය




## කාර්ය මණ්ඩල සාමාජිකයෝ - භූ විද්‍යා අංශය



ආචාර්ය ඩබ්. කේ. බී. එස්. ප්‍රේම්

**සහකාර අධ්‍යක්ෂ (භූ විද්‍යා)**
කේ. ටී. යු. එස්. ද සිල්වා මහතා

**භූ විද්‍යාඥයින්**
ඩී. එච්. ඊ.ආර් සිරිවර්ධන මහතා
ඩී. පී. ආර්. වීරකෝන් මහත්මිය
එම්. එම්. ජේ. පී. අජිත්ප්‍රේම මහතා
ඒ. එස්. ජයකොඩි මහතා
ඒ. එම්. එම්. රත්නායක මහතා
පී. එන්. රණසිංහ මහතා
ආචාර්ය. ඩබ්. අයි. එස්. ප්‍රනාන්දු මහතා
ඩී. එම්. එස්. දිසානායක මහතා
එන්. ටී. කළුබණ්ඩාර මහතා
ඩී. ටී. ඩී. එස්. විජේසුන්දර මෙනවිය
පී. එන්. බී. විජේරත්න මෙනවිය
ඒ. එම්. සී. යු. අබේසිංහ මහතා
ඒ. ඒ. පී. ප්‍රියන්ත මහතා
එච්. ඒ. ඩී. එන්. සංජීව මහතා
එම්. එම් ටී. එන්. බී. මුණසිංහ මහතා
ඩී. එස්. එම්. සී. ප්‍රනාන්දු මෙනවිය
එන්. ඉලංගකෝන් මෙනවිය

**භූ භෞත විද්‍යාඥයින් :**
එස්. එස් ද සිල්වා මහතා
එස්. එන්. බී. තල්දෙන මෙනවිය
එස්. ඩබ්ලිව්. එම්. සෙනෙවිරත්න මහතා

**ප්‍රධාන වෙළඳ**
වයි. පී. එස්. සිරිවර්ධන මහත්මිය

**රසඥයින්**
වී. ආර්. වනසිංහ මහත්මිය
එම්. ඒ. පී. ජයලත් මහත්මිය
ආර්. කේ. එම්. සුරංගනී මහත්මිය

**පුස්තකාලයාධිපති**
පී. එන්. අමරසූරිය මෙනවිය

**ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරී**
කේ. එස්. ජේ. ප්‍රනාන්දු මහතා

**තාක්ෂණික නිලධාරීන්**
බී. ඩී. සිරිසේන මහතා
එම්. ඒ. ආර්. මංචනායක මහතා
එම්. ඩී. පත්මසිරි මහතා
එම්. බී. එම්. සිල්වා මහතා

පී. ඩී. ගුණමුනි මහතා
ඒ. ජේ. එම්. ඩී. කුමාර මහතා
ටී. දේශප්‍රිය මහතා
එම්. එස්. ප්‍රියශාන්ත මහතා
පී. වී. ඩී. එල්. බී. පලියදෙනිය මහතා
ටී. එම්. ඒ. ක්‍රිස්ටි මහතා

**තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලය**

ඩී. එම්. කේ. දසනායක මහතා
කේ. ඒ. ආර්. පී. වික්‍රමසිංහ මහතා
පී. ජී. බී. පී. තිලකරත්න මහතා

**පර්යේෂණ සහායකයෝ**

එම්. බී. යූ. එච්. ද සිල්වා මහතා
ඩබ්ලිව්. එච්. ඩී. පී. රුක්මාල් මහතා

**සැලසුම් ශිල්පීන්**

එන්. එස්. කේ. කරුණාධිපති මහත්මිය
පී. ප්‍රියංග මහතා

**සිතියම් ශිල්පී**

ජී. ඩී. ටී. ඩී. නන්දදාස මහත්මිය

## කාර්ය මණ්ඩල සාමාජිකයෝ - කැනීම් අංශය



ඉංජිනේරු ඩී. සජ්ජන ද සිල්වා
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කැනීම්)

**ප්‍රධාන කැනීම් ඉංජිනේරු**

ඉංජිනේරු එල්. ඒ. ප්‍රනාන්දු

**කැනීම් ඉංජිනේරුවෝ**

ඉංජිනේරු ධම්මික ප්‍රසාද්
ඉංජිනේරු ඩබ්. පී. එස්. කෝකිල
ඉංජිනේරු අසංක රූපවංශ
ඉංජිනේරු අයි.එම්. ටී එන් ඉලංගකෝන්
ඉංජිනේරු යූ. එම්. ටී. ප්‍රියන්ත
ඉංජිනේරු කේ. වී. ජයලත්
ඉංජිනේරු එන්. ඩබ්ලිව්. සී. පී. ලංකා
ඉංජිනේරු ටී. එම්. වයි. බණ්ඩාර
ඉංජිනේරු කේ. ඒ. එස්. ධර්මසිරි
ඉංජිනේරු ඒ. පී. විමලසේන
ඉංජිනේරු ඩී. මයුරන්
ඉංජිනේරු එම්. කේ. එම්. ගුණසේකර
ඉංජිනේරු සී. කේ. කරුණානන්ද
ඉංජිනේරු තනුජා දයාරත්න
ඉංජිනේරු ටී. එස්. කුමාර
ඉංජිනේරු එච්. ඒ. සී. කේ. ඩබ්ලිව්. බණ්ඩාර
ඉංජිනේරු එම්. ආර්. එම්. ෆාරිස්
ඉංජිනේරු කේ. ලගගවුරි
ඉංජිනේරු ඩබ්. විමලරත්න
ඉංජිනේරු එච්. පී. සිරිවර්ධන
ඉංජිනේරු සයිප් රොඩ්‍රිගෝ
ඉංජිනේරු යූ. එන්. නිලන්ති
ඉංජිනේරු ඩබ්ලිව්. ඒ. ඒ. පී. වන්නිආරච්චි
ඉංජිනේරු පී. ජෙයපුරන්
ඉංජිනේරු හසිත අධිකාරි

**ලේඛකාධිකාරි** (Mineral Titling)

කේ. ඒ පී හේමලතා මහත්මිය

**සහකාර ලේඛකාධිකාරීවරු**

ටී. දහනායක මහතා
ඩී. වී. ආර්. එස්. මධුවන්ත මෙනවිය
ඒ. එම්. සමරසේකර මහතා
බී. ගනේගම මෙනවිය
පී. ආර්. සී. සිල්වා මහතා
ඩබ්ලිව්. එම්. පී. එස්. වීරසුන්දර මෙනවිය
ඊ. එම්. පී. එන්. එස්. ඒකනායක මෙනවිය
එම්. ටී. වී. වනිගසිංහ මෙනවිය
එච්. එම්. ඒ. පී. කරුණාරත්න මෙනවිය
නීල් විතානගේ මයා
එස්. හර්ෂනී මෙනවිය
ගයාත්‍රී පෙරේරා මෙනවිය

## කාර්ය මණ්ඩල සාමාජිකයෝ - මුදල් හා පරිපාලන අංශය



එම්. ඩබ්ලිව්. ජයමාන්න මහතා
සාමාන්‍යාධිකාරී

**මූල්‍ය කළමනාකරු**

ආර්. පී. ඩී. පතතම්පෙරුම මෙනවිය

**පරිපාලන නිලධාරී**

ජී. එම්. ඩබ්ලිව්. පෙරේරා මහතා

## අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය

**අභ්‍යන්තර විගණක**

ටී. එල්. චන්ද්‍රසේන මහතා

## කාර්යාංශය ගැන

**භූ. ස. ප. කා. ශ්‍රී ලංකාවේ කණිජ කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන් අපි වෙමු.**

පාෂාණ විද්‍යාවන්, විශේෂ වශයෙන්ම භූ විද්‍යාව සහ ඛනිජ සම්පත් සම්බන්ධයෙන් කටයුතු කරනා ආයතනයක් වන මෙය රටකට ඉතාම අත්‍යවශ්‍ය සහ ඉතාම වැදගත් වන ආයතනයකි. රටෙහි භූ විද්‍යාව, ව්‍යුහය සහ වඩාත් වැදගත් වශයෙන් රටෙහි ඛනිජ සම්පත් සම්බන්ධයෙන් සුවිශාල දැනුම් සම්භාරයක් එවැනි ආයතනයක් සතුව ඇත. ඛනිජ සම්පත නිසි ලෙසස හ අර්ථවත් ලෙස භාවිතා කිරීම රටක ආර්ථික සුභසිද්ධිය සහ සෘජුවම සම්බන්ධ වන කරුණකි. එවැනි ආයතන ජාතික භූ විද්‍යාත්මක සමීක්ෂණ ආයතන ලෙස සැලකෙන අතර ජාතික අවශ්‍යතා මත සකස් කරන ලද සහ පදනම් වූ අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ වගකීම ඒවා වෙත පැවරී ඇත. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් ආයතනය මෙම ප්‍රතිපත්ති ක්‍රියාතමික කිරීම සිදු කළ යුතු වේ.

ශ්‍රී ලංකාවේ ඛණිජ සංවර්ධනය සඳහා බලය ලත් ආයතනය වන භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් කාර්යාංශය මේ දක්වාම ඛනිජ ගවේෂන සිදු කොට රටට ප්‍රතිලාභ අත් කර දී ඇති ආයතනයකි.

අද පවතින සියළුම ඛනිජ ආශ්‍රිත කර්මාන්ත එනම් සිමෙන්ති, පිඟන්, ඛනිජ වැලි, පොහොර, ගඩොල් හා උළු සහ මෝස්තර ගල් යනාදී කර්මාන්ත පවතින්නේ ඉතිහාසය පුරාවට මෙම ආයතනය විසින් සිදු කරන ලද කාර්යභාරය හේතුවෙනි.

ශ්‍රී ලංකාව කුඩා රටක් වන හෙයින් එහි උප පෘෂ්ඨ ඛනිජ සම්පත ද ඒ හා සමානවම කුඩා වේ. එහෙයින් මෙම ආයතනය විසින් ඛනිජ ආශ්‍රිත කර්මාන්ත ආරම්භ කිරීම දිරිගන්වන අතරතුරම ඛණිජ යනු පුනර්ජනනය නොවන වාණිජමය ද්‍රව්‍යයක් වන හෙයින් ඒවා අපතේ නොයවා අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කළ යුතු බව අවධාරණය කරනු ලැබේ.

ජාතියට භූ විද්‍යාත්මක ශක්‍යතාවයන් ප්‍රධානතම සැපයුම් කරුවා වන භූ. ස. ප. කා. භූමියෙහි ඇති සම්පත්, ඒ ආශ්‍රිත ප්‍රශ්න හා ගැටළු පිළිබඳව ඇති අවබෝධය ප්‍රවර්ධනය කරයි. විද්‍යාත්මක ප්‍රවීනතාවයෙහි විවිධත්වය මගින් බහු විෂයයික ගවේෂණ සිදු කිරීමට අපට හැකියාව ලබා දෙන අතර සම්පත් කමනාකරුවන්, සැලසුම්කරුවන් සහ වෙනත් සේවාදායකයන් සඳහා භූ විද්‍යාත්මක සිතියම් මාලාවක් ඇතුල සර්වසම විද්‍යාත්මක තොරතුරු ලබා දෙනු ලැබේ.

පෘථිවි තලය විස්තර කිරීමට සහ තේරුම් ගැනීමට, ස්වාභාවික ව්‍යසන මගින් ජීවිත වලට සහ දේපල වලට සිදුවන හානි අවම කර ගැනීම, භූ විද්‍යාත්මක ශක්තීන් සහ ඛනිජ සම්පත් කළමනාකරණය සහ ජීවිතයෙහි ගුණාත්මක බව ආරක්ෂා කිරීම සහ ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සේවය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් කාර්යාංශය මගින් ජාතියට ලබා දෙනු ලැබේ.

මූලික කාර්යයන් 4 ක් කාර්යාංශය මගින් සිදු කරනු ලැබේ. භූ විද්‍යා සිතියම් සැකසීම සහ ඛනිජ ගවේෂණය, කැනීම් හිමිකම් සහ කැනීම් රෙගුලාසි (මූලික කාර්යය) සේවාදායකයන් ඉලක්ක කරගත් කටයුතු (ඛනිජ සම්පත් ගවේෂන, විද්‍යාගාර සේවා, භූ භෞතික සහ විදුම් ගිවිසුම්) සහ භූ විද්‍යා තොරතුරු (පුස්තකාලය තුළ ඇති ප්‍රසිද්ධ කරන ලද සහ ප්‍රසිද්ධ නොකරන ලද වාර්තා, සිතියම් සහ වෙනත් සංරක්ෂිත ලේඛන පරිශීලනය කිරීම) ලබාදීම එම කාර්යයන් වේ.

අද භූ. ස. ප. කා. ප්‍රාදේශීය කාර්යාල 14 ක්ද සමග ඔක්ව ඛනිජ කර්මාන්තය තුළ නිරත සිය සේවාදායකයන් සඳහා ඉතා ඉහළ මට්ටමේ සේවාවන් ලබා දෙයි.




භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සිය සේවාව රට පුරාම පුළුල් කරයි.

## භූ. ස. ප. කා. හි කටයුතු වලට අදාළ තොරතුරු ලබා ගත හැකි ස්ථාන

| අපගේ කාර්යාල | ලිපිනය | කාර්යාල ප්‍රධානී | දුරකථනය / ෆැක්ස් |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | අංක 4, ගාලු පාර, දෙහිවල | අධ්‍යක්ෂ ජනරාල් | + 94-11-2739307-8 |
| අම්පාර | අංක 1734, ජයවර්ධනපුර, අම්පාර | ඉංජිනේරු එච්. ඒ. සී. කේ. ඩබ්ලිව්. බණ්ඩාර | + 94-11-2735752 |
| අනුරාධපුරය | අංක 596/69, බණ්ඩාරනායක මාවත, අනුරාධපුරය | ඉංජිනේරු කේ. ඒ. එස්. ධර්මසිරි | + 94-63-2223385 |
| බදුල්ල | අංක 6/3, බණ්ඩාරනායක මාවත, බදුල්ල | ඉංජිනේරු ටී. එම්. ඩබ්ලිව්. බණ්ඩාර | + 94-25-2223535 |
| මඩකලපුව | මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව | ඉංජිනේරු එම්. ආර්. එම්. ෆාරිස් | + 94-55-2222787 |
| හම්බන්තොට | ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිලි සංකීර්ණය, හම්බන්තොට | ඉංජිනේරු එල්. අසේල ප්‍රනාන්දු | + 94-55-2225210 |
| යාපනය | හේවාවිතාරණ ගොඩනැගිල්ල, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, මුන්ඩිකුලි, යාපනය | ඉංජිනේරු මයුරන් | + 94-65-3064576 |
| කළුතර | අංක 9 ඒ. මුස්ලිම් පල්ලිය පාර, වෙත්තුමකුඩ, කළුතර දකුණ | ඉංජිනේරු කේ. වී. ජගත් | + 94-47-2222477 |
| නුවර | ජනසවිගම, පල්ලෙකැලේ, නුවර | ඉංජිනේරු ධම්මික ප්‍රසාද් | + 94-21-2224595 |
| කුරුණෑගල | අංක 11, මොන්නෙකුලම පාර, වෑහර, කුරුණෑගල | ඉංජිනේරු එස්. ඒ. අයි. ජේ. රොද්‍රිගු | + 94-34-2223743 |
| මාතර | අංක 8, ෆ්ලවර් හවුස්, ඇලවේල්ල මාවත, මාතර | ඉංජිනේරු යූ. එම්.ටී. ප්‍රියන්ත | + 94-81-2421294 |
| මොණරාගල | අංක 196/6, වැල්ලවාය පාර, මොණරාගල | ඉංජිනේරු ඩබ්. පී. එස්. කෝකිල | + 94-37-2232542 |
| රත්නපුර | 168/9, නව නගරය, රත්නපුර | ඉංජිනේරු ටී. එස්. කුමාර | + 94-41-2220593 |
| ත්‍රිකුණාමලය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල කාර්යාලය, ත්‍රිකුණාමලය | ඉංජිනේරු ඩබ්. විමලරත්න | + 94-55-2277392 |
| කන්තලේ | 85 හංදිය, අග්බෝපුර, කන්තලේ | ඉංජිනේරු ඩබ්. විමලරත්න | + 94-45-2224371<br>+ 94-26-3202411 |

## ඓතිහාසික පසුබිම

ඔ1903 වර්ෂයේදී ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතාගේ ප්‍රමුඛත්වයෙන් ආරම්භ කරන ලද ලංකා ඛනිජ සමීක්ෂන ආයතනයෙන් (එම්. එස්. සී) පටන් ගෙන ශත වර්ෂයකට අධික කාලයක් තිස්සේ පැවති භූ විද්‍යා දෙපාර්තමේන්තු ගණනාවක අනුප්‍රාප්තිකයෙකු ලෙස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය හැඳින්විය හැකිය.

රටෙහි ඇති ඛනිජ සම්පත් පිළිබඳ තොරතුරු ලබාග ැනීම, ඒවා අනාවරණය කරගැනීම සහ ප්‍රවර්ධනය කිරීම යන කාර්යයන්හිදී මෙම දෙපාර්තමේන්තු විසින් ඉතිහාසය පුරාම ඉතා සුවිශේෂී වූ වාර්තාවක් තබා ඇති අතර දැනට ක්‍රියාත්මක වන ඛනිජ ආශ්‍රිත කර්මාන්ත සියල්ලක්ම ඒ වෙනුවෙන් ණය ගැති වේ.

1939 වන විට ඛනිජ සමීක්ෂන ආයතනය ඛනිජ විද්‍යා දෙපාර්තමේන්තුව ලෙස හඳුන්වනු ලැබූ අතර 1969 වර්ෂයේදී එය භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව ලෙස නැවත නම් කරනු ලැබිණි. නව කැනීම් දෙපාර්තමේන්තුවට පවරන ලද අදාළ නව වගකීම් සමග භූ විද්‍යා සමීක්ෂණ කටයුතු සම්බන්ධ කොට 1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත තුළින් 1993 මාර්තු මස 18 වැනි දින මෙම කාර්යාංශය පිහිටුවන ලදී.

ඛනිජ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රමුඛතම ආයතනය ලෙස මෙම කාර්යාංශය පිහිටුවීම මගින් ඛනිජ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා රජය සතු කැපවීම තහවුරු කෙරේ. මිල අධික ආනයන භාණ්ඩ ගොඩනැගිලි සහ ඉදිකිරීම් කර්මාන්තය සඳහා අවශ්‍ය භාණ්ඩ සඳහා සුදුසු ආදේශක ලබා දෙමින් ඛනිජ වර්ග මගින් රැකියා උත්පාදනය කිරීම සහ රටට ආදායමක් උත්පාදනය කිරීම සිදු කරනු ලැබේ. ජාතික භූ විද්‍යා දත්ත පදනම පවත්වා ගෙන යාම සහ එම තොරතුරු මහජනතාව වෙත ලබාදීම පිළිබඳ වගකීම දරන්නේද මෙම කාර්යාංශයයි.

ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතා



## ආංශයික කාර්යසාධනය

### පොදු

භූ විද්‍යා සමීක්ෂක හා පතල් කාර්යාංශයේ ප්‍රධානතම කාර්යයන් තාක්ෂණික සහ නියාමන ස්වරූපයක් ගනී. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් ඉටු කරනා මෙම කාර්යයන් සිදු කරනු ලබන්නේ භූ විද්‍යා සමීක්ෂන අංශය සහ පතල් අංශය යන අංශ දෙකින් වන අතර එක් එක් අංශය නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු යටතේ ක්‍රියාත්මක වේ. භූ විද්‍යා සිතියම් සැකසීම, ඛනිජ ගවේෂණය සහ භූ විද්‍යා පරික්ෂන කටයුතු භූ විද්‍යා සමීක්ෂන අංශය විසින් ඉටු කරනා අතර 1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත ප්‍රකාරව නියාමන කටයුතු භාරව කටයුතු කරන්නේ පතල් අංශය විසිනි.

රටෙහි විවිධ ප්‍රදේශ වල භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට අයත් රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාල 14ක් ඇති අතර විශේෂයෙන් තමාට අදාල ප්‍රදේශවල පතල් කැනීම් කටයුතු නියාමනය කිරීම මේවා මගින් සිදු කරනු ලැබේ. යම් යම් අංශවල ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම හේතු කොටගෙන දැනට සිටිනා කාර්ය මණ්ඩල සාමාජිකයින් ඉටු කළ යුතු කාර්යවල ප්‍රමුඛතාව අනුව සේවයේ යෙදවීමට සිදු වේ.

### භූ විද්‍යා සමීක්ෂණ අංශය

ඵලදායිතාවය, නිතිපතා ඉටු කළ යුතු කටයුතු සහ මූල්‍ය ආදායම යන කරුණු සම්බන්ධයෙන් සලකා බලන විට 2011 වර්ෂය භූ විද්‍යා අංශයට සාර්ථක වසරක් විය. සේවාදායකයන් ඉලක්ක කරගෙන ක්‍රියාත්මක කරන ලද විවිධ ව්‍යාපෘති තුළින් උපයන ලද ආදායම රු. 41,000,000/- ඉක්මවිය. ජාතික වශයෙන් වැදගත් වන හෝ ඉහළ ආදායම් උපයා ගත හැකි වෙනත් ව්‍යාපෘතිවලට ප්‍රමුඛතාවය ලබා දීමට සිදු වූ හෙයින් යම් යම් කටයුතු ප්‍රමාද කිරීමට හෝ කල් දැමීමට කාර්යාංශයට සිදු විය.

සැලසුම් කරන ලද කටයුතු සම්පූර්ණ කළ නොහැකි වීමට තවත් හේතුවක් වූයේ (උදා : භූ භෞත රසායනික සිතියම් පිළියෙල කිරීම) දැනට තිබෙන විශ්ලේෂක උපකරණවල මන්දගාමී ක්‍රියාකාරීත්වයයි. උදා : ලෙස පරමාණුක අවශෝෂ වර්ණාවලිමානය යොදා ගෙන පස් සාම්පල් විශ්ලේෂණය කිරීම සඳහා අපේක්ෂිත කාලයට වඩා වැඩි කාලයක් වැය වේ. මෙම ගැටළුවට විසඳුමක් වශයෙන් සහ වඩාත් ඉහළ මට්ටමක විශ්ලේෂන ප්‍රතිඵල ලබාගැනීම අපේක්ෂා කරමින් ප්‍රේරිත යුග්ම ප්ලාස්මා ප්‍රකාශන විමෝචන වර්ණාවලිමානයක් රු. 16,5000,000 ක මුදලක් වැය කොට සවි කරන ලදී.

### භූ. ස. ප. කා. හි අරමුදල් යොදා ගෙන ආරම්භ කරන ලද ව්‍යාපෘති

#### ප්‍රාග්කේම්බ්‍රිය සිතියම් නිර්මාණය

#### 1:100,000 පරිමාණයේ භූ විද්‍යා සිතියම (පාදස්ථ සිතියම) පිළියෙල කිරීම

භූ විද්‍යා සිතියම් සැකැස්ම මෙම කාර්යාංශයේ ප්‍රධානතම කාර්යයන්ගෙන් එකක් වන අතර සිතියම් නිර්මාණ කටයුතු අවුරුද්ද පුරාම අඛණ්ඩව සිදු කරන ලදී. භූමි ප්‍රදේශවල භූ තොරතුරු අන්තර්ගත වන භූ විද්‍යා සිතියම් ඛනිජ සහ භූගත ජලය ගවේෂණය, ප්‍රධාන පෙලේ ඉදිකිරීම් සහ සිවිල් ඉංජිනේරු කටයුතු සහ නායයාම් උවදුරු සිතියම් පිළියෙල කිරීම ඇතුළු කාර්ය ගණනාවක් සඳහා යොදා ගනු ලැබේ.

සිතියම් අංක 12 (අරලගංවිල- පදිරුප්පු) 1 : 100,000 භූ විද්‍යා සිතියම් වැඩසටහන යටතේ සම්පූර්ණ කිරීමට ඉතිරිව තිබූ එකම සිතියම විය. ක්ෂේත්‍ර කටයුතු, භූ විද්‍යා රේඛා කටයුතු සැකැස්ම සහ පාදස්ථ සිතියම සංඛ්‍යාංකනය කිරීම 2010 වර්ෂයේදී සම්පූර්ණ කරන ලදී. සංඛ්‍යාංකිත සිතියම නිර්මාණය සහ මුද්‍රණය කිරීම 2011 වර්ෂයේ මුල් භාගයේදී සම්පූර්ණ කිරීමට නියමිත වේ. මෙම වැඩසටහනට සම්බන්ධ වූ නිලධාරීන් වූයේ අජිත් ප්‍රේමා මහතා (භූ විද්‍යාඥ), ඩී. ටී. ඩී. එස්. විජේසුන්දර මෙනවිය (භූ විද්‍යාඥ) සහ ටී. නන්දදාස (සිතියම් නිර්මාණ ශිල්පී) මහත්මියයි. සිතියම් අංක 12 හි සංඛ්‍යාංකික නිර්මාණය 2011 වර්ෂයේදී සම්පූර්ණ කරනු ලබමින් පැවති අතර සංස්කරණ මණ්ඩලය විසින් සිදු කරන ලද යෝජනා මත පදනම්ව ප්‍රතිශෝධනය කිරීම සිදු කරන ලදී.



## 1 : 500,000 පරිමාණයේ ශ්‍රී ලංකා සිතියම පිළියෙල කිරීම

1 : 100,000 පරිමාණයේ භූ විද්‍යා සිතියම් සැකසීම (1 : 100,000 පරිමාණයට ප්‍රාග් කේම්බ්‍රියන් පාදස්ථ සිතියම් සැකසීම) අවසන් කිරීමට නියමිතව තිබූ හෙයින් ප්‍රසිද්ධ කරන ලද 1 : 100,000 සිතියම් මත පදනම්ව 1 : 500,000 පරිමාණයේ ශ්‍රී ලංකා භූ විද්‍යා සිතියමක් නිර්මාණය කිරීමට සැලසුම් කරන ලදී. 2011 වර්ෂයේදී මෙම වැඩසටහන ආරම්භ කොට 2011 වර්ෂය පුරා දිගටම සිදු කරගෙන යන ලදී. මෙම වැඩපිළිවෙල සඳහා අනුයුක්ත කරන ලද නිලධාරීන් වූයේ අජිත් ප්‍රේම මහතා (භූ විද්‍යාඥ) සහ එස්. කරුණාධිපති මහත්මිය (සැලසුම් ශිල්පිනි) යි. ආරම්භයේදී 1 : 250,000 පරිමාණයේ භූ විද්‍යා සිතියම් (අංශ 4 කින් සමන්විත) පිළියෙල කරන ලදී. මේ සඳහා 1 : 100,000 පරිමාණයේ භූ විද්‍යා සිතියම්වල පවතින දත්ත යොදා ගන්නා ලදී. සංස්කාරක සමිටුව මගින් ප්‍රතිශෝධන සිදු කිරීමෙන් අනතුරුව මෙම සිතියම් මුද්‍රණය කළ හැකි වනු ඇත.

## විස්තරාත්මක සිතියම් සහ නිබන්ධන පිළියෙල කිරීම

ප්‍රකාශයට පත් කරන ලද 1 : 10,000 පරිමාණයේ භූ විද්‍යා සිතියම් තුළ ආවරණය කරන ලද ප්‍රදේශය පිළිබඳ ඉතා කෙටි භූ විද්‍යා තොරතුරු ගොන්නක් අන්තර්ගත වන නමුත් එම ප්‍රදේශය පිළිබඳ ශිලා විද්‍යාත්මක, පාෂාණ සංයුති විද්‍යාව සහ ව්‍යුහාත්මක තොරතුරු එහි අන්තර්ගත නොවේ. එහෙයින් නියමු ව්‍යාපෘති මාලාවක පළමුවැන්න ලෙස කොළඹ - රත්නපුර සිතියම විස්තරාත්මක සිතියමක් ලෙස සකස් කිරීම 2010 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කරන ලදී. මෙම කාර්යයට සම්බන්ධ නිලධාරීන් වූයේ වයි. කේ. බී. එන් . ප්‍රාම් (නියෝජ්‍ය අධ්‍යක්ෂ / භූ විද්‍යා), ඒ. එම්. එම්. රත්නායක (භූ විද්‍යා) යන මහත්වරුන්ය. සිතියම් සම්පාදන කටයුතු 2011 වර්ෂයේදී නිම කරන ලද අතර විද්‍යාගාර කටයුතු සිදු කරමින් පවතී.

## චතුර්මය භූ විද්‍යා සිතියම් පිළියෙල කිරීම

භූ විද්‍යා ඉතිහාසයේ චතුර්මය කාල පරිච්ඡේදය මෑත කාලයේ සිට අවුරුදු මිලියන 2 කට පෙර අතීතය දක්වා දිව යයි. ශ්‍රී ලංකාවේ චතුර්මය භූමි නිර්මාණයන් ප්‍රධාන වශයෙන්ම වෙරළ බඩ අවසිදතයන්, ගංවතුර ඇති වන තැනිතලාවල දියළු අවසාදිතයන් සහ පස නිර්මාණය යන මේවාට සීමා වේ. කෙසේ වුවද මෙම භූමි නිර්මාණය තුළ ආර්ථිකමය ලෙස වැදගත් මැටි සහ වැලි නිධි, කොරල් නිධි, සශ්‍රික පස් ආවරණ සහ භූගත ජල ව්‍යුහයන් අන්තර්ගත වේ. ''චතුර්මය භූ විද්‍යාත්මක සිතියම්කරණය'' යන මැයෙන් වූ ව්‍යාපෘතියක් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් 2008 වර්ෂයේදී ආරම්භ කරන ලදී. කළුතර සහ බලපිටිය - අම්බලන්ගොඩ 1 : 50,000 පරිමාණයේ සිතියම් නිර්මාණ කටයුතු සම්පූර්ණ කරන ලදී. හම්බන්තොට - තංගල්ල සහ හලාවත 1 : 50,000 පරිමාණයේ සිතියම් වල ක්ෂේත්‍ර කටයුතු සහ හලාවත 1 : 50,000 පරිමාණය චතුර්මය සිතියමෙහි සම්පාදන කටයුතුවලට එම කාර්යය භාරව කටයුතු කළ නිලධාරියා (ආචාර්ය ස්ටරින් ප්‍රනාන්දු මහතා) හදිසි අනතුරකට ලක්වීම නිසා බාධා ඇති විය.

## පාංශු භූ රසායනික (පස පිළිබඳ භූ රසායනය) සිතියම් සැකසීම

පස්වල භූ රසායනික ලක්ෂණ අධ්‍යයනය කිරීමේ අරමුණ ඇතිව පාංශු භූ රසායනික සිතියම් වැඩසටහන 2008 වර්ෂයේදී ආරම්භ කරන ලදී. ඛනිජ ගවේෂනය, පරිසර තත්ව අධ්‍යයනය, කෘෂිකාර්මික පර්යේෂණ සහ භූ සෞඛ්‍ය උවදුරු අධ්‍යයනය කටයුතු සඳහා මෙම සිතියම ප්‍රයෝජනවත් වේ. භූ රසායනික සිතියම් වැඩසටහන ක්‍රියාත්මක කරන ලද්දේ 1 : 50,000 පරිමාණයේ පාදස්ථ සිතියම් මත පදනම්වය. සිතියම් අංක 88 : හම්බන්තොට සිතියම් අංක 69 : බදුල්ල සහ සිතියම් අංක 31, අනුරාධපුරය හි ක්ෂේත්‍ර කටයුතු සහ භූ රසායනික විශ්ලේෂණ කටයුතු දැනට තිබෙන පරමාණුක අවශෝෂක වර්ණාවලිමානය(*) යොදා ගෙන සම්පූර්ණ කොට තිබෙන අතර මූලය ද්‍රව්‍ය ව්‍යාප්තිය පිළිබඳ මූලික සිතියම් සම්පාදනය කර ඇත. කෙසේ වුවද පරමාණුක අවශෝෂක වර්ණාවලිමානය යොදා ගෙන විශ්ලේෂණය කළ හැකි රසායනික මූලද්‍රව්‍ය ගණන සීමිත හෙයින්, වැඩි මූලද්‍රව්‍ය ගණනාවක් විශ්ලේෂණය කළ හැකි වේගවත් විශ්ලේෂන උපකරණයන් යොදා ගෙන එම නිදර්ශක නැවත වතාවක් විශ්ලේෂණය කිරීමට සැලසුම් කරන ලදී. මෙම ව්‍යාපෘතියට සහාය වීම පිණිස ප්‍රේරිත යුග්ම ප්ලාස්මා ප්‍රකාශ විමෝචක වර්ණාවලිමානයක් සැකසීමට සැලසුම් කරන ලදී.

ඒ අනුව, 2012 පෙබරවාරි මාසයේදී රු. 16,000,000 ක මුදලක් වැය කොට එම උපකරණය සවි කරන ලදී. මෙම උපකරණය පරීක්ෂා කිරීමේ කටයුතු 2011 ජූනි මාසය දක්වාම සිදු කරන ලද අතර ඉහත කී සිතියම් ආවරණ ප්‍රදේශ වලින් එකතු කරගන්නා ලද නිදර්ශක අමතර මූලද්‍රව්‍ය තිබේදැයි පරීක්ෂා කිරීම සඳහා එම උපකරණය යොදාගෙන නැවත විශ්ලේෂණය කරන ලදී. පදවිය සහ තිබොල්කැටිය සිතියම් ආවරණ ප්‍රදේශය තුළ ක්ෂේත්‍ර කටයුතු (පස් නිදර්ශක එකතු කිරීම) 2011 වර්ෂය තුළදී නිම කරන ලදී.

පස ආශ්‍රිත භූ රසායනික සිතියම් වැඩසටහනට සම්බන්ධ වූ කාර්ය මණ්ඩල පහත දැක්වේ.

## භූ කම්පන නිරීක්ෂන පද්ධතිය නවීකරණය කිරීම සහ කම්පන නිරීක්ෂන ප භූකම්පන / ස භූ කම්පන

| සිතියම් | සම්බන්ධ වූ නිලධාරීන් |
| --- | --- |
| සිතියම් අංක : පදවිය | එච්. ඒ. සී. එන්. සංජීව මහතා (භූ විද්‍යාඥ) |
| සිතියම් අංක : තිඹොල්කැටිය | එම්. බී. එම්. ද සිල්වා මහතා (තාක්ෂණ නිලධාරී)<br>ඩී. එම්. එස්. දිසානායක මහතා (භූ විද්‍යාඥ) |
| විශ්ලේෂණ රසායනාගාරය | එස්. සිරිවර්ධන මෙනවිය (ප්‍රධාන රසඥ)<br>වී. ජයලත් මෙනවිය (රසඥ)<br>වින්ධ්‍යා වනසිංහ (රසඥ)<br>එන්. රත්නායක (රසඥ) |

## භූකම්පන නිරීක්ෂන පද්ධතිය නවීකරණය කිරීම සහ කම්පන භූකම්පන සුනාමිඅනතුරු ඇඟවීම් මධ්‍යස්ථානයේ කටයුතු

ශ්‍රී ලංකාව තුළ සහ අවට භූ කම්පන නිරීක්ෂණ කටයුතු සඳහා ඇති පහසුකම් වැඩි දියුණු කිරීම සහ එවැනි උවදුරු වලින් ඇතිවන බලපෑම් අධ්‍යයනය කිරීම භූ උවදුරු අවම කිරීමේ කාර්යයන් සඳහා අවශ්‍ය වේ. ජර්මනියේ භූ විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථානයේ අන්‍යෝන්‍ය සහයෝගය ඇතිව භූ කම්පන විද්‍යා ක්ෂේත්‍රයේ දැනට පවතින නිරීක්ෂණ කටයුතු නවීකරණය කිරීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් කාර්යාංශයට අවස්ථාව ලැබුණි. පසුගිය වසර තුළදී පාර්ශ්ව දෙක අතර අවබෝධතා ගිවිසුම අත්සන් කරනු ලැබීමෙන් සහ මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ජර්මන් විශේෂඥවරුන් සමග එක්ව ශක්‍යතා අධ්‍යයන කටයුතු සිදු කිරීමෙන් අනතුරුව මිහින්තලේ ආසන්නයේ මහකනදරාව සහ හක්මන යන ප්‍රදේශවල භූ කම්පනමාන දෙකක් සවි කරන ලදී. මෙම ව්‍යාපෘතියට සම්බන්ධ වූ නිලධාරීන් වූයේ එස්. එන්. ඩී. තල්දෙන මෙනවිය (භූ විද්‍යාඥ) සහ එම්. ඩබ්. එම්. සෙනෙවිරත්න මහතා (භූ විද්‍යාඥ) ය. 2010 වසරේදී ගල් පරයක ඉදි කරන ලද භූ කම්පන කුටියක් තුළ භූ කම්පන සංවේදක (මතුපිට මට්ටමෙන් පහත ගල් පරය තුළ පිහිටි කුටියක) සවි කරන ලදී. 2011 වර්ෂයේදී ජර්මන් විශේෂඥවරුන්ගේ සහයෝගය ඇතිව විදුලිබල බිඳවැටීම් අවම මට්ටමක පවත්වා ගැනීම උදෙසා විදුලි සැපයුම් ඒකකයක් සහ සූර්ය කෝෂ පද්ධතියක් යොදා පියෝෆෝන් භූ කම්පන මධ්‍යස්ථාන නවීකරණය කරන ලදී. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ප්‍රධාන කාර්යාලයෙහි පිහිටි භූ කම්පන දත්ත සහ සුනාමි අනතුරු ඇඟවීම් මධ්‍යස්ථානයෙහි භූ කම්පන දත්ත අන්තර්ජාලය හරහා ලබාගැනීම සඳහා මෘදුකාංග නවීකරණය කරන ලදී. පල්ලෙකැලේ පිහිටි (PALK) මධ්‍යස්ථානයෙහි ඇති උපාංග කිහිපයක්ද ප්‍රතිස්ථාපනය කරන ලදී.

මහකනදරාව (PALK) සහ හක්මන (HALK) මධ්‍යස්ථාන ඉන්දුනීසියානු සුනාමි පූර්ව අනතුරු ඇඟවීම් ජාලය සමග සම්බන්ධ කොට ඇති අතර කිසියම් සිද්ධියකට පසු සුනාමි තත්ත්වයක් ඇති වේද යන්න තීරණය කිරීම සඳහා මෙම මධ්‍යස්ථාන වලින් ලැබෙන තොරතුරු විද්‍යාඥයින්ට භාවිතා කළ හැකිය. සහයෝගිතා ව්‍යාපෘතිය යටතේ ඉන්දුනීසියානු භූ කම්පන ජාලයේ ඇති අනෙකුත් මධ්‍යස්ථාන වලින් ලැබෙන දත්ත ද ශ්‍රී ලංකාව වෙත ලබා ගත හැකිය.

## ඛනිජ පිළිබඳ වාර්ෂික ග්‍රන්ථය 2011 සහ වෙනත් ප්‍රකාශන

2011 කැලැන්ඩර් වර්ෂය තුළ ඛනිජ නිෂ්පාදනය, පාරිභෝජනය, දේශිය ඛනිජ අපනයනයන් සහ ඛනිජ ආනයනය පිළිබඳ සංඛ්‍යාලේඛන මෙම ප්‍රකාශනය තුළ අන්තර්ගත වේ. ඛනිජ පිළිබඳ වාර්ෂික ග්‍රන්ථය - 2011, 2011 වර්ෂය තුළදී ප්‍රකාශයට පත් කරන ලදී. ඛනිජ පිළිබඳ වාර්ෂික ග්‍රන්ථය - 2011 සම්පාදනය කරනු ලැබුවේ ඩී. එච්. කේ. දසනායක (දත්ත කළමනාකරණ විධායක), ප්‍රදීප් වික්‍රමසිංහ (තාක්ෂණ නිලධාරී), ප්‍රියන්ත මානවංශ (ලිපිකරු) සහ සුධර්ම විතාන (ලිපිකරු) යන මහත්වරුන් විසින් ආචාර්ය ඩබ්ලිව්. කේ. බී. එන්. ප්‍රාම් (නියෝජ්‍ය අධ්‍යක්ෂ - භූ විද්‍යා) මහතාගේ අධීක්ෂණය යටතේය.

ශ්‍රී ලංකාවේ භූ විද්‍යා සමීක්ෂන කටයුතු පිළිබඳ කථා ප්‍රවෘත්තිය' යන නමින් භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් එල්. කේ. සෙනෙවිරත්න මහතා විසින් රචිත ග්‍රන්ථය සහ ඛනිජ පිළිබඳ වාර්ෂික ග්‍රන්ථය - 2011 යන ප්‍රකාශන ගරු පරිසර අමාත්‍යතුමාගේ සහභාගිත්වයෙන් උත්සවාකාරයෙන් එළිදක්වන ලදී.

## ආදායම් උත්පාදක ව්‍යාපෘති

### මහගම තිරුවානා ඉල්ලම් නිධියෙහි පූර්ණ ගවේෂන කටයුතු

සී / ස ටුසුකාසා කොබෝ සමාගමෙහි ඉල්ලීම මත, ක්ෂේත්‍ර සිතියම් සැකසීම, සිදුරු විදීම, භූ - භෞත ගවේෂණ සහ දියමන්ති සිදුරු විදීම ඇතුලත් පූර්ණ ගවේෂණයක් සිදු කිරීමට 2011 වර්ෂයේදී භාර ගන්නා ලදී. මෙයට සම්බන්ධ වූ නිලධාරීන් වූයේ ඒ. එස්. ජයකොඩි (භූ විද්‍යාඥ) ආර්. එම්. එම්. එම්. රත්නායක (භූ විද්‍යාඥ) එස්. ටී. කළු බණ්ඩාර (භූ විද්‍යාඥ) එස්. එස්. ද සිල්වා (භූ භෞත විද්‍යාඥ) එම්. පද්මසිරි (ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී) සහ චාමර ගුනමුනි (තාක්ෂණ නිලධාරී) යන මහත්වරුන්ය. සිදුරු විදීම සහ කෙටුම් වාර්තාව පිළියෙල කිරීම ඇතුළු ක්ෂේත්‍ර කටයුතු නිම කරන ලදී. මෙම ගවේෂන කටයුත්තෙන් 2011 වර්ෂය තුළ උපයන ලද ආදායම රු. 2,800,000/- පමණ විය.

මීටර් 209.8 ක ප්‍රදේශයන් තුළ සිදුරු 05 ක් විදින ලදී. හුණුගල් නිදර්ශක වල රසායනික විශ්ලේෂණ කටයුතු 2011 වර්ෂය තුළදී නිම කරන ලදී. පොළොව මට්ටමට යටින් හොඳ තත්ත්වයේ හුණුගල් ඇති බවට ගවේෂණ මගින් අනාවරණය විය.

### කළු ගංගා වේල්ල අක්ෂය සහ උමං සලකුණු ප්‍රදේශ තුළ දියමන්ති සිදුරු විදීම් ගවේෂණ කටයුතු

මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේ සහ සී / ස ලාහ්මෙයර් ජාත්‍යන්තර සමාගමෙහි (මෙම ව්‍යාපෘතියෙහි උපදේශකයන් වන) ඉල්ලීම මත කළු ගඟ හරහා වේල්ල ඉදි කිරීම සඳහා යෝජිත ව්‍යාපෘතිය සුදුසුද යන්න පරීක්ෂා කිරීම සඳහා සිදුරු විද ගවේෂණ කටයුතු කිරීමේ කාර්යය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් කාර්යාංශය විසින් භාර ගන්නා ලදී. මේ ගවේෂණයේදී මීටර් 550 ක් වන භූමි ප්‍රදේශයන් තුළ සිදුරු 13 ක් විදින ලදී.

2011 වර්ෂය තුළදී මෙම ව්‍යාපෘතියෙන් උපයන ලද ආදායම රු. 8,000,000 විය.

ශ්‍රී ලංකාවේ නැගෙනහිර ප්‍රදේශයේ 1 : 50,000 පරිමාණයේ තිරුක්කෝවිල් සහ තම්පඩයි සිතියම් ප්‍රදේශය මගින් ආවරණය වන වෙරළ තීරය දිගේ ඛනිජ

## වැලි ගවේෂණය

සී / ස ධම්සිලා පුද්ගලික සමාගෙම් ඉල්ලීම මත මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට භාර ගන්නා ලදී. 2010 වර්ෂය තුළදී ක්ෂේත්‍ර කටයුතු නිම කරන ලද අතර එකතු කරගන්නා ලද වැලි නිදර්ශක 550 ක ඛනිජ විද්‍යාත්මක ගවේෂන කටයුතු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි පාෂාණ විද්‍යා විද්‍යාගාරයේදී සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතිය තුළින් 2011 වර්ෂය තුළදී උපයන ලද ආදායම රු. 600,000 ක් විය.

### සී / ස හොල්සිම් ලංකා ආයතනය සඳහා අච්චුමලේ මැටි නිධියෙහි සිදුරු විදීම් කටයුතු

අච්චුමුලේ ප්‍රදේශයෙහි නොගැඹුරු සිදුරු විදින 35 ක් සහ පොම්ප කිරීමේ පරීක්ෂණ කිහිපයක් සඳහා වූ විදීම් කාර්යය 2011 වර්ෂයේ අගොස්තු මාසයේදී සිදු කිරීමට භාර ගන්නා ලදී. මෙම ව්‍යාපෘතිය මගින් වර්ෂය තුළදී උපයන ලද ආදායම රු. 6,500,000 ක් විය.

### පුනරීන් ප්‍රදේශයේ මයෝසින හුණුගල් ගවේෂණ කටයුතු

උතුරු වසන්තය යටතේ සිදු කළ සීඝ්‍ර සම්පත් ඇගයීම් ගවේෂන වලින් අනතුරුව, හුණුගල් නිධි ඇතැයි බලාපොරොත්තු වන ස්ථාන තුළ සිදුරු විදීම් පරීක්ෂණ කිහිපයක් සිදු කිරීමට තීරණය කරන ලදී. 2010 වර්ෂයේ ජුලි - සැප්තැම්බර් කාල පරිච්ඡේදය තුළදී මීටර් 209.8 ක ප්‍රදේශයන් තුළ සිදුරු 05 ක් විදින ලදී. හුණුගල් නිදර්ශක වල රසායනික විශ්ලේෂණ කටයුතු 2011 වර්ෂය තුළදී නිම කරන ලදී. පොළොව මට්ටමට යටින් හොඳ තත්ත්වයේ හුණුගල් ඇති බවට ගවේෂණ මගින් අනාවරණය විය.

### මොරගහකන්දේ දියමන්ති සිදුරු විදීම්

වේල්ල ඉදිකිරීම සඳහා යෝජිත ප්‍රදේශය දකුණු ඉවුරු තුළ සිදුරු විදීම් කටයුතු මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේ ඉල්ලීම මත සිදු කිරීමට භාර ගන්නා ලදී. 2010 සැප්තැම්බර් මාසයේදී වැඩ කටයුතු ආරම්භ කොට 2011 වර්ෂයේදී අවසන් කරන ලදී. මෙම කාර්යයට සම්බන්ධ වූ නිලධාරීන් වූයේ ඒ. එස්. ජයකොඩි (භූ විද්‍යාඥ), කේ. එස්. ජේ. ප්‍රනාන්දු (විදීම් විධායක) සහ පලිහදෙනිය (තාක්ෂණ නිලධාරී) යන මහත්වරුන්ය.

## ඛනිජ වැලි ගවේෂණ කටයුතු

සී / ස ඇල්වේම් ලංකා පුද්ගලික සමාගම සහ ධම්සිලා පුද්ගලික සමාගම යන පුද්ගලික සමාගම් දෙකෙහි ඉල්ලීම මත උතුරු නැගෙනහිර වෙරළ තීරය දිගේ ඛනිජ වැලි ගවේෂන කටයුතු සිදු කරන ලදී. මෙම ප්‍රදේශය තුළ වෙරළ ඛනිජ වැලි තිබිය හැකි බව මෙම ගවේෂන මගින් පෙන්නුම් කරන ලදී. මෙම ගවේෂණය සිදු කරන ලද්දේ එස්. ටී. කළුබණ්ඩාර (භූ විද්‍යාඥ) සහ ඩී. එම්. එස්. දිසානායක (භූ විද්‍යාඥ) යන මහත්වරුන් විසිනි.

## ඛනිජ බුද්ධි අංශය

ඛනිජ ආයෝජන ගිවිසුම්, ඛනිජ ප්‍රතිපත්තිය, ගවේෂන යෝජනා සහ ඒ ආශ්‍රිත කටයුතු සම්බන්ධයෙන් අදාල පාර්ශ්ව සමග සන්නිවේදන කටයුතු සිදු කිරීම සහ සම්බන්ධ කටයුතු ඛනිජ බුද්ධි අංශය විසින් සිදු කරගෙන යන ලදී.

## විද්‍යාගාර නවීකරණය

දැනට පවතින විද්‍යාගාර පහසුකම් නවීකරණය කිරීමේ ප්‍රධානතම පියවරක් ලෙස අළුත් උපකරණ කිහිපයක් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි විද්‍යාග ාරවලට එක් කරන ලදී. විශ්ලේෂක විද්‍යාගාරයට රු. 16,500,000 ක මුදලක් වැය කොට ලබා දෙන ලද ප්‍රේරිත ප්‍රාග්ම ප්ලාස්මා ප්‍රකාශ විමෝචන වර්ණාවලිමානය සහ පාෂාණ විද්‍යා විද්‍යාගාරයට ලබා දෙන නවතම ෆ්‍රාන්ටිස් (Franti) සමගතික විභේදකය මෙම උපකරණ වලට ඇතුළත් වේ. චුම්භක මාන (GEM-19), චැනල් 24 - භූ කම්පන මානයක් සහ ඒබම් (ABEM) ටෙරා මීටර් (S 800) භූ භෞත ගවේෂණ කටයුතු සඳහා ලබා දෙන ලදී.

## පුස්තකාලයේ සේවා හා කටයුතු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

2011 වර්ෂය තුළදී විද්‍යාත්මක සඟරා සහ නව පෙළපොත් මිලදී ගැනීම සඳහා කාර්යාංශය විසින් රු. 2,800,000 වැය කරන ලදී. 'කාලීන දැනුවත් කිරීම්'' ප්‍රවෘත්ති සංග්‍රහයේ කලාප තුනක් සම්පාදනය කරන ලද අතර රටේ පිහිටි ප්‍රධාන තාක්ෂණ විද්‍යාල / විශ්ව විද්‍යාලවල පුස්තකාල වෙත බෙදා හරින ලදී.

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය විසින් නිර්මාණය කරන ලද නව මෘදුකාංගයක් සහ පුස්තකාල පොත් සඳහා තීරු සංකේතයක් හඳුන්වා දීම තුළින් පුස්තකාල පහසුකම් පරිගණක ගත කරන ලදී. පෙළපොත් වල නම් සටහන් යෙදීම සිදු කරනු ලබමින් පවතී. පාසල්, ශ්‍රී ලංකා භූ විද්‍යා සංගමය සහ වෙනත් විවිධ සංගම් විසින් සංවිධානය කරන ලද ප්‍රදර්ශන, පාසල්, විද්‍යා වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ගණනාවකටද කාර්යාංශය සහභාගි විය. කාර්යාංශය විසින් සංවිධානය කරන ලද ප්‍රදර්ශන කුටි ජනප්‍රිය මෙන්ම මනා ලෙස තොරතුරු ලබා දෙන බව දක්නට ලැබුණි. තන්තිරිමලේ ඔයාමඩුව හි පවත්වන ලද 'දැයට කිරුළ' ප්‍රදර්ශනයෙහි භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් කාර්යාංශය විසින් සංවිධානය කරන ලද ප්‍රදර්ශන කුටිය ඉමහත් ජනතා ආකර්ශනයක් දිනා ගත්තේය.

## වෙනත් කටයුතු

පරිගණක හා ආශ්‍රිත උපාංග නඩත්තුව සහ වෙබ් අඩවිය පවත්වාගෙන යාම ආශ්‍රිත දෛනික කටයුතු සිදු කරන ලද්දේ ඩී. එම්. දසනායක (දත්ත කළමනාකරණ විධායක) ප්‍රදීප් වික්‍රමසිංහ (තාක්ෂණ නිලධාරී- තොරතුරු තාක්ෂණය ) සහ බුද්ධික මාරපන (තාක්ෂණ නිලධාරී - තොරතුරු තාක්ෂණය ) යන මහත්වරුන් විසිනි. ප්‍රාදේශීය කාර්යාල වල තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් නඩත්තුව සහ වැඩි දියුණු කිරීම් කටයුතු සඳහා ද ඔවුහු සහභාගි වූහ.

පාසල් ළමයින් සහ වෙනත් රාජ්‍ය ආයතන සහභාගි වූ දැනුවත් කිරීමේ වැඩසටහන්, ප්‍රදර්ශන, වැඩමුළු සහ සම්මන්ත්‍රණ කිහිපයකටද භූ විද්‍යා අංශයේ නිලධාරීහු සිය දායකත්වය ලබා දුන්හ.

## විදේශ අධ්‍යයන වැඩසටහන්, වැඩමුළු, සම්මන්ත්‍රණ සඳහා සහභාගි වීම

- සී. එච්. ඊ. ආර්. සිරිවර්ධන මහතා (භූ විද්‍යාඥ) ඇමෙරිකාවේ කෙන්ට් විශ්ව විද්‍යාලයේ සිය ආචාර්ය උපාධි කටයුතු ඉදිරියට කරගෙන ගිය අතර අචාර්ය පී. එන්. රණසිංහ මහතා කෙන්ට් විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධිය නිම කිරීමෙන් පසුව සාගර විද්‍යාව පිළිබඳ වුඩ්ස්හෝල් ආයතනයෙහි පර්යේෂන අධ්‍යයන කටයුතු කරගෙන ගියේය.
- චන්දිම ප්‍රනාන්දු මෙනවිය නෙදර්ලන්තයේ අයි. ටී. සී. ආයතනයේ සිය විද්‍යාශූරි උපාධි අධ්‍යයන කටයුතු සිදු කළාය.
- එස්. එන්. ද සිල්වා මහතා (භූ භෞත විද්‍යාඥ) 2011 මැයි මස 16 වැනි දින සිට 19 වැනි දින දක්වා ඉරාන ඉස්ලාමීය ජනරජයේ ටෙහෙරාන් හි

පැවැත්වුණු 'භූ කම්පන විද්‍යාව සහ භූ කම්පන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ -6 වන ජාත්‍යන්තර සම්මේලනයට' සහභාගි විය.

- 2011 ජුනි මස 08 වැනි දින සිට ඔක්තෝබර් මස 27 වැනි දින දක්වා තායිලන්තයේ බැංකොක් නුවර පවත්වන ලද කලාපීය සමෝධානිත බහු උවදුරු පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතියේ සේවාස්ථ පුහුණු වැඩසටහනට ආරාධිත විද්‍යාඥයෙකු ලෙස එස් එන් බී තල්දෙන මෙනවිය (භූ විද්‍යාඥ) සහභාගි වූවාය.
- 2011 ජුනි මස 20 වැනි දින සිට ජුලි මස 08 වැනි දින දක්වා ඔස්ට්‍රියාවේ බඩෙන් හි පවත්වන ලද වියානාහි 'විස්තීර්ණ න්‍යෂ්ඨික පර්යේෂණ තහනම් කිරීම පිළිබඳ සංවිධානය විසින් සංවිධානය කරන ලද උසස් ස්ථානීය පරීක්ෂන පුහුණු වැඩසටහනට ආචාර්ය ඩබ්ලිව්. කේ. බී. එන්. ප්‍රාම් මහතා (නියෝජ්‍ය අධ්‍යක්ෂ- භූ විද්‍යා), එස්. එන් ද සිල්වා මහතා (භූ භෞත විද්‍යාඥ) සහ ටී. ඩී. ද විජේසුන්දර මෙනවිය (භූ භෞත විද්‍යාඥ) සහභාගි වූහ.
- 2011 සැප්තැම්බර් මස 19 වැනි දින සිට ඔක්තෝබර් 21 වැනි දින දක්වා පැවැත්වුණු ජර්මනියේ වොට්ස්ඩම් හි හෙල්මෝල්ට්ස් මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද 'භූ කම්පන විද්‍යාව, භූ කම්පන දත්ත විශ්ලේසණය කිරීම, උවදුරු තක්සේරු කරීම සහ අවදානම් තත්ත්ව දුරලීම පිළිබඳ ජාත්‍යන්තර පුහුණු පාඨමාලාව' ට එස්. ඩබ්. එම්. සෙනෙවිරත්න (භූ භෞත විද්‍යාඥ) මහතා සහභාගි විය.
- 2011 ඔක්තෝබර් මස 17 සිට 21 වැනි දින දක්වා ඉන්දියාවේ කේරළ ප්‍රාන්තයේදී තිරුවන්තපුරම් හි පවත්වන ලද 'ලෝක තොරියම් සම්පත්' පිළිබඳ තාක්ෂණික රැස්වීමට කේ. ටී. යූ. එස්. ද සිල්වා (සහකාර අධ්‍යක්ෂ) මහතා සහභාගි විය.
- 2011 නොවැම්බර් මස 12 වැනි දින සිට 20 වැනි දින දක්වා ජපානයේ ටෝකියෝ හි ධ්‍රැවීය පර්යේෂණ පිළිබඳ ජාතික ආයතනයේදී පවත්වන ලද 'ධ්‍රැවීය භූ විද්‍යා පිළිබඳ සම්මේලනයට' වයි. කේ. බී. ප්‍රේම් (නියෝජ්‍ය අධ්‍යක්ෂ - භූ විද්‍යා) මහතා සහභාගි විය.
- **2011 දෙසැම්බර් මස 16 වැනි දින සිට 17 වැනි දින දක්වා ඉන්දියාවේ නව දිල්ලියේදී පවත්වන ලද භූ කම්පන උවදුරු ඇගයීම පිළිබඳ සාර්ක් විද්වත් කණ්ඩායම් රැස්වීමට ආචාර්ය ඩබ්ලිව්. කේ. බී. ප්‍රේම් මහතා (නියෝජ්‍ය අධ්‍යක්ෂක භූ විද්‍යා) සහභාගි විය.**

## විද්‍යාගාර සේවා

### (අ) විශ්ලේෂක විද්‍යාගාරය

#### සේවා

ශ්‍රී ලංකාවේ සිලිකේට් විශ්ලේෂණ ක්‍රමෝපායන් සම්බන්ධයෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ විශ්ලේෂක විද්‍යාගාරය පුරෝග ාමිත්වයක් දරා ඇත. දශක පහකට අධික කාලයක් තිස්සේ කර්මාන්ත සහ විද්‍යාත්මක පර්යේෂන ව්‍යාපාරික ආයනත වෙත ගුණාත්මක තත්ත්වයෙන් යුතු විශ්ලේෂක සේවා අපි ලබා දෙමින් සිටිමු. පාෂාණ, ඛනිජ, ලෝපස්, භූගත ජලය, මතුපිට ජලය, කාර්මික අපද්‍රව්‍ය සහ වෙනත් විවිධ ද්‍රව්‍යයන් පිළිබඳ නිවැරදි සහ විශ්වාසනීය රසායනික විශ්ලේෂණ ජාත්‍යන්තර ලෙස පිළිගත් ක්‍රමෝපායන් සහ ප්‍රමිතීන් භාවිතා කොට ඉතාම තරඟකාරී මිල ගණන් යටතේ විද්‍යාගාරය විසින් ලබා දෙනු ලැබේ.

#### ප්‍රධාන කාර්යයන්

පහත සඳහන් ක්ෂේත්‍ර තුළ මූලික සහ උසස් රසායනික විශ්ලේෂණය

- ඛනිජ කර්මාන්ත - අමුද්‍රව්‍ය පරීක්ෂා කිරීම
- ජලයේ ගුණාත්මක බව පරීක්ෂා කිරීම
- රසායනික සිතියම් සැකසීම සහ පර්යේෂණ කටයුතු
- පාරිසරික ගුණාත්මක තත්ත්ව ඇගයීම
- විශ්ව විද්‍යාලවල උපාධි අපේක්ෂකයන්, පශ්චාත් උපාධි අපේක්ෂකයන් සහ අදාළ රාජ්‍ය අංශයේ දෙපාර්තමේන්තු වල සේවය කරන විද්‍යාත්මක සේවයේ නිලධාරීන් සඳහා මෙය පුහුණු මධ්‍යස්ථානයක් බවට පත් ව ඇත.

#### ක්‍රමවේදයන් සහ උපකරණ පද්ධතිය

- අපවිත්‍රවීමක් සිදු නොවන ටංග්ස්ටන් කාබයිඩ් ඇඹරුම් යන්ත්‍ර මගින් කුඩු කිරීම
- සම්ප්‍රදායික සිලිකේට් කැකෑරුම් ක්‍රම / නූතන මයික්‍රොවේව් කැකෑරුම
- කට නැක්සෆ්ලක්ෂරයක් යොදා ගෙන එක්ස් රේ ප්‍රතිදීප්ත විශ්ලේසණය සිදු කරීම සඳහා උණ්ඩි පිළියෙල කිරීම.

- ප්‍රධාන, සුළු සහ සමහර දුර්ලභ පාංශු මූලද්‍රව්‍ය 25කට අධික සංඛ්‍යාවක් හඳුනාගැනීම සඳහා ගිනි දලු සහ උෂ්මික ශිල්පක්‍රම සහිත පරමාණුක අවශෝෂන වර්ණාවලී දීප්තමානය බොහෝ මූලද්‍රව්‍ය සඳහා ඒවා දැකිය හැකි බිලියනයකට කොටස් සංඛ්‍යාවේ සිට ප්‍රතිශතය දැක්වීම දක්වා පුළුල් විශ්ලේෂන පරාසයක් මෙම ක්‍රමෝපාය මගින් ආවරණය කෙරේ.
- ආසනික්, සෙලෙනියම්, ඇන්ටිමනි, බිස්මත්, සහ සිල්වර් වැනි ලෝහ නොවන මූලද්‍රව්‍ය විශ්ලේෂණය කිරීම සඳහා හයිඩ්‍රයිඩ නිෂ්පාදනය
- පොස්පේට, ෆ්ලුවොරයිඩ, ක්ලෝරයිඩ, නයිට්‍රේට් ආදී අයන විශ්ලේෂණය කිරීම සඳහා පාරජම්බුල දෘශ්‍ය වර්ණදීප්තමානය සහ අයන විශ්ලේෂණය
- දැනට පවතින වෙනත් උපකරණ ගණයට උෂ්මක පී එච් / ද්‍රාව්‍ය ඔක්සිජන් මාපක, සන්නායකතාව / ලවනතාවය පූර්ණ ලෙස දිය වී ඇති ඝන ද්‍රව්‍ය මාපක ඇතුළත් වේ.
- භූ විද්‍යා සහ පාරිසරික ද්‍රව්‍ය වල මූලද්‍රව්‍ය 60කට ආසන්න සංඛ්‍යාවක් එකවර විශ්ලේෂණය කිරීමේ හැකියාව ඇති ඉහළ සංඛ්‍යාතයකින් යුතු ආලෝකයක් සහ ඉහළ ඝන ද්‍රව්‍ය නිහාරිකාරකයක්, හයිඩ්‍රයිඩ උත්පාදන පද්ධතියක් සහිත වාෂ්ප කුටීර පද්ධති වලින් සමන්විත ප්‍රේරිත යුග්ම ප්ලාස්මා ප්‍රකාශ විමෝචන වර්ණාවලිමානය

### ආ) පාෂාණ විද්‍යා විද්‍යාගාරය

**සේවා**

ප්‍රමාණාත්මක ඛනිජ විභේදන කාර්යය ඇතුලුව ශ්‍රී ලංකාව තුළ පාෂාණ විද්‍යාමය විශ්ලේෂණ ක්‍රමෝපායන් පිළිබඳ ප්‍රමුඛත්වය ලබාගෙන ඇත්තේ පාෂාණ විද්‍යා විද්‍යාගාරයයි. දශක පහකට වැඩි කාලයක් තිස්සේ අපි රටට සේවය කරමින් සිටිමු.

ඉහළින්ම තරඟකාරී මිල ගණන් යටතේ අන්තර්ජාතිකමය වශයෙන් පිළිගත් ක්‍රමෝපායන් යොදා ගෙන පාෂාණ, ඛනිජ, ලෝපස් සහ ඒ හා සමාන ද්‍රව්‍ය පිළිබඳ නිවැරදි ඛනිජ විද්‍යාත්මක පාෂාණ විද්‍යාත්මක විශ්ලේෂණයන් මෙම විද්‍යාගාරය මගින් ලබා දෙනු ලැබේ.

**ප්‍රධාන කාර්යයන්**

- පහත සඳහන් කාර්යයන් සඳහා මූලික සහ උසස් ඛනිජ විද්‍යාත්මක සහ පාෂාන විද්‍යාත්මක විශ්ලේෂන අප විසින් ලබා දෙනු ලැබේ.
- භූ විද්‍යා පර්යේෂණ / භූ විද්‍යා සිතියම් සැකසීම / ඛනිජ ගවේෂණ වැඩසටහන්
- ඛනිජ ආශ්‍රිත කර්මාන්ත අංශය සඳහා අමුද්‍රව්‍ය පරීක්ෂා කිරීම
- සාමාන්‍ය මහජනතාව උදෙසා පාංශු ද්‍රව්‍ය පරීක්ෂා කිරීම සහ හඳුනාගැනීම
- ක්‍රමවේදය / උපකරණ පද්ධතිය
- නිරවද්‍ය සිදීම් කියත්, පෘෂ්ඨ ස්පර්ශක යන්ත්‍ර යොදා ගෙන පාෂාණ, ලෝපස් ආදියෙහි ගුණාත්මක බවින් යුතු සිහින් හරස්කඩ සහ ඔප දැමූ හරස්කඩ පිළියෙල කිරීම

## අප සුවිශේෂී වන්නේ මන්ද ?

| | |
|---|---|
| විශ්වාසනීයත්වය : | සේවාදායකයින් වෙත විශ්වසනීය සේවාවක් සපයනු ලැබේ. |
| වලංගුභාවය : | අපගේ විශේෂඥ කණ්ඩායම් විසින් නූතන තාක්ෂණය යොදා ගෙන වලංගු වාර්තා සපයයි. |
| කාර්යක්ෂමතාවය : | ඉතාම කඩිනමින් වාර්තා ලබා දෙනු ලැබේ. |
| ගාස්තු දැරිය හැකි මට්ටමක පවතීද ? : | සංසන්දනාත්මකව අඩු ගාස්තු |
| කීර්තිනාමය : | රටෙහි පාෂාණ සහ ඛණිජ විශ්ලේෂණය කිරීම සඳහා යොමු කිරීමට සුදුසු සම්මත විද්‍යාගාරය ලෙස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශ විද්‍යාගාරය සැලකේ. |

- ඔලිම්පස් පාෂාණ විද්‍යාමය අන්වීක්ෂ යොදාගෙන තුනී හරස්කඩ සහ ඔප දැමූ හරස්කඩ වල ඛනිජ විද්‍යාත්මක සහ ආකෘති විශ්ලේෂණය
- තුනී හරස්කඩ වල ක්ෂුද්‍ර ඡායාරූප
- බර ද්‍රව (ගුරුත්ව) විභේදන ක්‍රමය යොදා ගෙන වැලි, යපස් ආදිය තුළ ඇති ඛනිජ විභේදනයන්
- චුම්බක ඛනිජ : ෆ්‍රොන්ට්ස් සමගතික විභේදකය යොදා ගෙන සිදු කරන විභේදනයන්
- අංශුමය ප්‍රමාණයේ වැලි, පස්, මැටි ආදිය බෙදා හැරීම සඳහා බී. එස් පෙනේර සහ රොන්මඩ / මැටි වර්ගයට අයත් ද්‍රව්‍ය සඳහා පිපෙට්ටු ක්‍රමය භාවිත කිරීම
- සංඛ්‍යාත ප්‍රස්තාර සමුච්චිත වක්‍ර ආකාරයට දත්ත ඉදිරිපත් කිරීම
- භෞතික සහ ප්‍රකාශ ලක්ෂණ යොදා ගෙන ඛනිජ හඳුනාගැනීම
- අවකලන තාප විශ්ලේෂණ ක්‍රමෝපාය භාවිතා කොට පාෂාණ කාබනේට සහ මැටි තුළ ඇති ඛනිජ අවදි හඳුනාගැනීම

### (ඇ) භූ භෞත විද්‍යාගාරය

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි භූ භෞත විද්‍යාගාරය තුළ නවීන ඉතා ඉහළ තාක්ෂණයෙන් යුතු උපකරණ සහ මෘදුකාංග දක්නට ලැබෙන අතර භූ භෞත පරීක්ෂණ ගණනාවක් සිදු කොට අත්දැකීම් ලත් පලපුරුදු පුද්ගලයින් විසින් එම උපකරණ හැසිරවීම සිදු කරනු ලැබේ. උප පෘෂ්ඨය තුළ සම්පත් ව්‍යාප්තිය, ඉදිකිරීම් ස්ථාන සඳහා උප පෘෂ්ඨීය ලක්ෂණ පිළිබඳ භූ භෞත ආකෘති නිර්මාණය කිරීම සහ විශේෂයෙන්ම නාගරික ප්‍රදේශ වල භූගත ජලය දූෂණය වීම වැනි පාරිසරික ගැටළු පිළිබඳ විසඳුම් සෙවීම සඳහා විශේෂ අවධානය යොමු කරමින් ඛනිජ ගවේෂණ පරීක්ෂණ සිදු කිරීම මෙම ඒකකය සිදු කරයි. භූ භෞත පරීක්ෂණ සිදු කිරීමේදී ඉහළ මට්ටමේ වෘත්තිය ප්‍රමිතීන් පවත්වා ගනිමින් සේවාදායකයන් වෙත කැපවීමක් සහිත සේවාවක් ලබා දෙනු ලැබේ.

භූ භෞත අංශයට අදාල ජාතික අවශ්‍යතාවයන් මෙම ඒකකය මගින් කඩිනමින් සහ කාර්යක්ෂම ලෙස සපුරාලනු ලැබේ. භූ භෞත දත්ත ලබාගැනීමේ නවීන ක්‍රම වේදයන් සහ දත්ත සැකසීම් හැකියාව සම්බන්ධයෙන් මෙම භූ භෞත විද්‍යාගාරය අඛණ්ඩව යාවත්කාලින කරනු ලැබේ. ප්‍රතිරෝධතා, චුම්බක, වර්තන, භූ කම්පන පරීක්ෂණ සහ භූමිය සිදුරු කිරීම පිළිබඳ රේඩාර් පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ කුසලතාවයන් මෙම විද්‍යාගාරයට ඇත.

## අප සුවිශේෂී වන්නේ ඇයි ?

විශ්වසනීයත්වය සහ වලංගු භාවය : නූතන තාක්ෂණය සහ විශ්වසනීය කාර්ය මණ්ඩලයක් යොදා ගෙන විශ්වසනීය සහ වලංගු වාර්තා සපයනු ලැබේ.

කාර්යක්ෂමතාවය : හැකි කෙටිම කාල රාමුවක් තුළදී කලට වේලාවට කාර්යයන් ඉටු කර දීම

ගාස්තු දැරිය හැකියද යන වග : සාපේක්ෂව අවම ගාස්තු

කීර්තිනාමය : ශ්‍රී ලංකාවේ පාෂාණ විද්‍යාත්මක විශ්ලේෂණ ක්ෂේත්‍රය තුළ සම්මත විද්‍යාගාර ලෙස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි විද්‍යාගාර පිළිගනු ලැබේ.

## කැනිම් අංශය

### කැනීම් අංශයේ ප්‍රධාන කාර්යයන්

ප්‍රාදේශීය කාර්යාල 14 ක් සමග එක් වී කැනීම් අංශය වර්තමානයේදී ක්‍රියාත්මක වේ. විවිධ ආකාරවල කැනීම් කර්මාන්තවල නිරත සේවාදායකයින් වෙත අපගේ සේවාවන් ලබාදීම සඳහා මෙම කාර්යාල පිහිටුවා ඇත. 1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනතට මෑතකදී එකතු කරන ලද සංශෝධන ප්‍රකාරව නීති විරෝධී කැනීම් කටයුතු පාලනය කිරීම සඳහා කාර්යාංශය වෙත පුළුල් බලතල ලබා දී ඇත. ප්‍රධාන කාර්යයන් තුළට භූමි පරීක්ෂාව, පරීක්ෂන පිපිරුම්, මහජන පැමිණිලි විමර්ශනය කිරීම, කැනීම් කටයුතු, වෙළඳාම, ගවේෂණය සහ ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම, නීති විරෝධී කැනීම් කටයුතු අවම කිරීම ඇතුලත් වේ. කැනීම් අංශයේ ප්‍රධාන කාර්යයන් ලෙස පහත දැක්වෙන කාර්යයන් වැදගත් වේ.

- 1992 අංක 33 දරන පතල් හා ඛනිජ යටතේ ඛනිජ සැකසීම සහ අපනයනය යන කාර්යයන් සඳහා කැනීම් සිදුකිරීමේ වාණිජමය සාර්ථකත්වය ඇගැයීමට ලක් කිරීමට.
- බලපත්‍ර නිකුත් කිරීම තුළින් ඛනිජ ගවේෂණය හා කැනීම් සහ ඒවා අලෙවිකරණය සහ අපනයනය විධිමත් කිරීම.
- වාණිජමය පදනමකින් ඛනිජ නිස්සාරණය කිරීම සහ නිෂ්පාදනය කිරීම ප්‍රවර්ධනය කිරීම උදෙසා ගත යුතු පියවර සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් ලබාදීම.

### ලබාගත හැකි සේවා

- පතල් පරීක්ෂා කිරීම (ජංගම සේවය - බලපත්‍ර නිකුත් කිරිම, තාක්ෂණික උපදෙස් ලබා දීම)
- විශේෂඥ සේවා : (පිපිරීම් ශිල්ප ක්‍රම, බලපත්‍ර අළුත් කිරීම, ආරක්ෂණ ක්‍රම, පරීක්ෂන පිපිරීම්, පොළව ඉරිතලා යාම් පිළිබඳ පරීක්ෂණ සිදු කිරීම)
- දැනුවත් කිරීමේ වැඩසටහන් (රාජ්‍ය නිලධාරීන් හා බලපත්‍ර හිමියන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්, කැනීම් කටයුතු වල නිරත ජනතාව සඳහා වැඩමුළු පැවැත්වීම, ප්‍රදර්ශන)
- පුනරුත්ථාපන වැඩසටහන් (පරිසරය ආරක්ෂා කිරීම සඳහා පතල් දිරිගැන්වීම, පරිසර ආරක්ෂණය සිදු කරන්නේදැයි පරීක්ෂා කිරීම සහ පතල් මගින් ක්‍රියාත්මක කරනු ලබන පුනරුත්ථාපන වැඩසටහන්)

### පාරිසරික නිෂ්කාශනයන්

ජාතික පාරිසරික පනත යටතේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද සියළුම කැනීම් සහ ඛනිජ නිස්සාරණ ව්‍යාපෘති විසින් අදාළ පරිදි මූලික පාරිසරික විමර්ශන වාර්තාව හෝ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව ඉදිරිපත් කොට පාරිසරික නිෂ්කාශනය ලබා ගත යුතුය.

කාර්මික කැනීම් බලපත්‍ර 'ඒ' කාණ්ඩය යටතේ වන (කා. කැ. බ. ඒ) සියලුම කැනීම් කටයුතු සඳහා පාරිසරික නිෂ්කාශනය ලබා ගත යුතුය.

### භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් කාර්යාංශය මගින් නිකුත් කරනු ලබන බලපත්‍ර වර්ග

- ගවේෂණ බලපත්‍ර
- කැනීම් බලපත්‍ර (ශිල්පීය, කාර්මික, විශේෂිත, ඛනිජ)
- වෙළඳ බලපත්‍ර
- අපනයන බලපත්‍ර
- ප්‍රවාහන බලපත්‍ර

### බලපත්‍ර සහ ක්‍රියාපටිපාටීන්

1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත යටතේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් බලපත්‍ර වර්ග 3 ක් නිකුත් කරනු ලැබේ. ඒවා නම් ගවේෂන බලපත්‍ර, කැනීම් බලපත්‍ර සහ වෙළඳ හා ප්‍රවාහන බලපත්‍රය යන මේවා ය.

#### (අ) ගවේෂණ බලපත්‍ර

බලපත්‍රය මගින් අවසර ලබා දෙන ලද සියළුම ඛනිජ වර්ග ගවේෂණය කිරීමේ අනන්‍ය අයිතිවාසිකම ගවේෂන බලපත්‍ර මගින් බලපත්‍රලාභියාට ලබා දෙනු ලැබේ. 2008 සිට 2011 දක්වා කාල පරිච්ඡේදය තුළ නිකුත් කරන ලද ගවේෂණ බලපත්‍ර පහත සටහනෙන් පෙන්නුම් කෙරේ.




ගවේෂණ බලපත්‍ර අංක 21

**(ආ) කැනීම් බලපත්‍ර**

**ශිල්පීය කැනීම් බලපත්‍ර (ශි. කැ. බ.)**

හෙක්ටෙයාර් 10 ක් නොඉක්මවන ප්‍රදේශයක් හෝ මීටර් 25 ක් නොඉක්මවන ගැඹුරකට බලපත්‍රය මගින් නිශ්චිත ලෙස දක්වා ඇති සියලුම ඛනිජ කැනීම, සැකසීම සහ වෙළඳාම් කිරීම සිදු කිරීමේ අනන්‍ය අයිතිවාසිකම මෙමගින් මෙම බලපත්‍රලාභියා වෙත ලබා දෙනු ලැබේ.

ඒ කාණ්ඩය - පහත සඳහන් කොන්දේසි එකක් හෝ වැඩි ගණනක් මෙයට ඇතුළත් වේ.

- කැනීම් සිදුරෙහි ගැඹුර මීටර් 1.5 ට වඩා අඩු විය යුතුය.
- මාසික නිෂ්පාදන ධාරිතාවය ඝන මීටර් 100කට වඩා අඩු නොවිය යුතු සහ ඝන මීටර් 600කට වඩා වැඩි නොවිය යුතුය.
- යන්ත්‍රෝපකරණ කිසිවක් භාවිතා නොකළ යුතුය.

බී කාණ්ඩය - පහත සඳහන් කොන්දේසි එකක් හෝ වැඩි ගණනක් මෙයට ඇතුළත්ය.

- විදුම් සිදුරෙහි ගැඹුර මීටර් 1.5 කට වඩා අඩු වියයුතුය.
- මාසික නිෂ්පාදන ධාරිතාවය ඝන මීටර් 100 නොඉක්මවිය යුතුය.
- යන්ත්‍රෝපකරණ කිසිවක් භාවිතා නොකළ යුතුය.

2008 සිට 2001 දක්වා කාල පරිච්ඡේදය තුළ නිකුත් කරන ලද ශිල්පීයකැනීම් බලපත්‍ර පහත සටහනෙහි පෙන්නුම් කෙරේ.




ශිල්පීය කැනීම් බලපත්‍ර
ඒ කාණ්ඩය - 1378 / බී කාණ්ඩය - 2961

**කාර්මික කැනීම් බලපත්‍ර (කා. කා. බ)**

බලපත්‍රය මගින් නිශ්චිත ලෙස දක්වා ඇති ප්‍රදේශය තුළ එමගින් දක්වා ඇති සියළුම ඛනිජ කැනීම, සැකසීම හා වෙළඳාම සිදු කිරීමේ අනන්‍ය අයිතිවාසිකම මෙම බලපත්‍රය මගින් ලබා දෙනු ලැබේ. කාර්මික කැනීම් බලපත්‍ර කාණ්ඩ 3 ක් ඇත.

ඒ කාණ්ඩය - පහත සඳහන් කොන්දේසි එකක් හෝ කිහිපයක් අන්තර්ගත වේ.

- පිපිරවීම් ක්‍රමය : ප්‍රමාද කිරීමේ මූලද්‍රව්‍ය යොදා ගෙන බහු විදුම් සිදුරු
- විදුම් සිදුරේ ගැඹුර මීටර් 30 ට වඩා වැඩි වේ.
- නිෂ්පාදන ධාරිතාවය - මාසික නිෂ්පාදන ධාරිතාවය ඝන මීටර් 1500 කට වඩා වැඩි විය යුතුය.
- භාවිතා කළ හැකි යන්ත්‍රෝපකරණ - ප්‍රවේශ විදුම් යන්ත්‍ර, වායව, විදුම් යන්ත්‍ර, ගල් කඩන යන්ත්‍ර, පැටවීම් යන්ත්‍ර සහ වෙනත් යන්ත්‍රෝපකරණ

බී කාණ්ඩය : පහත සඳහන් කොන්දේසි එකක් හෝ කිහිපයක් අන්තර්ගත වේ.

- පිපිරවීම් ක්‍රමය - තනි විදුම් සිදුර
- විදුම් සිදුරු වල ගැඹුර - මීටර් 1.5 ට නොඅඩු සහ මීටර් 3 ට නොවැඩි
- නිෂ්පාදන ධාරිතාවය - ඝන මීටර් 1500 ට වඩා නොවැඩි විය යුතුය
- වායව විදුම් යන්ත්‍ර පමණක් භාවිතා කළ යුතුය

සී කාණ්ඩය : පහත සඳහන් කොන්දේසි එකක් හෝ කිහිපයක් අන්තර්ගත වේ.

- පිපිරවීම් ක්‍රමය - තනි විදුම් සිදුර
- විදුම් සිදුරේ ගැඹුර - මීටර් 1.5 ට වඩා අඩු විය යුතුය
- නිෂ්පාදන ධාරිතාවය - මාසික නිෂ්පාදන ධාරිතාවය ඝන මීටර් 600ට වඩා අඩු විය යුතුය
- වායව විදුම් යන්ත්‍ර පමණක් භාවිතා කළ යුතුය

2008 සිට 2011 දක්වා කාල පරිච්ඡේදය තුළ නිකුත් කරනලද කාර්මික කැනීම් බලපත්‍ර පහත සටහනෙහි දැක්වේ.




කාර්මික කැනීම් බලපත්‍ර
ඒ කාණ්ඩය - 111 / බී කාණ්ඩය - 1189 / සී කාණ්ඩය - 1641

### විශේෂිත ඛනිජ බලපත්‍ර (වි. ඛ. බ)

විශේෂිත ඛණිජ ගවේෂණය කිරීම, කැනීම, සැකසීම සහ වෙළඳාම සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව බලපත්‍රයක් ලබා දිය හැකිය.

### (ඈ) වෙළඳ බලපත්‍ර (වෙ. බ.)

බලපත්‍රය ලබා දෙනු ලබන ඛනිජ මිලදී ගැනීමට, ගබඩා කිරීමට සැකසීමට, වෙළඳාම් කිරීමට සහ අධ්‍යක්ෂවරයාගේ විශේෂ අවසරය මත අපනයනය කිරීම සඳහා විශේෂිත නොවන අයිතිවාසිකමක් වෙළඳ පත්‍ර මගින් ලබා දෙනු ලැබේ.

ඒ කාණ්ඩය - ඛනිජ අපනයනය සඳහා අලෙවි කිරීම

බී කාණ්ඩය - ඛනිජ දේශීය වශයෙන් අලෙවි කිරීම

සී කාණ්ඩය - අතින් සකස් කරන ලද ගඩොල් සහ හුණු අලෙවි කිරීම

2008 සිට 2011 දක්වා කාල පරිච්ඡේදය තුළ නිකුත් කරන ලද වෙළඳ බලපත්‍ර පහත සටහනෙහි දැක්වේ.




වෙළඳ බලපත්‍ර

ඒ කාණ්ඩය - 18 / බී කාණ්ඩය - 863 / සී කාණ්ඩය - 00

### (ඇ) ප්‍රවාහන බලපත්‍ර

ඛනිජ ආශ්‍රිත ද්‍රව්‍ය හෝ ඛනිජ ප්‍රවාහනය සඳහා බලපත්‍රයක් ලබා දෙනු ලබන්නේ බලපත්‍රය මගින් නිශ්චිත ලෙස දක්වා ඇති ඛනිජ ප්‍රමාණයක් එසේ දක්වා ඇති යම් කාල පරිච්ඡේදයක් තුළ ප්‍රවාහනය කිරීම සඳහා ය. සියළුම ගවේෂණ, කැනීම් සහ වෙළඳ බලපත්‍ර සඳහා ඛනිජ හෝ ඛනිජ ආශ්‍රිත ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන බලපත්‍රයක් තිබීම අවශ්‍ය වේ.

2008 සිට 2011 දක්වා කාල පරිච්ඡේදය තුළ නිකුත් කරන ලද ප්‍රවාහන බලපත්‍ර පහත දැක්වේ.




ප්‍රවාහන බලපත්‍ර 374,039

### (ඉ) ඛනිජ අපනයනය

සියලුම ගවේෂන, කැනීම් සහ වෙළඳ බලපත්‍රලාභීන් අදාළ බලපත්‍රය ලබා දෙන ලද ඛනිජ අපනයනය කිරීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි අධ්‍යක්ෂවරයාගේ විශේෂ අවසරය ලබා ගත යුතුය.

2008 වර්ෂය සිට 2011 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ නිකුත් කරන ලද අපනයන බලපත්‍ර පහත දැක්වේ.




### රාජ්‍ය භාග ආදායම

ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් එකතු කර ගන්නා ලද රාජ්‍ය භාග ආදායම පහත සටහනෙහි දැක්වේ. රාජ්‍ය භාග ආදායමෙහි සාමාන්‍ය වර්ධනයක් එමගින් පැහැදිලිව පෙන්නුම් කෙරේ.



**පතල් පරීක්ෂා කිරීම තුළින් උපයා ගන්නා ලද ආදායම**

පහත සටහනෙහි දැක්වෙන පරිදි පතල් පරීක්ෂා කිරීම මගින් උපයන ලද ආදායම සීඝ්‍ර වර්ධනය මගින් රටෙහි ඛනිජ කර්මාන්තවල ඇති වී ඇති සීඝ්‍ර වර්ධනය පෙන්නුම් කෙරේ.




## ඛනිජ හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය

2011 වර්ෂය තුලදී කැනීම් බලපත්‍ර ලබාගැනීම

නව අයදුම්පත් 8722 ලැබුණි.

| | |
|---|---|
| ගල්වල | 3017 |
| වැලි | 4911 |
| මැටි | 92 |
| බොරළු | 355 |
| පස් | 04 |
| මැටි සහ වැලි | 26 |
| කැල්සයිට් | 10 |
| මයිකා | 45 |
| තිරුවානා | 80 |
| සිලිකා වැලි | 10 |
| බෝල මැටි | 17 |
| ඩොලමයිට් | 36 |
| පිඟන් මැටි | 10 |
| පොස්පේට් | 01 |
| කළුගල් | 03 |
| ෆෙල්ස්ටාර් | 11 |
| හුණුගල් | 01 |
| මිනිරන් | 04 |
| කැල්සයිඩ් සහ ඩොලමයිට් | 36 |
| තිරුවානා සහ කොල්ස්ටාර් | 41 |
| තිරුවානා සහ පිඟන්මැටි | 01 |
| මුහුදු වැලි | 06 |
| ඛණිජ වැලි | 04 |
| රන් | 01 |
| සාම්පල ලිපි | 60 |
| අපනයන බලපත්‍ර | 582 |

## එක් එක් වර්ෂය තුළ විවිධ ඛනිජ වර්ග සඳහා නිකුත් කරන ලද බලපත්‍ර පිළිබඳ ව්‍යාප්ති සටහන












## ප්‍රාදේශීය කාර්යාල

පතල් අංශය දැනට නුවර, මාතර, කුරුණෑගල, බදුල්ල, රත්නපුරය, අනුරාධපුරය, අම්පාර, මොණරාගල, හම්බන්තොට, ත්‍රිකුණාමලය, කළුතර, යාපනය සහ මඩකලපුව යන ස්ථානවල ක්‍රියාත්මක වන ප්‍රාදේශීය කාර්යාල 13 ක් සමග කටයුතු කරයි. අදාළ පළාත්වල විවිධ පතල් කැනීමේ කර්මාන්තවල නියුතු සේවාදායකයන් සඳහා ඉතා හොඳ සේවයක් සැලසීම සහ නිති විරෝධී පතල් කැනීම් කටයුතු පාලනය කිරීම මෙම ප්‍රාදේශීය කාර්යාලවල ප්‍රධාන කටයුතු වේ.

**කලාපීය ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත කලාපීය කැනීම් ඉංජිනේරුවන් පහත දැක්වේ.**

| ප්‍රාදේශීය කාර්යාලය | ප්‍රාදේශීය ඉංජිනේරුවරයා |
|---|---|
| නුවර, විල්ගමුව සහ මිනිපේ (උප කාර්යාල) | ධම්මික ප්‍රසාද් මහතා |
| කුරුණෑගල | එච්. ඒ. අයි. ජේ. රුද්‍රිගු මහතා |
| මාතර | යූ. එච්. ටී. ප්‍රියන්ත මහතා |
| බදුල්ල | ටී. එම්. ඩබ්ලිව්. බණ්ඩාර මහතා |
| අනුරාධපුරය | කේ. ඒ. එස්. ධර්මසිරි මහතා |
| රත්නපුරය | ටී. එස්. කුමාර මහතා |
| අම්පාර | එච්. කේ. සී. කේ. ඩබ්ලිව්. බණ්ඩාර මහතා |
| මොනරාගල | ඩබ්. ජී. එස්. කෝකිල මහතා |
| හම්බන්තොට | අසේල ප්‍රනාන්දු මහතා |
| ත්‍රිකුණාමලය සහ කන්තලේ (උප කාර්යාල) | කේ. එන්. ඩබ්. කේ. විමලරත්න මහතා |
| මඩකලපුව | එම්. ආර්. එම්. ෆාරිස් මහතා |
| යාපනය | එල්. කරුණානන්දසිවම් මෙනවිය |
| කළුතර | කේ. වී. ජගත් මහතා |

## කැනීම් බලපත්‍ර නිකුත් කිරීම විමධ්‍යගත කිරීම

පතල් කැනීම් බලපත්‍ර නිකුත් කිරීම විමධ්‍යගත කිරීමට කාර්යාංශය තීරණය කළ අතර මූලික පියවර ලෙස ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා ශිල්පීය පතල් කැනීමේ බලපත්‍ර නිකුත් කිරීමේ බලය ප්‍රාදේශීය කළමනාකරුවන්ට සහ කළමනාකරණ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දුන් කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ලබා දෙන ලදී.

කාර්මික කැනීම් බලපත්‍ර - සී කාණ්ඩය නිකුත් කිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩල පහසුකම් සහිත ප්‍රාදේශීය කාර්යාල වලට බලය ලබාදීමටද තීරණය කරන ලදී. දැනට බදුල්ල, රත්නපුරය සහ කළුතර යන ප්‍රාදේශීය කාර්යාල විසින් මෙම ක්‍රමය ක්‍රියාත්මක කර ඇත.

## වැඩමුළු සහ සම්මන්ත්‍රණ

පතල් කැනීමේ කටයුතු හා අදාළ වන ප්‍රධාන කාර්මික ප්‍රශ්න නිරාකරණය කිරීම සහ පතල් හා ඛනිජ පනත ප්‍රකාරව කාර්යාංශය සතු පාලන බලතල ගැන රාජ්‍ය සංවිධාන සහ බලපත්‍ර හිමියන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු සහ සම්මන්ත්‍රණ කිහිපයක් පතල් අංශය විසින් විවිධ දිස්ත්‍රික්ක වල පවත්වන ලදී. මෙම වැඩමුළුවල මූලික අරමුණ වූයේ පතල් හා ඛනිජ පනත ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි වෙනත් රාජ්‍ය ආයතන සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය අතර සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීමයි. පතල් අංශය විසින් පවත්වන ලද වැඩමුළු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ තොරතුරු පහත සඳහන් වේ.

| වැඩමුළුව / දැනුවත් කිරීමේ වැඩසටහන | දිනය | තේමාව |
|---|---|---|
| 1. උමා ඔය ව්‍යාපෘතියෙහි වැඩමුළුව - වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 2011.02.25 | උමා ඔය ව්‍යාපෘතියට හූ විද්‍යා සහ කැනීම් අංශ අදාළ වීම |
| 2. දන්කොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පවත්වන ලද වැඩමුළුව - පොලිස් දෙපාර්තමේන්තුව | 2011.03.22 | කැනීම් කටයුතුවලට අදාළ නීතිමය පැතිකඩ |
| 3. රත්නපුරයේ පවත්වන ලද වැඩමුළුව | 2011.04.27 | වාණිජමය නොවන අරමුණු සඳහා වැලි, පස් සහ බොරළු ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නීතිමය ක්‍රියා පටිපාටිය හඳුන්වා දීම |
| 4. හම්බන්තොට පවත්වන ලද වැඩමුළුව | 2011.05.03 | |
| 5. මොනරාගල පවත්වන ලද වැඩමුළුව | 2011.05.10/ 2011.09.06 | |
| 6. කොළඹ / ගම්පහ පවත්වන ලද වැඩමුළු | 2011.06.03 | |
| 7. මාතර පවත්වන ලද වැඩමුළුව | 2011.09.15 | |
| 8. බදුල්ලේ පවත්වන ලද වැඩමුළුව | 2011.09.16 | |
| 9. කළුතර පවත්වන ලද වැඩමුළුව | 2011.10.03 | |
| 10. කුරුණෑගල පවත්වන ලද වැඩමුළුව | 2011.10.27 | |
| 11. හම්බන්තොට පවත්වන ලද වැඩමුළුව | 2011.11.06 | |
| 12. මධ්‍යම පරිසර අධිකාරියෙහි පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන | 2011.04.23 | OCH ව්‍යාපෘතිය හා සම්බන්ධ පාරිසරික හා සමාජ ගැටළු |
| 13. ගරු අමාත්‍යතුමාගේ සහභාගිත්වය ඇතිව පන්නලදී පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන | 2011.05.10 | කැනීම් බලපත්‍ර නිකුත් කිරීම හා සම්බන්ධ නීතිමය ක්‍රියාපටිපාටිය සහ ප්‍රායෝගික ගැටළු |
| | | මාඔය ගාගංවේ ඉවුරු ප්‍රතිසංස්කරණය කිරීම |
| 14. සී/ස පාරිසරික පදනම ආයතනය සමග ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද වැඩමුළුව | 2011.06.10 | මන්නාරම දිස්ත්‍රික්කය තුළ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් සිදු කරනු ලබන නියාමන කටයුතු |
| 15. මන්නාරම දිස්ත්‍රික්කය තුළ මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන | 2011.08.13 | කැනිම් බලපත්‍ර නිකුත් කිරීමට අදාළ නීතිමය සහ ප්‍රායෝගික ගැටළු |
| 16. ගඩොල් සහ උළු නිෂ්පාදකයන් සඳහා දිවුලපිටියේදී පවත්වන ලද වැඩමුළුව | 2011.08.20 | විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ වැලි කැනීම - මහවැලි නදිය ආශ්‍රිතව |
| 17. විල්ගමුවේදී පවත්වන ලද වැඩමුළුව | 2011.09.08 | පතල් හා ඛනිජ පනතෙහි නීතිමය පැතිකඩ සහ පොලිස් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය |
| 18. මධ්‍යම පරිසර අධිකාරියෙහි පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන | 2011.10.01 | නීති විරෝධී වැලි කැනීම් කටයුතු අවම කිරීම |
| 19. වැලි කැනීම සිදු කරන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන - ගම්පහ දිස්ත්‍රික්කය | 2010.11.15 | |

## අධ්‍යාපනික වැඩසටහන්

### කාර්මික වශයෙන් ගල්පර පිපිරවීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

ශ්‍රී ලංකාවේ ගල්පර පිපිරවීමේ කර්මාන්තය තුළ නිරත වී සිටිනා තාක්ෂණික සහ පරීක්ෂක මට්ටමේ සේවකයන් සඳහා සැලසුම් කරන ලද ගල්පර පිපිරවීම පිළිබඳ ප්‍රථම ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව මධ්‍යම පරිසර අධිකාරියේ සහයෝගය ඇතිව 2011 ජුනි මාසයේදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් පවත්වන ලද අතර මෙය දිගු කලක් තිස්සේ පැවති අවශ්‍යතාවයක් සපුරාලීමක් විය.

මෙම වැඩසටහන වාර්ෂිකව පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර එමගින් පිපිරවීම් ඵලදායිතාවය සහ ආරක්ෂණ තත්ත්වයන් ඉහළ නැංවීම සිදු කෙරෙනු ඇත.

## පතල් පරීක්ෂක කණ්ඩායම

ලියාපදිංචි කිරීම සඳහා ලියාපදිංචි කිරීමේ කාර්යාලය වෙත ලැබුණු අයදුම්පත් සහ නීතිවිරෝධී පතල් කැනීම් කටයුතු පිළිබඳ විවිධ පුද්ගලයන්ගෙන් ලැබුණු පැමිණිලි හා පෙත්සම් වලට අදාළව 2011 වර්ෂය තුළදී කැනීම් ඉංජිනේරුවන් විසින් වැඩබිම් පරීක්ෂා කිරීම් 7722 ක් සිදු කොට තිබේ.

මහජන විරෝධතා එල්ල වූ ගල් වලවල් සම්බන්ධයෙන් පරීක්ෂන පිපිරවීම් 130 ක් සිදු කරන ලදී. අම්පාර, මන්නාරම, ත්‍රිකුණාමලය, මඩකලපුව, හම්බන්තොට සහ මොනරාගල දිස්ත්‍රික්ක වල වැලි කැනීම ආශ්‍රිත ගැටළු සහ ගල්වලවල් සඳහා බලපත්‍ර නිකුත් කිරීම හා සම්බන්ධ විවිධ ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල තුළදී පවත්වන ලදී. විවිධ කැනීම් කටයුතු සඳහා බලපත්‍ර හා අවසරපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ ප්‍රාදේශීය කළමනාකරුවන්, දිස්ත්‍රික් ලේකම්වරුන් අදාල දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු සහ ආයතනවලට අනුයුක්ත වෙනත් නිලධාරීහු මෙම රැස්වීමට සහභාගි වූහ.

වයඹ, සබරගමුව සහ බස්නාහිර පළාත් තුළ වැලි කැනීම සඳහා සුදුසු ස්ථාන සහ ඒවායේ පවතින වැලි ප්‍රමාණයන් හඳුනාගැනීම උදෙසා මහවැලි කළු කැළණි ගංගා වල වැලි ගවේෂණ කටයුතු සිදු කරීම සඳහා ද කැනීම් ඉංජිනේරුවන් සිය සහාය ලබා දුන්හ.

කෙසේ වුවද නීති විරෝධී කැනීම් කටයුතු අවම කිරීම සඳහා පතල් අංශය විසින් වැදගත් පියවර කිහිපයක් ගෙන තිබුණද තවමත් එය නතර කිරීමට නොහැකි වී ඇති බව සඳහන් කිරීම වැදගත්ය. පතල් අංශය විසින් දිගින් දිගටම සිදු කරන ලද ඉල්ලීම් වල ප්‍රතිඵලයක් ලෙස, විශේෂයෙන්ම වැලි කැනීම සිදු කෙරෙනා ප්‍රදේශවල සිදු වන නීති විරෝධී කැනීම් කටයුතු පරීක්ෂා කිරීම සඳහා ක්ෂේත්‍ර සහායකයින් 60 දෙනෙකු බඳවාග ැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අවසරය කාර්යාංශය විසින් ලබා ගන්නා ලදී.

නිත්‍ය පිළිවෙතක් ලෙස සිදු කරනු ලබන ස්ථාන පරීක්ෂා කිරීම් වලට අමතරව, නිත්‍යානුකූල සහ නීතිවිරෝධී කැනීම් කටයුතු පිළිබඳව ලැබෙනා විවිධ පැමිණිලි පිළිබඳව කටයුතු කිරීම සහ දිස්ත්‍රික් ලේකම්වරුන් සමග පවත්වනු ලබන රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ රැස්වීම් සහ විවිධ පරිසර කමිටු සමග පවත්වනු ලබන පතල් කර්මාන්තය සහ සම්බන්ධ සාකච්ඡා සහ පැහැදිලි කරගැනීම් වලට කැනීම් ඉංජිනේරුවරු සහභාගි වූහ.

- 2011 වර්ෂය තුළදී කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි කොරතොට ප්‍රදේශයෙන් සහ මාතලේ ප්‍රදේශයෙන් පතල් කර්මාන්තය ආශ්‍රිතව සිදුවූ විශාල මාරාන්තික අනතුරු දෙකක් පතල් අංශය වෙත වාර්තා වූ බව සඳහන් කළ යුතුය.
- පතල් අංශය විසින් කැනීම් බලපත්‍ර අවලංගු කොට එම මාරාන්තික අනතුරු හා සම්බන්ධ තාක්ෂණික ගැටළු විමර්ශනය කරන ලදී.

## ආරම්භක පාරිසරික පරීක්ෂණ - පාරිසරික බලපෑම් තක්සේරු ව්‍යාපෘති

2011 වර්ෂය තුළදී නියම කරන ලද ව්‍යාපෘති සඳහා විශේෂයෙන්ම ගල්වල් වල විදුම් සිදුරු ගණනාවක් යොදා ගෙන පිපිරවීම් සිදු කරන අවස්ථාවලදී පහත සඳහන් සමාගම් විසින් ඉදිරිපත් කරන ලද ආරම්භක පරිසර පරීක්ෂණ වාර්තා පතල් අංශය විසින් ඇගයීමට ලක් කරන ලදී.

තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පිළියෙල කරන ලද කොන්දේසි නියම කිරීමෙන් අනතුරුව පතල් අංශය විසින් ඉහත ව්‍යාපෘති සඳහා කාර්මික පතල් බලපත්‍ර ඒ කාණ්ඩයට අයත් බලපත්‍ර නිකුත් කර ඇත.

| යෝජිත සමාගමේ නම | යෝජිත ගල්වල වැඩබිම |
|---|---|
| යු. වී. බී. රවින්ද්‍ර | මිල්ලනිය, කළුතර |
| සී/ස චානක මෙට්ල් පුද්ගලික සමාගම | බෙලිඅත්ත, තංගල්ල |
| හම්බන්තොට අන්තර්ජාතික ගුවන්තොටුපොල සංවර්ධන ව්‍යාපෘතිය | හම්බන්තොට |
| සී/ස රුහුණු සංවර්ධන ඉදිකිරීම් සහ ඉංජිනේරු පුද්ගලික සමාගම | වෙලර්සින්නකුලම්, වවුනියාව |
| සී/ස බිස්නස් ප්‍රොමෝටර්ස් ඇන්ඩ් පාට්නර්ස් පුද්ගලික සමාගම | මාමදුව, වවුනියාව |
| සී/ස ප්‍රයිම් ලොජිස්ටික්ස් සර්විස් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම | ඔඩ්ඩුසුඩාන්, මුලතිව් |
| සී/ස මාගා ඉංජිනියරින් පුද්ගලික සමාගම | තතියමලේ, මුලතිව් |
| සී/ස කේ වී ඊබට් ඇන්ඩ් සන්ස් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම | කොවලිකල්ලු, මුලතිව් |
| ඩී. ආර්. ජයසිංහ | තෙබුවන, කළුතර |
| සී/ස තුඩාවේ බ්‍රදර්ස් පුද්ගලික සමාගම | රළපනාව, අනුරාධපුරය |
| සී/ස මාගා ඉංජිනියරින් පුද්ගලික සමාගම | කැබිතිගොල්ලෑව, අනුරාධපුරය |
| ජයසිංහ මෙට්ල් ක්‍රෂර්ස් | පාලුදෙනිය, පොළොන්නරුව |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | උඩවෙල කන්ද, පොළොන්නරුව |
| එස්. ඒ. ආර්. සේනාධීර | තුඩුගල, කළුතර |
| සී/ස කන්සල්ටින් ඉංජිනියරින් ඇන්ඩ් කන්ට්‍රැක්ටර්ස් පුද්ගලික සමාගම | කන්තලේ |

## පශ්චාත් උපාධි අධ්‍යයන සහ පුහුණු වැඩසටහන්

## පශ්චාත් උපාධි අධ්‍යයනය

1. **පී. ඩී. ප්‍රසාද් (කැනිම් ඉංජිනේරු)**

   භූ විද්‍යාව සහ ජල භූ විද්‍යාව පිළිබඳ විද්‍යාශූරී ඉංජිනේරු උපාධිය (පේරාදෙනිය විශ්ව විද්‍යාලය)

2. **කේ. එන්. ඩබ්ලිව්. කේ. විමලරත්න (කැනීම් ඉංජිනේරු)**

   භූ විද්‍යාව සහ ජල භූ විද්‍යාව පිළිබඳ විද්‍යාශූරී ඉංජිනේරු උපාධිය(පේරාදෙනිය විශ්ව විද්‍යාලය)

3. **එච්. කේ. එම්. ගුණසේකර (කැනීම් ඉංජිනේරු)**

   පස් රැඳවුම් ක්‍රමවේදය සහ අත්තිවාරම් සැකසීම පිළිබඳ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාශූරී උපාධිය (මොරටුව විශ්ව විද්‍යාලය)

4. **එච් පී සිරිවර්ධන (කැනීම් ඉංජිනේරු)**

   භූ විද්‍යා තොරතුරු පද්ධතිය සහ දුරස්ථ සංවේදක පිළිබඳ විද්‍යාශූරී පාඨමාලාව(පේරාදෙනිය විශ්ව විද්‍යාලය)

5. **ඩී. මයුරන් (කැනීම් ඉංජිනේරු)**

   පරිසර ඉංජිනේරු විද්‍යාව සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාශූරී විද්‍යාව(මොරටුව විශ්ව විද්‍යාලය)

## වෙනත් කටයුතු

සාමාන්‍ය නියාමන කටයුතුවලට පරිබාහිරව පතල් අංශය විසින් සිදු කරන ලද ප්‍රධාන කටයුතු පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

1. නුවරඑළිය බදුල්ල මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි ගල්පර පිපිරවීම් කටයුතු අධීක්ෂණය කිරීම සඳහා පරීක්ෂන සංචාරයක් 2011 ජනවාරි මස 2 වැනි දින සිදු කරන ලදී.
2. ප්‍රාදේශීය කාර්යාලවලට අදාළ කටයුතු සාකච්ඡා කිරීම සඳහා ප්‍රාදේශීය කළමනාකරුවන්ගේ මාසික රැස්වීම ජනවාරි මස 07 වැනි දින ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලදී.
3. අළුතින් බඳවා ගත් කැනීම් ඉංජිනේරුවන් සහ සහකාර ලේඛකාධිකාරිවරුන් සමඟ ඔවුන්ගේ පුහුණුව සඳහා ක්ෂේත්‍ර සංචාරයක් ලෙස ජනවාරි මස 08 වැනි දින අරුවක්කාරු ගලවල් වෙත සංචාරයක් සිදු කරන ලදී.
4. පරිසර අමාත්‍යාංශයට අනුබද්ධ සියළුම ආයතනවල 2011 වසරට අදාළ කාර්යයන්හි

වැඩසටහන පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ජනවාරි මස 11 සහ 15 වැනි දිනවලදී දින දෙකක වැඩමුළුවක් එක්ටෑඩ් ආයතනයේදී පවත්වන ලදී.

5. පාරිසරික බලපෑම් තක්සේරුව සහ ආරම්භක පාරිසරික පරීක්ෂණ ක්‍රියාපටිපාටියට අදාළ ගැටළු සාකච්ඡා කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ වෙනත් ප්‍රධාන නිලධාරීන් සමග සාකච්ඡාවක් ජනවාරි මස 31 වන දින ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලදී.
6. වාණිජමය නොවන අරමුණු සඳහා වැලි, මැටි සහ බොරළු කැනීම සහ ප්‍රවාහනය සිදු කිරීම සඳහා වන බලපත්‍ර පොත් බෙදා හැරීම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි බලපත් නිකුත් කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර විමධ්‍යගත කිරීම යටතේ ආරම්භ කරන ලදී.
7. 2011 පෙබරවාරි මස 1 වන දින බුත්තල දැයට කිරුළ ප්‍රදර්ශන භූමියට සංචාරය කිරීම - කටයුතු සංවිධානය කිරීම
8. ගම්පහ දිස්ත්‍රික්කයේ මා ඔයහි වැලි කැනීම සිදු කරන පුද්ගලයින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් සහ වැඩමුළුවක් පෙබරවාරි මස 05 වැනි දින සිදු කරන ලදී.
9. හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ යෝජිත කාර්මික කැනීම් බලපත්‍ර ඒ කාණ්ඩයේ ගල්වලවල් නිරීක්ෂණය කිරීම සඳහා පෙබරවාරි මස 15 වන දින හම්බන්තොට දිස්ත්‍රික්කය වෙත ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කරන ලදී.
10. ගම්පොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි වැලි කැනීම් බලපත්‍ර පිළිබඳව ගම්පොල දිස්ත්‍රික්කය වෙත පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා සමග සාකච්ඡාවක් පෙබරවාරි මස 14 වැනි දින පවත්වන ලදී.
11. කොළඹ දිස්ත්‍රික්කය තුළ ගල්වල සහ වැලි කැනීම් කටයුතු වලට අදාළ ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා දිසාපතිවරයා සමග සාකච්ඡාවක් කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මාර්තු මස 14 වැනි දි සිදු කරන ලදී.
12. යෝජිත කාර්මික කැනීම් බලපත්‍ර ඒ කාණ්ඩය යටතේ ගල්වල පරීක්ෂා කිරීම සඳහා කැකිරාව සහ වවුනියාව ප්‍රදේශ වෙත ක්ෂේත්‍ර චාරිකාවක් මාර්තු මස 20 වැනි දින සිදු කරන ලදී.
13. සී/ස පාරිසරික පදනම සමාගමේ අනුග්‍රහය ඇතුව පොලිස් නිලධාරීන් සඳහා වැඩමුළුවක් මාර්තු මස 22 වැනි දින දන්කොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පවත්වන ලදී.
14. විශේෂයෙන්ම උතුරු පළාතේ වනාන්තර ප්‍රදේශ තුළ කැනීම් කටයුතු සඳහා බලපත්‍ර නිකුත් කිරීමට අදාළ ගැටළු සාකච්ඡා කිරීම සඳහා වූ රැස්වීමක් අප්‍රේල් මස 01 වැනි දින වනජීවී දෙපාර්තමේන්තුවේදී පවත්වන ලදී.
15. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි කටයුතු වලට අදාළ ගැටළු සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමා සමග සාකච්ඡාවක් අප්‍රේල් මස 06 වැනි දින පරිසර අමාත්‍යාංශයේදී පවත්වන ලදී.
16. අම්පාර දිස්ත්‍රික්කයේ දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ තිරුවාන කැනීම් සඳහා කාර්මික කැනීම් බලපත්‍ර ලබාගැනීමට ලැබී තිබුණු අයදුම්පත් පිළිබඳව මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේදී සාකච්ඡාවක් අප්‍රේල් මස 07 වැනි දින පවත්වන ලදී.
17. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු අංක එස්. සී. එෆ්. ආර්. 81 ට අදාළ කරුණු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා සී/ස පාරිසරික පදනම සමාගම සමග සාකච්ඡාවක් අප්‍රේල් මස 08 වැනි දින පවත්වන ලදී.
18. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි කටයුතු පිළිබඳව සීලිඩා හි අප්‍රේල් මස 20 වැනි දින පවත්වන ලද මාසික භූ විද්‍යා සමීක්ෂන සම්මේලනයේදී සාකච්ඡාවක් පවත්වන ලදී.
19. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි වර්තමාන තත්ත්වය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා සාකච්ඡාවක් මැයි මස 09 වැනි දින පරිසර අමාත්‍යාංශයේදී පවත්වන ලදී.
20. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි වර්තමාන තත්ත්වය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා සාකච්ඡාවක් ගරු පරිසර අමාත්‍යතුමා සමග මැයි මස 11 වැනි දින භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලදී.
21. ලෝක පරිසර දින වැඩසටහන ගරු පරිසර අමාත්‍යතුමාගේ සහභාගිත්වයෙන් රඹුක්කන පින්නවල මධ්‍ය මහා විද්‍යාලයේදී ජුනි මස 05 වැනි දින පවත්වන ලදී. ගරු කථානායකතුමා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි විය.
22. බලපත්‍ර ක්‍රියා පටිපාටිය සඳහා වඩාත් සරල සහ පහසු ක්‍රමවේදයක් නිර්මාණය කිරීම සහ අදාළ බලපත්‍ර පිළියෙල කිරීම පිළිබඳව සාකච්ඡාවක් පරිසර අමාත්‍යාංශයේ අතිරේක ලේකම් හෙම්මත මහතා සමග ජුනි මස 07 වැනි දින දී පවත්වන ලදී.
23. පිපිරවීම් පාඨමාලාවට සහභාගි වන පුද්ගලයන්ට පුහුණු වැඩසටහනක් පැවැත්වීම සඳහා ජුනි මස 11 වැනි දින ගම්පහ මල්වාන හොවියල් ගල්වල වැඩ භූමියට ක්ෂේත්‍ර සංචාරයක් සිදු කරන ලදී.
24. නීතිවිරෝධී කැනීම් කටයුතු පිළිබඳව ගරු අමාත්‍යතුමා වෙත සිදු කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වයඹ පළාතේ දුම්මලසූරිය සහ ගල්ගමුව යන ප්‍රදේශවලට ජූලි මස 02 වැනි දින ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කරන ලදී.

25. ඩී ජයසිංහ මහතා විසින් ජුලි මස 17 වැනි දින ඉදිරිපත් කරන ලද මූලික පරිසර ඇගයීම් වාර්තාව ඇගයීමට ලක් කිරීම පිණිස කළුතර නෙබුවන ප්‍රදේශයට සංචාරයක් සිදු කරන ලදී.
26. මනම්පිටිය ප්‍රදේශයේ වැලි කැනීම ආශ්‍රිත පාරිසරික සහ සමාජ ගැටළු හඳුනාගැනීම පිණිස පොළොන්නරුව මනම්පිටිය ප්‍රදේශයට ජුලි මස 29 වැනි දින ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කරන ලදී.
27. පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සියළුම ආයතනවල ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කිරීම පිණිස ගරු පරිසර අමාත්‍යමාගේ සහභාගිත්වය ඇතිව ජුලි මස 30 සහ 31 දිනවලදී වරකාපොළ නගරයේදී මධ්‍ය වාර්ෂික ප්‍රගති සමාලෝචන රැස්වීම පවත්වන ලදී.
28. සී/ස කේ වී ඒ ඊබට් සමාගම විසින් ඉදිරිපත් කරන ලද කාර්මික කැනිම් බලපත්‍ර 'ඒ' කාණ්ඩයේ බලපත්‍ර අයදුම්පත්‍ර පිළිබඳව සහ මන්නාරම දිස්ත්‍රික්කයේ වැලි කැනීම් කටයුතු පිළිබඳව විමර්ශනය කිරීම සඳහා අගෝස්තු මස 06 වැනි දින මන්නාරම සහ මුලතිවු යන ප්‍රදේශ වෙත ක්ෂේත්‍ර චාරිකාවන් සිදු කරන ලදී.
29. කැනීම් සහ පරිපාලන කටයුතු වලට අදාල ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා අගෝස්තු මස 14 සහ 15 වැනි දින යාපනය ප්‍රාදේශීය කාර්යාලය වෙත අධීක්ෂණ සංචාරයක් සිදු කරන ලදී.
30. සී/ස මාගා ඉංජිනියරින් සමාගම සහ කුමාරම් බ්‍රදර්ස් යන සමාගම් විසින් කාර්මික කැනීම් බලපත්‍ර ඒ කාණ්ඩය සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍ර පරීක්ෂා කිරීම සඳහා අගෝස්තු මස 21 වැනි දින මැදවච්චිය - කැබිතිගොල්ලෑව ප්‍රදේශ වෙත ක්ෂේත්‍ර සංචාරයක් සිදු කරන ලදී.
31. පොළොන්නරුව මනම්පිටිය ප්‍රදේශයේ වැලි කැනීම් කටයුතු සහ මහවැලි නදිය ඔස්සේ ඉවුරු ප්‍රතිසංස්කරණ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා සැප්තැම්බර් මස 01 වැනි දින ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කරන ලදී.
32. කඩුවෙල රණාල ප්‍රදේශයේ පිහිටුවීමට යෝජිත කොරියන් ගල් ඇඹරීමේ යන්ත්‍රාගාරය පිළිබඳව ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ඉදිරිපත් කරන මූලික පරිසර ඇගයීම් වාර්තාව පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා සැප්තැම්බර් මස 07 වැනි දින රැස්වීමක් පවත්වන ලදී.
33. දැයට කිරුළ වැඩසටහන හා අදාළ කටයුතු සංවිධානය කිරීම සඳහා අනුරාධපුරයේ තන්තිරිමලේ ප්‍රදේශයට සැප්තැම්බර් මස 17 වන දින නිල සංචාරයක් සිදු කරන ලදී.
34. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට අදාල කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා සැප්තැම්බර් මස 23 වන දින පාර්ලිමේන්තුවේ කෝප් කමිටුවේ රැස්වීමක් පවත්වන ලදී.

## මූල්‍ය සමාලෝචනය

**පසුගිය අවුරුදු 5 තුළ කාර්යාංශයේ සමස්ත පිරිවැටුම පහත දැක්වේ.**

| විස්තර | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| සමස්ත පිරිවැටුම (රු.මිලියන) | 256 | 347 | 463 | 668 | 862 |




## භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ආදායම් උත්පාදනය

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ආදායම් උත්පාදනය ප්‍රධාන වශයෙන්ම පහත සඳහන් ක්‍රියාවලීන් 04 ඔස්සේ සිදු වේ.

1. මැණික් සහ ඛනිජ තෙල් සම්පත් හැර රටේ පවතින වාණිජ වෙළඳ භාණ්ඩ පිළිබඳ සියළුම කැනීම් කටයුතු නියාමනය කිරීම (බලපත්‍ර ගාස්තු, පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රාජ්‍ය භාගය ලෙස සාරාංශගත කර ඇත.)
2. භූ විද්‍යාත්මක හා භූ භෞත විද්‍යාත්මක පර්යේෂණ කටයුතු, සිදුරු විදීම් ඇතුළු සේවාදායක ඉල්ලීම් මත විවිධ ව්‍යාපෘති සිදු කිරීම සහ විද්‍යාගාර සේවා (ව්‍යාපෘති සහ විද්‍යාගාර සේවා ලෙස සාරාංශගත කර ඇත.)
3. භූ විද්‍යා සිතියම්, පොත්පත්, වාර්තා සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් අනාවරණය කරගනු ලබන පෙනත් තොරතුරු අලෙවි කිරීම
4. නිදර්ශක අපනයනය පරිපාලනය කිරීම (වෙනත් යටතේ සාරාංශගත කර ඇත.)

අර්ධ රාජ්‍ය ආයතනයක් වන භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ප්‍රධාන වශයෙන්ම ජාතියට සේවා සපයන ආයතනයක් ලෙස කටයුතු කරයි. සැලසුම්කරුවනට, කළමනාකරුවනට සහ සාමාන්‍ය මහජනතාව වෙත අපක්ෂපාතී විද්‍යාත්මක තොරතුරු භූ විද්‍යා සිතියම් සැපයීම මගින් ජාතියට භූ විද්‍යාත්මක හැකියාව ලබා දීම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි සේවාවන් තුළට ඇතුළත් වේ. අනිකුත් වැදගත්ම සේවය ලෙස කැනීම් කටයුතු පිළිබඳ සමස්ත පරිපාලනය සිදුකිරීම දැක්විය හැකිය. ඛනිජ හිමියන්ට තිරසාර ලෙස ප්‍රයෝජනයට ගත හැකි ලෙස ඛනිජ තැන්පතු තිබීම අවශ්‍ය වන හෙයින් ඛනිජ කර්මාන්තය හරහා සිදු කෙරෙන ආයෝජනයන් සාමාන්‍යයෙන් කෙටි කාලීන වේ. එමගින් ගම්‍ය වනුයේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සතුව අඛණ්ඩ හෝ නිරන්තර සේවාදායකයන් කැනීම් අංශයේ කිසියම් විශේෂිත ඛනිජ වෙළඳ ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් නොමැති බවයි.

## භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ප්‍රාථමික මෙහෙයුම් කටයුතු

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි මූලික කටයුතු භූ විද්‍යා සහ කැනීම් යන ප්‍රධාන අංශ දෙක මගින් සිදු කරනු ලබන අතර එක් එක් අංශය නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු යටතේ ක්‍රියාත්මක වේ. භූ විද්‍යා සිතියම් සැකැස්ම සහ ඛනිජ ගවේෂණය ප්‍රධාන වශයෙන්ම භූ විද්‍යා අංශය විසින් සිදු කරනු ලබන අතර කාර්යාංශය විසින් සිදු කරනු ලබන නියාමන කටයුතු සිදු කරනු ලබන්නේ පතල් අංශය විසිනි. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි තාක්ෂණික කටයුතු සිදු කිරීම සඳහා සහාය වීමට විශේෂයෙන්ම අදාළ ප්‍රදේශවල කැනීම් කටයුතු පාලනය කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාල 13 ක් ඇත. සාමාන්‍යාධිකාරිවරයාගේ පාලනය යටතේ පවතින පරිපාලන හා මූල්‍ය අංශය සහ නීති අංශය විසින් ප්‍රධාන අංශ දෙකට අවශ්‍ය සහාය ලබා දෙනු ලැබේ.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ආදායම ප්‍රධාන වශයෙන්ම උත්පාදනය කරනු ලබන්නේ ප්‍රධාන අංශ දෙක වන භූ විද්‍යා අංශය සහ පතල් අංශය විසිනි. සේවාදායකයන්ගේ මුදල් යොදාගෙන සිදු කරනු ලබන ගවේෂණ වැඩසටහන්, පර්යේෂණ ව්‍යාපෘති, විද්‍යාගාර කටයුතු, ප්‍රකාශන අලෙවිය සහ පුස්තකාල සේවා සහ අපනයන නියැදි සැකසීම තුළින් මූලික වශයෙන්ම භූ විද්‍යා අංශය ආදායම උත්පාදනය කරනු ලබන අතර බලපත්‍ර නිකුත් කිරීම, රාජ්‍ය භාගය අය කිරීම, පරීක්ෂන පිපිරවීම් ඇතුළු ක්ෂේත්‍ර පරීක්ෂණ කිරීම් යනාදී නියාමන කටයුතු වලින් පතල් අංශය ආදායම උපයා ගනු ලැබේ.

## ප්‍රධාන අංශ වලින් ලැබෙන ආදායම

| ප්‍රධාන අංශ | ආදායම් උත්පාදන මාර්ග | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|
| භූ විද්‍යා අංශය | විද්‍යාගාර ආදායම ව්‍යාපෘති ආදායම<br>ප්‍රකාශන අලෙවිය<br>නිදර්ශක අපනයනය | 36.9 | 45.4 | 36.5 |
| පතල් අංශය | රාජ්‍ය භාගය, බලපත්‍ර ගාස්තු<br>පරීක්ෂණ කිරීම් ගාස්තු<br>පරීක්ෂණ පිපිරවීම් ආදායම<br>කැනීම් ආපසු ගෙවීම්<br>කාර්යාල ගාස්තු<br>කැනීම් ආදායම සුළු | 418.93 | 619.0 | 816.0 |




## සේවා සංකේන්ද්‍රණය

| විස්තර | 2009/10 | 2010/11 | 2011/12 |
|---|---|---|---|
| වැඩිම ආදායමක් ලැබෙන සේවාවෙන් ලද ආදායම රාජ්‍ය භාගය | 463 | 668 | 862 |




## වෙළඳපොල සංකේන්ද්‍රණය

| විස්තර | 2009 | 2010 | 2011 |
|---|---|---|---|
| විශාලතම අංශයෙන් ලද ආදායම | පතල් අංශය 419 | පතල් අංශය 619 | පතල් අංශය 816 |

## සේවාදායක සංකේන්ද්‍රණය

| විස්තර | 2009 | 2010 | 2011 |
|---|---|---|---|
| ප්‍රධාන සේවාදායකයන් තිදෙනාගෙන් ලද ආදායම (රු. මිලියන) | 90 | 84 | 118 |




### 2009 - ප්‍රධාන සේවාදායකයන්

සී/ස ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගම, මධ්‍යම සංස්කෘතික අරමුදල

සී/ස සිලෝන් ක්වාට්ස් එම්. බී. අයි. පුද්ගලික සමාගම

### 2010 - ප්‍රධානතම සේවාදායකයන්

සී/ස ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගම

සී/ස සිලෝන් ක්වාට්ස් පුද්ගලික සමාගම

සී/ස බෝගල ග්‍රැෆයිට් සමාගම

### 2011 - ප්‍රධාන සේවාදායකයන්

සී/ස ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගම

සී/ස සිලෝන් ක්වාට්ස් එම් බී අයි පුද්ගලික සමාගම

සී/ස බෝගල ග්‍රැෆයිට් පුද්ගලික සමාගම

## පරිපාලන සමාලෝචනය

**නව බඳවා ගැනීම් :** භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි තාක්ෂණික කටයුතු සඳහා සහාය වීම සඳහා විශේෂයෙන්ම අදාළ ප්‍රදේශවල කැනීම් කටයුතු කළමනාකරණය කිරීම සඳහා පසුගිය වසර 3 තුළ තවත් ප්‍රාදේශීය කාර්යාල හතක් විවෘත කරන ලදී. එහෙයින් වැඩිපුර කැනීම් ඉංජිනේරුවන් බඳවා ගනු ලැබූ අතර විශේෂයෙන්ම වැලි කැනීම සිදු කරනු ලබන ප්‍රදේශ වල සිදු වන නීති විරෝධී කැනීම් කටයුතු පරීක්ෂා කිරීම සඳහා ක්ෂේත්‍ර සහායකයින් 60 දෙනෙකු බඳවා ගනු ලැබුණි.

**වැටුප් වර්ධක :** තම රාජකාරි ඉලක්ක සපුරා ගැනීමේදී එක් එක් සේවකයන් විසින් පෙන්නුම් කරනු ලබන ප්‍රගතිය වාර්ෂික වැටුප් වර්ධක ප්‍රදානය කිරීමේදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ඇගැයීමට ලක් කරනු ලැබේ.

**උසස් වීම් :** සෑම සේවා කාණ්ඩයක් තුළම පුරප්පාඩු පිරවීමට සහ සුදුසු අයදුම්කරුවන්ට අදාළ තනතුරුවලට උසස්වීම් ලබා දීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි කළමනාකාරීත්වය විසින් අවශ්‍ය පියවර ගනු ලැබේ.

**ශ්‍රේණි වලට උසස් කිරීම :** කාර්යසාධනයන්, සුදුසුකම් වැඩි දියුණු කර ගැනීම හා ප්‍රායෝගික අත්දැකීම් ලබාගැනීම සහ ආයතනයේ දියුණුව වෙනුවෙන් දක්වන දායකත්වය සහ කැපවීම මත පදනම්ව තම ශ්‍රේණිවලට අදාළ උසස්වීම් ලබාගැනීමට සේවකයනට අවස්ථාව ඇත.

**කාර්යසාධනය තක්සේරු කිරීම, ත්‍යාග ප්‍රදානය සහ සේවක අභිප්‍රේරණය කිරීම :** භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි සියළුම ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයන් හට කාර්යසාධනය සහ පැමිණීම මත පදනම්ව විශේෂ වාර්ෂික දිරි දීමනාවක් ලබා දෙනු ලැබේ. පසුගිය වසර 3 තුළ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි සේවකයන් හට මෙම දිරිදීමනා වැඩසටහන හරහා සැලකිය යුතු අමතර ආදායමක් ලබාගැනීමට හැකි විය. වෙනත් වචන වලින් කිවහොත් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ප්‍රගතිය උදෙසා සේවකයන් දක්වන දායකත්වය පිළිගැනීමට ලක් කිරීම මෙමගින් සිදු කෙරේ.

**සේවක සුභසාධනය සහ සමාජීය කටයුතු :** නිවාස ණය සහ වාහන ණය වැනි අමතර ප්‍රතිලාභ සඳහා සේවකනට හිමිකම ඇත. තම දැනුම වර්ධනය කර ගැනීම සඳහා කියවීමට සේවකයන් දිරිගැන්වීම සඳහා සෑම වසරකම සැප්තැම්බර් මාසයේදී (සාහිත්‍ය මාසයේදී) පොත් මිලදී ගැනීම සඳහා දීමනාවක් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි සේවකයන් සඳහා ලබා දෙනු ලැබේ. තම දරුවන් සඳහා පාසල් බෑග් සහ සපත්තු මිලදී ගැනීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි සියලුම සේවකයන් හට අළුත් අවුරුදු නිවාඩු කාලය තුළදී ප්‍රධාන පෙලේ බෑග් සහ සපත්තු නිෂ්පාදකයන් වෙතින් තෑගි වවුචර ලෙස දීමනාවක් ලබා දෙනු ලැබේ. මීට අමතරව සේවකයන්ගේ පාසල් දරුවන් හට එක් එක් දරුවාගේ පාසලේ ඉගෙනුම ලබන ශ්‍රේණියේ අවශ්‍යතාවයන්ට අනුව අභ්‍යාස පොත් සහ ලිපිද්‍රව්‍ය ද ලබා දෙනු ලැබේ.

**වාර්ෂික සම්මාන උළෙල :** භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි සේවකයන්ගේ එක් එක් කාණ්ඩයට අයත් සේවකයන් අතුරින් හොඳම සේවකයාට වාර්ෂිකව සම්මාන ප්‍රදානය කිරීම පසුගිය අවුරුදු 3 පුරාවට සිදු කර ඇත.







**රියදුරන් සඳහා නිල ඇඳුම් :** භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි සියලුම රියදුරන් වෙත ඔවුන් විසින් ඉටු කරනු ලබන සේවයට අනුග්‍රහය දැක්වීමක් ලෙස රාජකාරි නිල ඇඳුම් ලබා දෙනු ලැබේ.

**සෞඛ්‍යය සහ ආරක්ෂාව :** සියලුම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි සේවකයනට තමාට වෛද්‍ය ගාස්තු ලෙස දැරීමට සිදුවූ වියදමෙන් (වෛද්‍ය උපදෙස් ගාස්තු සහ ඖෂධ ගාස්තු 85%) ක් දක්වා වෛද්‍ය වියදම් (බාහිර රෝගී ප්‍රතිකාර) නැවත ලබාගැනීමට සුදුසුකම් ඇත. මේ සඳහා එවැනි වියදමක් දැරීමට සිදු වූ බවට අවශ්‍ය සාක්ෂි (බිල්පත් ආදිය) ඉදිරිපත් කළ යුතුය.

### මානව සම්පත් සංවර්ධනය සඳහා ආයෝජනය

| | 2010 රු. මිලියන | 2011 රු. මිලියන |
|---|---|---|
| විදේශ | 1.7 | 0.6 |
| දේශීය | 0.3 | 0.6 |
| මුළු එකතුව | 2.0 | 1.2 |

### 2011 දෙසැම්බර් මස 31 දිනට කාර්යමණ්ඩල සංයුතිය

| කාණ්ඩය | කළමනාකරණ | විධායක | වෙනත් |
|---|---|---|---|
| ජාතික | 05 | 94 | 163 |
| මුළු එකතුව | | | 262 |

### ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත විභේදනය - 2011 දෙසැම්බර් 31 දිනට

| සේවක කාණ්ඩය | පුරුෂ | ස්ත්‍රී | මුළු එකතුව |
|---|---|---|---|
| කළමනාකරණ | 04 | 01 | 05 |
| විධායක | 55 | 39 | 94 |
| වෙනත් | 109 | 54 | 163 |
| මුළු එකතුව | 168 | 94 | 262 |

## නීතිමය අංශයේ කාර්යසාධනය

කාර්යාංශයට එරෙහිව සහ කාර්යාංශය විසින් පවරනු ලබන නඩු වලදී කාර්යාංශය නියෝජනය කිරීම නීති අංශයට අයත් කාර්යයන් වලට ඇතුළත් වේ. කාර්යාංශය විසින් පවරනු ලබන නඩු යම් යම් ප්‍රදේශවල සිට කරනු ලබන අනවසර කැනීම් කටයුතු සහ කැනීම් කටයුතු සිදු කරන ලද ස්ථාන පිළිසකර නොකිරීම යන කරුණු මත පදනම් වේ. අධිකරණයේ විභාග වීමට නියමිත නඩු 16 ක් විය.

(ශ්‍රේෂ්ඨාධිකරණය,අභියාචනාධිකරණය,මහාධිකරණය, දිසා අධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණය සහ මානව හිමිකම් කොමිෂන් සභාව)

අනවසර කැනීම් කටයුතු වල නිරත වූ පුද්ගලයන්ට එරෙහිව අළුතින් නඩු 5 ක් පවරන ලදී.

හම්බන්තොට සහ කුරුණෑගල විශේෂ කාර්ය බලකා කඳවුරු වලදී පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් සඳහා ද කටාන පොලිස් විද්‍යාලය, කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ මධ්‍යම පරිසර අධිකාරියේදී පොලිස් නිලධාරීන් සඳහා ද පතල් හා ඛණිජ පනත සහ පතල් හා ඛනිජ ආශ්‍රිත නීතිමය ගැටළු පිළිබඳ එම නිලධාරීන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

පතල් හා ඛනිජ පනත සඳහා සංශෝධන කෙටුම්පත් කර ඇති අතර පරිසර අමාත්‍යාංශයේ නිරීක්ෂණ ලබා ගැනීම සඳහා ඒවා එම අමාත්‍යාංශයට යොමු කර ඇත.

පතල් හා ඛනිජ පනතේ නියෝග සඳහා ''සංශෝධන'' අවසන් කිරීමට කටයුතු කර ඇති අතර ඒ සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයේදී සාකච්ඡා කිහිපයක් පවත්වා ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු අංක 81/2004 මගින් නියෝග කරන ලද පරිදි මහ ඔය නදියේ වැලි පවතීද යන කරුණ සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කිරීම සඳහා අදාල පාර්ශ්වකරුවන් සමග භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේදී සාකච්ඡාවක් පවත්වන ලදී. ඒ අනුව පළමු අදියර 2011.07.07 දින ඔතර වාඩිය සිට බම්බුකුලිය දක්වා ආරම්භ කරන ලදී. වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, පළාත් පරිසර අධිකාරිය (වයඹ පළාත) සහ සී/ස පාරිසරික පදනම සමාගම යන ආයතන සමග අදාල ගැටළු සම්බන්ධයෙන් නීතිමය අංශය සම්බන්ධීකරණය විය.

ප්‍රධාන කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලෙන් එම කාර්යාලය ඉවත් කිරීමට අදාල ගැටළුව සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගැනීම සඳහා එම කරුණ එම දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

මෙම ගැටළුව සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේදී සාකච්ඡා කිහිපයක් පවත්වන ලද අතර එම කරුණට අදාල නීතිමය අවශ්‍යතා සපුරාලීම සඳහා නීති අංශය විසින් කළමනාකාරිත්වයට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලදී.

ප්‍රාදේශීය කාර්යාල පිහිටි ස්ථාන වල හිමිකම් ඔප්පු අදාල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලවලදී පරීක්ෂා කොට ප්‍රාදේශීය කාර්යාල 14 සඳහා අදාල කල් බදු ගිවිසුම් සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ව්‍යාපෘති, ඛණිජ විමර්ශන ඒකකය, ප්‍රවේශ ආරක්ෂක සේවා, ආරක්ෂක සේවා හා වාහන ගිවිසුම්වලට අදාළ නොතාරිස්මය නොවන ගිවිසුම්, පිළියෙල කොට ක්‍රියාත්මක කරන ලද අතර අවශ්‍ය උපදෙස් ද ලබා දෙන ලදී.

කළමනාකාරිත්ව මණ්ඩලයේ රැස්වීම් පවත්වා කාර්ය සටහන් පිළියෙල කොට කළමනාකාරිත්ව මණ්ඩලයේදී පවත්වන ලද සාකච්ඡා වලට අනුකූලව පසු විපරම් කටයුතු සිදු කරන ලදී.

# මූල්‍ය වාර්තාව

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

## ආයතනික තොරතුරු

### පොදු

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය 1992 අංක 33 දරණ පනත මගින් පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් වන අතර එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 04, සේනානායක ගොඩනැගිල්ල, ගාලු පාර, දෙහිවල යන ලිපිනයෙහි පිහිටා ඇත.

### ප්‍රධාන කටයුතු

- ශ්‍රී ලංකාවේ ක්‍රමානුකූල භූ විද්‍යා සිතියම් කටයුතු සිදුකිරීම සඳහා භාර ගැනීම සහ භූ විද්‍යා සිතියම් සකස් කිරීම
- ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් හඳුනාගෙන තක්සේරු කිරීම
- එවැනි ඛනිජ සැකසීම සහ අපනයනය සම්බන්ධයෙන් වාණිජමය වශයෙන් ඇගයීමට ලක් කිරීම
- ඛනිජ ගවේෂණය, කැනීම සහ සැකසීම විධිමත් කිරීම සහ එවැනි ඛනිජ සඳහා බලපත්‍ර නිකුත් කිරීමෙන් පසු අපනයනය කිරීම
- ඛනිජමය පදනමකින් ඛනිජ නිස්සාරණය සහ ඛනිජ නිදවීම ප්‍රවර්ධනය කිරීම සඳහා යොදා ගත යුතු සම්පත් පිළිබඳ ගරු අමාත්‍යතුමාට උපදෙස් දීම

### සේවක සංඛ්‍යාව

වසර අවසානය වන විට සිටි ස්ථිර සේවකයන් සංඛ්‍යාව 262 ක් විය.

## පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

### පොදු

### අනුකූලතා ප්‍රකාශනය

කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම, සංකල්ප සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නියම කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ය.

### පිළියෙල කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ ඓතිහාසික පිරිවැය සම්මුතිය පාදක කරගෙනය. ගිණුම්වලට බලපාන්නා වූ උද්ධමන සාදක පිළිබඳව කිසිදු ගැලපීමක් කර නැත. ව්‍යතිරේකයන් ඇති හැමවිටම සහ යෝග්‍ය සෑම තැනකදීම යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සටහන්වල අනාවරණය කර ඇත.

### සාර්ථක ව්‍යාපාරයක්

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ''සාර්ථක ව්‍යාපාරයක්'' යන්න භාවිතා කිරීම සාධාරණීකරණය කිරීම සඳහා තම කාර්යයන් සිදුකරගෙන යාමේදී භාවිතා කළ හැකි ප්‍රමාණවත් සම්පත් කාර්යාංශය සතුව තිබෙන බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

### සංසන්දනාත්මක තොරතුරු

පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීම සමග අනුගත වන ලෙස සංසන්දනාත්මක තොරතුරු අවශ්‍ය ස්ථානවලදී නැවත වර්ගීකරණය කර ඇත.

### වත්කම් සහ ඒවා අගය කිරීමේ පදනම්

### ලැබිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම් පෙන්වා ඇත්තේ ඇස්තමේන්තු ගත උපලබ්ධි අගය මත ය.

## භාණ්ඩ ලේඛන

භාණ්ඩ ලේඛන අගය කිරීම සිදු කර ඇත්තේ අඩුම පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධිගත අගය මතය. මෙහිදී පිරිවැයකරණය මුළු මිලදී ගැනීමේ පිරිවැයට සීමා කොට ඇති අතර මිලදී ගැනීමට සම්බන්ධ සියළුම වියදම් එය තුළ අන්තර්ගත වේ.

## ආයෝජන

ආයෝජන පිරිවැය මත දක්වනු ලැබේ.

## දේපළ පිරියත සහ උපකරණ

දේපළ පිරියත හා උපකරණ පිරිවැය හෝ සමුච්චිත ක්ෂයවීම් අඩු කළ වටිනාකම මත දක්වා ඇත.

වත්කමක, පිරියතෙහි සහ උපකරණයක පිරිවැය තුළට එය මිලදී ගත් මිල සහ අපේක්ෂිත ප්‍රයෝජනය ලබාගැනීමට සුදුසු ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒමට එකී වත්කම වෙනුවෙන් දරන ලද කිසියම් සෘජු වියදමක් වේ නම් එය ඇතුළත් වේ.

වත්කම් ප්‍රයෝජනයට ගත හැකි යැයි ගණනය කර ඇති කාලපරිච්ඡේදය මත සරල රේඛා පදනමින් දේපල පිරියත හා උපකරණ ක්ෂයවීම් පහත දැක්වේ.

| | ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය | වසරකට අනුපාතය |
|---|---|---|
| ගොඩනැගිලි | 5 | 20% |
| පිරියත සහ යන්ත්‍ර | 8 | 12.5% |
| මෝටර් රථ | 5 | 20% |
| ගෘහභාණ්ඩ සහ උපාංග | 10 | 10% |
| කාර්යාල උපකරණ | 5 | 20% |
| ක්ෂේත්‍ර උපකරණ | 5 | 20% |
| සිතියම් උපකරණ | 5 | 20% |
| සන්නිවේදන | 8 | 12.5% |
| පුස්තකාල පොත් / සිතියම් | 5 | 5% |

ඉඩම් සඳහා ක්ෂය කිරීම් දක්වා නොමැත. දේපල වසර තුළදී මිලදී ගත් දේපල පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් සම්පූර්ණ ක්ෂය වීම් දක්වා ඇත.

## දේපල, පිරියත සහ උපකරණ බදු දීම

අයිතිය හා සම්බන්ධ අවදානම් තත්ත්ව හා ප්‍රතිලාභ සියල්ල ප්‍රමාණවත් ලෙස ලබා දෙන මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබා ගන්නා දේපළ එම අදාළ දේපලෙහි මුදල් වටිනාකම මත ප්‍රාග්ධනීකෘත කරනු ලැබේ. එලෙස මුදල් කල්බදු යටතේ ලබාගන්නා දේපළද වෙනත් දේපල, පිරියත හා උපකරණ වල ක්ෂය කිරීම් සිදු කරන අනුපාතයටම ක්ෂය කිරීම් කරනු ලැබේ.

## මුදල් හා මුදල් සමතුලයයන්

මුදල් හා මුදල් සමතුල්‍යයන් ගණයට අත ඇති මුදල් බැංකු තැන්පත් හා ඒක්ෂණ තැන්පතු අඩංගු වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් හා මුදල් සමතුල්‍යයන් ගණයට අත ඇති මුදල්, බැංකුවල ඇති ඒක්ෂණ තැන්පතු, ගෙවීමට ඇති බැංකු අයිරා ඇතුළත් වේ.

## බැරකම් හා ප්‍රතිපාදන

### ප්‍රතිපාදන

වගකීම් මගින් සම්පත් පිටතට ගලා යෑමක් සිදු විය හැකි නම් සහ එසේ පිටතට ගලා යන සම්පත් ප්‍රමාණය පිළිබඳව විශ්වාසනීය තක්සේරුවක් සිදු කළ හැකි නම් ශේෂපත්‍ර දිනට පවතින සියළු වගකීම් සම්බන්ධයෙන් ප්‍රතිපාදන සකස් කරනු ලැබේ.

## නිශ්චිත සුභසාධන සැලසුම - පාරිතෝෂික

1983 අංක 12 දරණ පාරිතෝෂික පනත යටතේ විශ්‍රාම පාරිතෝෂික ගෙවීමට ප්‍රතිපාදන සකස් කොට ඇත. අවුරුදු 5ක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කළ පසු සේවකයෙකුට මෙම හිමිකම ලැබේ.

## සේවක භාරකාර අරමුදල සහ සේවක අර්ථසාදක අරමුදල සඳහා නිශ්චිත දායකත්වය සැලසුම්

අදාළ ව්‍යවස්ථා හා රෙගුලාසි ප්‍රකාරව සේවකයන් සේවක අර්ථසාදක අරමුදලට හා සේවකයන්ගේ භාරකාර අරමුදලට දායක වීමට සුදුසුකම් ලබයි. කාර්යාංශයවිසින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවකයන්ගේ භාරකාර අඑමුදලට සේවකයා ලබන මුළු වැටුපෙන් පිළිවෙලින් 12% සහ 3% ක් දායක මුදල් සපයයි.

# ආදායම් ප්‍රකාශ

## ආදායම හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභ කාර්යාංශය වෙත ලැබීම සහ ආදායම සහ ඒ ආශ්‍රිතව සිදු කරන ලද හෝ සිදු කිරීමට ඇති වියදම් විශ්වාසනීය ලෙස මැනිය හැකි මට්ටම අනුව ආදායම හඳුනාගනු ලැබේ.

ලැබෙනා ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකම මත ආදායම ගණනය කරනු ලැබේ. ආදායම හඳුනාගැනීම සඳහා පහත සඳහන් නිශ්චිත නිර්ණායක භාවිතා කරනු ලැබේ.

**(අ) සේවා සැපයීම**

සේවා සැපයීම තුළින් ලබා ගන්නා ආදායම සේවා සපයන හෝ එය ලබා දෙන කාලපරිච්ඡේදය තුළ ඇති ගිණුම් තුළ හඳුනා ගනු ලැබේ.

**(ආ) පොළිය**

පොළී ආදායම හඳුනාගනු ලබන්නේ එකතු වීමේ පදනම මත ය.

**(ඇ) වෙනත්**

ආයෝජනද ඇතුළුව, දේපල, පිරියත සහ උපකරණ සහ වෙනත් ජංගම නොවන වත්කම් විකිණීමකදී ලැබෙනා ආදායමක ශුද්ධ ලාභ සහ අලාභ එම දේපළ විකිණීමේදී ලද මුදලින් වත්කමෙහි ධාරණ පිරිවැය සහ විකිණීම ආශ්‍රිත වෙනත් වියදම් අඩු කොට ගිණුම්ගත කරනු ලැබේ.

**(ඈ) රාජ්‍යභාග ආදායම**

රාජ්‍ය භාගය යටතේ ලද ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කර ඇත.
කිසියම් වර්ෂයකට අදාළ රාජ්‍ය භාගය ඊළඟ වසරේදී අප්‍රේල් 20 වැනි දින දක්වා ගෙවීමට පතල් සහ ඛනිජ පනත මගින් අවසර ලබා දේ. ප්‍රකාශනය සිදු කරන තුරු රැජ්‍ය භාගය නිශ්චිතව දැන ගත නොහැකි හෙයින් මේ සම්බන්ධයෙන් විධිවිධාන සකසනු නොලැබේ. රෙගුලාසි සම්බන්ධයෙන් 2006 වසරේදී සිදු කරන ලද සංශෝධනය මගින් රාජ්‍ය භාගයේ අත්තිකාරමක් ලබා ගැනීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට අවසර ලබා දෙන ලදී. බලපත්‍ර කාලපරිච්ඡේදය අවසන් වන විට නොගෙවා ඇති රාජ්‍ය භාගය පියවීම සඳහා මෙම අත්තිකාරම් භාවිතා කළ හැකිය. නැතහොත් සම්පූර්ණ මුදලම ආපසු ගෙවිය යුතුය.

## වියදම්

අදාළ වර්ෂය සඳහා ලාභය ගණන් බැලීමේදී ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම ලෙස නඩත්තු කරමින් ව්‍යාපාරය සිදු කරගෙන යාමේදී සිදු කරන ලද සියළුම වියදම් ආදායමෙන් අඩු කරනු ලැබේ.

## මුදල් ප්‍රවාහය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අංක 9 ට අනුකූලව වක්‍ර ක්‍රමය යොදාගෙන කාර්යාංශයේ මුදල් ප්‍රවාහය ඉදිරිපත් කර ඇත.

- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

## බදුකරණය

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ආයතනික බදුවලින් නිදහස් කර ඇත.

## පශ්චාත් ශේෂපත්‍ර සිදුවීම්

ශේෂපත්‍ර දිනට පසුව සිදුවන සියළු භෞතික සිදුවීම් සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි, ගැලපීම් සිදු කිරීම හෝ මූල්‍ය ප්‍රකාශන වලට අනාවරණය කිරීම සිදු කරනු ලැබේ.

## ආදායම් හා වියදම් ප්‍රකාශනය
## 2011 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන මාස 12 සඳහා

| | | සටහන | රු. | 2011 දෙසැම්බර් 31 දක්වා රු. | 2010 දෙසැ. 31 දිනෙන් අවසන් වන රු. |
|---|---|---|---|---|---|
| **ආදායම** | | | | | |
| 1 | භාණ්ඩාගාර ප්‍රදාන | | | 0.00 | 0.00 |
| 2 | රාජ්‍ය භාගය -2011 | 1 | | 596,030,750.29 | 453,574,365.58 |
| 3 | බලපත්‍ර ගාස්තු | 2 | | | |
| ගවේෂණ | | | 1,352,000.00 | | 1,797,000.00 |
| කාර්මික | | | 23,514,100.00 | | 16,372,000.00 |
| වෙන් කරන ලද බණිජ | | | 7,835,250.00 | | 6,570,250.00 |
| ශිල්පීය කැනීම් | | | 4,796,400.00 | | 4,780,000.00 |
| වෙළඳාම | | | 2,910,000.00 | | 3,005,000.00 |
| ප්‍රවාහනය | | | 36,131,365.98 | 76,539,115.98 | 25,098,750.00 |
| 4 | පරීක්ෂා කිරීම් ගාස්තු | | | 126,769,543.19 | 95,192,635.00 |
| 5 | විද්‍යාගාර ආදායම | 3 | | 1,102,964.29 | 1,065,437.50 |
| 6 | ව්‍යාපෘති ආදායම | 4 | | 33,951,570.37 | 42,908,551.14 |
| දළ ආදායම | | | | 834,393,944.12 | 650,363,989.22 |
| 7 | වෙනත් මෙහෙයුම් ආදායම | 5 | | 27,410,498.06 | 17,299,354.34 |
| වියදම් | | | | | |
| 1 | භූ විද්‍යා | 6 | 23,353,804.37 | | 21,643,578.08 |
| 2 | සිතියම්ගත කිරීම | 7 | 6,343,832.92 | | 8,741,300.60 |
| 3 | ව්‍යාපෘති | 8 | 15,584,127.85 | | 25,044,703.50 |
| 4 | ප්‍රාදේශීය කාර්යාල | 9 | 66,794,068.63 | | 51,783,251.54 |
| 5 | කැනීම් | 10 | 30,825,167.84 | | 30,667,482.02 |
| 6 | පරිපාලන | 11 | 200,351,116.88 | 343,252,118.49 | 160,203,189.69 |
| මෙහෙයුම් වියදම් ඉක්මවූ ආදායම | | | | 518,552,323.69 | 369,579,838.13 |
| පොළී ආදායම | | 12 | | 99,997,092.75 | 99,924,184.81 |
| අදාළ කාලපරිච්ඡේදය තුළ බදුවලට පෙර වියදම ඉක්මවූ ආදායම | | | | 618,549,416.44 | 469,504,022.94 |
| බදු | | | | 0.00 | 0.00 |
| අදාළ කාලපරිච්ඡේදය තුළ බදුවලට පසු වියදම ඉක්මවූ ආදායම | | | | 618,549,416.44 | 469,504,022.94 |

## ශේෂ පත්‍රය
## 2011 දෙසැම්බර් මස 31 දිනට

| වත්කම් | සටහන | 2011 දෙසැ. 31 දිනට රු. | 2010 දෙසැ. 31 දිනට රු. |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | 13 | | |
| ඉඩම - වැට ගැසීම | | 18,129,625.42 | 13,660,864.40 |
| ඉඩම - යක්කල | | 35,588,016.41 | 35,588,016.41 |
| ඉඩම - බත්තරමුල්ල | | 61,277,986.36 | 55,241,300.00 |
| ඉඩම - ඔරුගොඩවත්ත | | 130,476,702.62 | 130,476,702.62 |
| ගොඩනැගිලි බෙදා වෙන් කිරීම | | 234,339.73 | 380,745.50 |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | | 6,728,803.33 | 6,969,540.53 |
| මෝටර් රථ | | 97,472,416.84 | 131,335,725.22 |
| සිතියම් උපකරණ | | 4,822,644.70 | 5,767,919.84 |
| විදුම් උපාංග | | 6,908,934.23 | 8,237,608.69 |
| විද්‍යාගාර උපකරණ | | 54,498,117.42 | 47,562,102.55 |
| ක්ෂේත්‍ර උපකරණ | | 5,227,411.95 | 6,892,707.31 |
| කාර්යාල උපකරණ | | 35,480,387.12 | 37,922,351.04 |
| සන්නිවේදන උපකරණ | | 895,113.56 | 784,920.56 |
| ගෘහභාණ්ඩ සහ උපාංග | | 3,611,262.93 | 3,746,773.14 |
| සිතියම් | | 287,092.09 | 315,370.85 |
| පොත් - පුස්තකාල | | 16,279,966.14 | 13,801,264.48 |
| ශුද්ධ ජංගම නොවන වත්කම් | | 477,918,820.85 | 498,683,913.14 |
| **ආයෝජන** | | | |
| ආයෝජන | | 4,000,000.00 | 4,000,000.00 |
| විදේශ සංචිත ජී එස් එන් මධ්‍යස්ථානය | | 5,974,799.94 | 5,949,056.40 |
| විදේශ සංචිත වී සැට් චන්ද්‍රිකා සවි කිරීම | | 567,502.67 | 537,502.67 |
| යෝජිත ජී පී ආර් / ඊ ආර් පී පද්ධතිය | | 301,000.00 | 0.00 |
| | | 10,843,302.61 | 10,486,559.07 |

| ජංගම වත්කම් | සටහන | 2011 දෙසැ. 31 දක්වා රු. | 2010 දෙසැ. 31 දක්වා රු. |
|---|---|---|---|
| තොග - ලිපිද්‍රව්‍ය | | 1,749,156.31 | 2,385,413.03 |
| තොග - ලෝහ භාණ්ඩ | | 3,741,840.82 | 3,337,412.88 |
| තොග - විද්‍යාගාර පොත් / සිතියම් | | 485,084.96 | 617,110.69 |
| ණයගැතියෝ | 14 | 21,239,715.51 | 22,468,378.39 |
| ණයගැතියන් - චෙක්පත් ආපසු එවීම් | | 271,732.91 | 153,065.54 |
| ණයගැතියන් - සී/ස ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් සමාගම | | 1,770,886.33 | 1,273,869.97 |
| පූර්ව ගෙවීම් | 15 | 3,162,468.56 | 2,929,006.57 |
| කාර්ය මණ්ඩල ණය - 1 | 16 | 34,284,435.44 | 33,021,079.75 |
| කාර්ය මණ්ඩල ණය - 2 | | 8,200.00 | 8,200.00 |
| උත්සව අත්තිකාරම් | 17 | 210,750.02 | 213,983.34 |
| විශේෂ අත්තිකාරම් | 18 | 8,250.00 | 15,000.00 |
| අත්තිකාරම් - කාර්ය මණ්ඩලය | 19 | 1,656,101.96 | 1,637,051.96 |
| අත්තිකාරම් - මිලදී ගැනීම් | 20 | 286,514.00 | 2,784,774.00 |
| අත්තිකාරම් සහ ණය - බී ගිණුම | | 208,775.26 | 208,775.26 |
| ගොඩනැගිලි තැන්පතු | | 1,600,000.00 | 1,600,000.00 |
| ගොඩනැගිලි තැන්පතු ශාඛා | | 1,366,000.00 | 100,000.00 |
| නැවත ගෙවිය යුතු තැන්පතු | | 256,500.00 | 221,500.00 |
| බදු කුලී අත්තිකාරම් | | 4,895,416.56 | 1,794,416.56 |
| පොත් - බලපත්‍ර | | | 290,090.65 |
| තැන්පතු | 21 | 897,049,667.02 | 1,225,772,455.42 |
| ලංකා බැංකුව - ජංගම ගිණුම | | 1,207,497.00 | 9,243.08 |
| කොමර්ෂල් බැංකුව - ජංගම ගිණුම | | 136,537.87 | 209,282.90 |
| සම්පත් බැංකුව - ජී එස් එන් මධ්‍යස්ථානය | | 1,286,645.22 | 1,415,089.25 |
| සම්පත් බැංකුව - ජංගම ගිණුම | | 580,777.59 | 1,191,129.18 |
| මහජන බැංකුව - මාතර | | 153,519.27 | 340,324.99 |
| මහජන බැංකුව - ජංගම ගිණුම | | 414,012.03 | 75,619.53 |
| මහජන බැංකුව - ජංගම ගිණුම - (ගාලු පාර ශාඛාව) | | 650,189.62 | 4,122,514.06 |
| ලැබිය යුතු පොලී | 22 | 11,719,810.78 | 22,264,535.34 |
| මුද්දර අග්‍රිමය - 1 | | 460.00 | 460.00 |
| මුදල් - 1 | | 5,383.65 | 12,000.00 |
| **මුළු වත්කම්** | | **1,479,168,452.15** | **1,839,642,254.55** |

| **ස්කන්ධ සහ වගකීම්** | **සටහන** | **2011 දෙසැ. 31 දක්වා රු.** | **2010 දෙසැ. 31 දක්වා රු.** |
|---|---|---|---|
| ඒකාබද්ධ අරමුදල | 23 | 27,652,883.05 | 27,652,883.05 |
| දෙපාර්තමේන්තු අරමුදල | 24 | 1,746,725.68 | 1,746,725.68 |
| ප්‍රාග්ධන අරමුදල | 25 | 68,916,655.00 | 68,916,655.00 |
| විදේශ ප්‍රදාන | 26 | 1,984,210.00 | 1,984,210.00 |
| මහා භාණ්ඩාගාරයට මාරු කර යැවීම් | | (1,622,749,478.70 ) | (622,749,478.70) |
| වියදම ඉක්මවූ පසු ආදායම (ඉදිරියට ගෙන ආවා) | | 2,097,804,976.70 | 1,662,806,787.53 |
| වියදම ඉක්මවූ පසු ආදායම | | 618,549,416.44 | 469,504,022.94 |
| | | 1,193,905,388.17 | 1,609,861,805.50 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සඳහා ලබා දීම් | 27 | 27,769,919.63 | 24,068,711.26 |
| **ජංගම වගකීම්** | | | |
| ණයහිමියන් | 28 | 6,777,347.15 | 8,779,964.65 |
| ගෙවිය යුතු ඊ පී එෆ් / ඊ ටී එෆ් | 29 | 1,220,092.42 | 1,180,575.15 |
| ගෙවිය යුතු අත්තිකාරම් | 30 | 42,082.20 | 42,082.20 |
| ජී එස් එන් මධ්‍යස්ථානය සඳහා අත්තිකාරම් | 31 | 5,897,095.42 | 5,781,581.98 |
| අයි ඊ ඊ ආර් සඳහා අත්තිකාරම් | 32 | 6,278,776.30 | 5,345,476.30 |
| ව්‍යාපෘති සඳහා අත්තිකාරම් | 33 | 4,458,601.80 | 267,656.11 |
| රසායනික විශ්ලේෂණය සඳහා අත්තිකාරම් | | 200,118.50 | 38,962.50 |
| ඉදිරිපත් නොකළ චෙක්පත් | | 150,332.25 | |
| ලැබුණු වෙනත් අත්තිකාරම් | | 20,751.43 | 5,111.43 |
| පුනරුත්ථාපන / ආපසු ගෙවිය යුතු තැන්පතු | | 245,595.52 | 244,735.52 |
| ගෙවිය යුතු වැට් / ආරම්භක සේවා ගාස්තු / WHT | | 11,914,048.61 | 1,307,977.13 |
| රාජ්‍ය භාගය මත අත්තිකාරම් | | 128,693,341.95 | 99,981,452.51 |
| කැනීම් බලපත්‍ර මත අත්තිකාරම් | 34 | 80,147,644.62 | 72,860,052.25 |
| උපචිත | 35 | 11,447,316.18 | 9,876,110.06 |
| **මුළු ස්කන්ධ හා වගකීම්** | | 1,479,168,452.15 | 1,839,642,254.55 |

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### සටහන 01 - රාජ්‍ය භාගය

මෙය 2011 වසරට අදාළව එකතු කරන ලද රාජ්‍ය භාගය වේ. 2006 වසරේදී රෙගුලාසිවල සිදු කරන ලද වෙනස්කම් ප්‍රකාරව රාජ්‍ය භාගය මත අත්තිකාරම් අය කළ යුතු වේ. නොගෙවන ලද රාජ්‍ය භාගය පියවීමට මෙම අත්තිකාරම් යොදා ගත හැකි අතර නැතහොත් එය ආපසු ගෙවිය යුතුය.

### සටහන 02 - බලපත්‍ර ගාස්තු

මෙය බලපත්‍ර නිකුත් කිරීම මගින් ලද ආදායම වේ.

### සටහන 03 - විද්‍යාගාර ආදායම

මෙය නිදර්ශන පරීක්ෂා කිරීම සහ රසායනික විශ්ලේෂණය මගින් ලද ආදායම වේ.

### සටහන 04 - ව්‍යාපෘති ආදායම

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් භාර ගන්නා ලද ව්‍යාපෘති මගින් ලද ආදායමේ වටිනාකම් මෙමගින් පෙන්නුම් කෙරේ.

| | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|
| අපනයන ආයෝජන ව්‍යාපෘතිය - සීගිරිය | 0.00 | 20,824,508.86 |
| ව්‍යාපෘතිය - අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ අධිකාරිය | 0.00 | 374,107.00 |
| ව්‍යාපෘතිය - කළු ගඟ | 5,955,557.90 | 2,021,176.50 |
| ව්‍යාපෘතිය - පුනරින් | 0.00 | 2,019,086.00 |
| ව්‍යාපෘතිය - ලංකා පටුන | 0.00 | 993,398.10 |
| ව්‍යාපෘතිය - තිරුක්කෝවිල් | 0.00 | 1,458,872.68 |
| ව්‍යාපෘතිය - භෞත පුනරින් | 0.00 | 284,000.00 |
| ව්‍යාපෘතිය - ගාල්ල | 0.00 | 4,353,942.00 |
| ව්‍යාපෘතිය - එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | 0.00 | 10,579,460.00 |
| ව්‍යාපෘතිය - පස් තාක්ෂණ (භූ භෞත ගවේෂණ) | 273,900.00 | |
| ව්‍යාපෘතිය - මාදම්පේ | 551,662.50 | |
| ව්‍යාපෘතිය - උප්පුතරවයි | 1,707,358.06 | |
| ව්‍යාපෘතිය - පරිකන්මඩු | 1,055,348.80 | |
| ව්‍යාපෘතිය - තලෙයිමන්නාරම (ඩී ඒ පෙරේරා) | 1,679,623.50 | |
| ව්‍යාපෘතිය - හලාවත - වයික්කාල | 1,314,823.75 | |
| ව්‍යාපෘතිය - අච්චිමලේ | 7,908,595.00 | |
| ව්‍යාපෘතිය - කෝකිලායි - (පුල්මුඩේ) | 3,464,870.50 | |
| ව්‍යාපෘතිය - කෙයොලින් ගවේෂණය | 7,780,683.16 | |
| ව්‍යාපෘතිය - තලෙයිමන්නාරම (සුප්‍රිම්) | 2,259,147.20 | |
| | 33,951,570.37 | 42,908,551.14 |

## සටහන 05 - වෙනත් මෙහෙයුම් ආදායම

| ආදායම් වර්ගය | ප්‍රමාණය | ප්‍රමාණය |
|---|---|---|
| පරීක්ෂණ පිපිරවීම් ආදායම | 2,863,175.00 | 2,651,250.00 |
| ප්‍රකාශන අලෙවි කිරීමෙන් ලද ආදායම | 679,911.54 | 990,443.34 |
| පෝස්ටර් විකිණීම | 0.00 | 1,480.00 |
| පතල් කැනීම් ආපසු ගෙවීම් (CGS) | 356,675.00 | 68,787.50 |
| ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම් | 773,600.20 | 429,206.45 |
| අපනයන නිදර්ශක ආදායම | 92,348.91 | 80,351.60 |
| සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 118,500.00 | 41,000.00 |
| ආපදා ණය මත පොලි | 1,331,375.01 | 1,314,150.73 |
| විවිධ ආදායම් | 5,214,205.49 | 843,120.20 |
| විවිධ ආදායම් - කැනීම් | 13,350,706.91 | 9,824,564.52 |
| උපකරණ කුලියට දීම | 630,000.00 | 1,055,000.00 |
| ලාභාංශ ආදායම - සටහන 5 ඒ | 2,000,000.00 | 0.00 |
| | **27,410,498.06** | **17,299,354.34** |

## සටහන 5 ඒ - ලාභාංශ ආදායම

## වියදම්

## සටහන 6 - භූ විද්‍යා කටයුතු පිළිබඳ වියදම්

| ගිණුම් වර්ගය | භූ විද්‍යා | සුනාමි | පුස්තකාල | විද්‍යාගාර | මුළු එකතුව රු. 2011 | මුළු එකතුව රු. 2010 |
|---|---|---|---|---|---|---|
| වැටුප් | 7,463,717.27 | | 445,819.66 | 2,449,374.41 | 10,358,911.34 | 10,545,449.91 |
| දීමනා | 1,897,911.41 | | 162,640.65 | 593,248.40 | 2,653,800.46 | 3,252,040.27 |
| ඊ පී එෆ් | 887,524.73 | | 53,498.35 | 293,471.61 | 1,234,494.69 | 1,269,973.20 |
| ඊ ටී එෆ් | 222,572.70 | | 13,374.58 | 73,367.88 | 309,315.16 | 317,493.27 |
| වැටුප් | 1,465,048.18 | | 55,125.00 | 455,956.09 | 1,976,129.27 | 297,850.00 |
| අතිකාල | 378,997.35 | | 57,775.45 | 9,210.12 | 445,982.92 | 522,419.50 |
මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම වලදී ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ඉදිරිපත් කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණන විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ලං.ගි.ප්‍ර) වලට අනුකූල නොවීම්

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත වලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී. ලං.ගි.ප්‍ර. 18 | ධාරණ අගය ශූන්‍ය අගයක් ගන්නා ස්ථාවර වත්කම් පැවතියද එම වත්කම් වල ප්‍රත්‍යාගණනය කළ වටිනාකම හෝ දළ වටිනාකම ගිණුම්ගත කල යුතු වුවද ඊ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී. ලං.ගි.ප්‍ර. 36 | කාර්යාංශයට එරෙහිව විභාග වෙමින් පවතින නඩු 11 ක් සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම් කර නොතිබුණු අතර ණයගැතියන්ට අදාළ බොල්ණය හා අඩමාන ණය සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. |

#### 2.2.2 ගිණුම් තැබීමේ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රාග්ධනිත කළයුතු රු. 1,526,360 ක වාහන වියදම් පුනරාවර්තන වියදම් ලෙස කපා හැරීම හේතු කොට ගෙන එම ප්‍රමාණයෙන් වර්ෂයේ අතිරික්තය අඩුවී තිබුණි.

(ii) ඉදිරි වර්ෂයට අදාලව ගෙවන ලද රු. 200,000 ක ගොඩනැගිලි කුලී සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 2.2.3 නොසැසඳුනු පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා උපයෝගි ලේඛණ උපලේඛන අනුව ශේෂ සැසදීමේදි පහත සදහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

| විෂයය | අවසන් ගිණුම් අනුව ශේෂය | උපලේඛණ/උපයෝගි ලේඛන අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| රාජ්‍ය භාග | 596,030,750 | 586,889,029 | 9,141,721 |
| රාජ්‍ය භාග මත අත්තිකාරම් | 28,711,809 | 31,653,235 | 2,941,426 |
| **බලපත්‍ර ගාස්තු** | | | |
| කාර්මික | 23,514,100 | 23,538,500 | 24,400 |
| වෙළඳ | 4,796,400 | 4,760,000 | 36,400 |
| ප්‍රවාහන | 36,131,366 | 39,073,510 | 2,942,144 |
| පරීක්ෂණ ගාස්තු | 128,153,743 | 128,415,955 | 262,212 |
| කැනීම් විවිධ ආදායම් | 16,214,284 | 16,368,834 | 154,550 |
| පිපිරවීම් ආදායම් | 2,863,175 | 2,894,000 | 30,825 |
| එකතුව | 836,415,627 | 833,593,063 | 15,533,678 |

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) මුළු ණයගැති වටිනාකම වූ රු. 21,239,716 ත් කාල විශ්ලේෂණයට අනුව වසර 05 ක් ඉක්ම වූ ණයගැති වටිනාකම රු. 1,216,195 ක් වූ අතර රු. 6,777,347 ක් වූ ණයහිමියන් ගෙන් වසර 03 ට වැඩි ණයහිමි ශේෂය රු.308,364 ක් හා වසර 05 වැඩි ණයහිමි ශේෂය රු.195,950 කි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී කැනීම් මත බලපත්‍ර ගාස්තු අත්තිකාරම් ලෙස දක්වා තිබූ රු.80,147,645 ක් එම අත්තිකාරම් පියවීම් සමඟ සැසදීම් කර නොතිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවස්ථා 12 කට අයත් එකතු වටිනාකම රු.245,575,045 ක් වූ ගනුදෙනු වලට අදාලව විස්තරාත්මක උපලේඛන, භාණ්ඩ සමීක්ෂණ වාර්තා, ශේෂ සනාථ කිරීම් කාල විශ්ලේෂණ ගණනය කිරීමේ විස්තර, ඉන්වෙන්ට්‍රි ලේඛන, සුළු මුදල් වවුචර, කුලී ගිණුම් ආදී සාක්ෂි නොතිබීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය/ සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 2.2.6 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මු.රෙ.අංක 104 (4) | සමාලෝචිත වර්ෂයේදී වාහන 25 කට හානි සිදු වී තිබුණු නමුත් අලාභ හානි පිළිබඳ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | මු .රෙ 135 | කාර්යාංශය විසින් මුදල් පාලනය සම්බන්ධ රාජකාරි කිපදෙනෙකු අතර බෙදී යන ආකාරයට පවරාදී නොතිබු අතර දෛනිකව මුදල් එකතු කිරීම , බැංකුගත කිරීම එකම නිලධාරියෙකු විසින් සිදු කර තිබුණි. |
| (iii) | මු.රෙ.අංක 144 | දෛනික මුදල් සේප්පුගත කිරීම හා දෛනික මුදල් භාරයේ තබා ගැනීම මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණය සහ නිර්දේශ යටතේ සිදු විය යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. |
| (iv) | මු.රෙ.අංක 177 | දෛනිකව එකතු වන මුදල් කාල ප්‍රමාදයකින් තොරව බැංකුගත කළ යුතු වුවද අවස්ථා 15 කට අදාලව රු.3,567,252 ක මුදලක් දින 2- 4 ත් අතර කාල ප්‍රමාදයක් පැවතුණි. |

| | | |
|---|---|---|
| (v) | මු.රෙ. 454 (1) | ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (vi) | මු.රෙ. අංක 763 | පාවිච්චි කරන ලද උප පත්‍රිකා පොත්, බලපත්‍ර, භර පත්‍ර, භාණ්ඩ ඇනවුම් පොත් ඉන්ධන ඇනවුම් පොත් පිළිබඳ අභ්‍යන්තර පාලනය ශක්තිමත් වන අයුරින් ගබඩා පර්පාටියක් සකස් කර නොතිබුණි. |
| (vii) | මු.රෙ. අංක 1647 (ඇ) | වාහන ද ඒවායේ උපකරණ පිළිබදවද සම්පූර්ණ සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවත් එසේ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| (viii) | 1994 ජුනි 14 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 95 හි 2 ඡේදය | භාණ්ඩාගාරය විසින් නිශ්චිතවම අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක් සේවකයින්ට ගෙවීමට හැකිවුවද එම විධි විධාන වලට පටහැනිව පාලක මණ්ඩලයේ අනුමැතිය ඇතිව පමණක් දිරි දීමනා හා ප්‍රසාද දීමනා වශයෙන් රු. 31,243,031ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. |
| (ix) | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිකුත් කළ 2009 ජනවාරි 08 දිනැති චක්‍රලේඛ අංක 56/05/2008 (භාවිතා කරන ලද ප්‍රවාහන බලපත්‍ර ආපසු කාර්යාංශය වෙත භාරගැනීම.) | නව බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම් කරන අවස්ථාවේදි පාවිච්චි කරන ලද ප්‍රවාහන බලපත්‍ර ආපසු භාර දිය යුතුය.නමුත් එසේ ආපසු භාර නොදෙන ප්‍රවාහන බලපත්‍ර සඳහා දඩ මුදලක් අයකිරීම කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. |
| (x) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක 17 හා 2003 ඔක්තෝබර් 28 දින දරණ චක්‍රලේඛණය | රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන සහ රජයට අයත් සමාගම් වල නිලධාරීන් එම ආයතනවල මුදල් පාවිච්චි කර අධ්‍යයන / පුහුණු / සම්මන්ත්‍රණ ආදිය සඳහා විදේශ සංචාරවල යෙදෙන්නේ නම් ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත් විදේශ |

ගතවූ නිලධාරීන් 09 දෙනෙකු එසේ කටයුතු කර නොතිබුණි. අදාළ අයදුම් පත්‍රය ගරු අග්‍රාමාත්‍යතුමාගේ හෝ අමාත්‍යතුමාගේ පූර්ව අවසරය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.7 මත භේදයට තුඩුදෙන ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

අධ්‍යක්ෂ මණ්ඩලයට වෙනත් දීමනා සඳහා හිමිකම් නොමැති වුවද, කලමනාකරණ මණ්ඩලය නියෝජනය කරන නිලධාරීන් 05 දෙනෙකුට රු. 800,000 ක මුදලක් "ගරු ගෙවීමක්" ලෙස දීමනා ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය.

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය රු. 618,549,416ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ රු. 469,504,023 ක් වූ අතිරික්තය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.149,045,393 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

ඉහත සඳහන් මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය කෙරෙහි රාජ්‍ය භාග ආදායම රු.මිලියන 142.45 කින්, පරීක්ෂණ ගාස්තු රු. මිලියන 31.57 කින්, කාර්මික බලපත්‍ර ආදායම රු: මිලියන 07 කින් හා වෙනත් මෙහෙයුම් ආදායම රු. මිලියන 10 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආදායම් හා වියදම්

පෙර වර්ෂය හා සාපේක්ෂව මුළු ආදායම සමාලෝචිත වර්ෂය තුළදී රු.194,214,007 කින් හෙවත් 25.3% වැඩිවීමක් පෙන්නුම් කෙරේ.

### 3.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

| ද්‍රවශීලතා අනුපාත | සම්මත අනුපාතය | වර්ෂය 2011 | 2010 |
|---|---|---|---|
| ජංගම අනුපාතය | 2:1 | 3.85:1 | 6.46:1 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 1:1 | 3.82:1 | 6.44:1 |

ඉතා ඉහල ද්‍රවශීල අනුපාතයක් නිරීක්ෂණය වන අතර අතිරික්ත අරමුදල් ඵලදායි ආයෝජනවල යොදා නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යය සාධනය

මේ පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ක්‍රියාකාරකම් කිසිවකට අදාළව මූල්‍ය ප්‍රගතිය විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ආ) ක්‍රියාකාරකම් 5 කට අදාළව භෞතික ප්‍රගතිය ඉදිරිපත් කර නොතිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බලපත්‍රයක් නිකුත් කළ කාර්යාලය හෝ එය ව්‍යාජ බලපත්‍රයක්ද යන්න තහවුරු කර ගැනීමට හැකි පරිදි දත්ත සමුදායක් පවත්වාගෙන ගොස් නොතිබූ අතර හා කාර්යාල අතර ජාල සම්බන්ධතාවයක්ද ස්ථාපිත කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා මුදල් කොමිසම විසින් 2010 මැයි 31 දිනැතිව නිකුත් කර ඇති අංක SP/SB/03/10 චක්‍රලේඛ ලිපිය මගින් රාජ්‍ය ආයතන e-Government Policy ක්‍රියාත්මක කළ යුතු බව දක්වා තිබුණද කාර්යාංශය විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. මෙහි කෙටි කලකින් නිම කළ හැකි කාර්යයක් නොවන අතර මේ සම්බන්ධයෙන් වූ වාර්තාව ඉදිරි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට යොමු කරන බව සභාපති දැනුම් දී ඇත.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ මහජන පැමිණිලි 4212 ක් ලැබී තිබූ අතර ක්‍රියාමාර්ග ගෙන තිබූ පැමිණිලි සංඛ්‍යාව 56 ක් පමණි. තවද එක් එක් පැමිණිල්ලට අදාල පැහැදිලි තොරතුරු ප්‍රධාන කාර්යාලය විසින් පවත්වාගෙන නොයාම නිසා පැමිණිල්ලට අදාළව අඛණ්ඩ තොරතුරු තබා ගැනීමට හා පසු විපරම් කිරීමට හැකියාවක් නොතිබුණි.

(ඇ) කොළඹ, මීගමුව, හෝමාගම, මීරිගම, කළුතර, දෙහිවල, කඩුවෙල, නිට්ටඹුව, කුරුණෑගල, බණ්ඩාරගම, නාත්තන්ඩිය, කොච්චිකඩේ, මාරවිල, වෙන්නප්පුව, දංකොටුව ,නොර්චෝලෙ, ආනමඩුව හා ත්‍රිකුණාමලය යන ප්‍රදේශ වලට අයත් පුනරුත්ථාපනය නොකල ඉඩම් 42 ක් නැවත යථාතත්වයට පත් නොකිරීම සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි.

(ඉ) ලබා දෙන ලද බලපත්‍ර මත ගවේෂණ කැනීම් කළ ඉඩම් පුනරුත්ථාපනය සඳහා ලබා ගන්නා බැංකු ඇපකර හා නිසි පරිදි භාවිතා නොකිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ඇපකර අදාල කාරණය | ඇපකරයේ වටිනාකම<br>රු. | නිරීක්ෂණ |
|---|---|---|
| කැනීම් ස්ථාන 12 කට අදාලව | 1,040,000 | බැංකු ඇපකර වල වලංගු කාලය ඉක්මයාමට පෙර ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු කර ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගත යුතු වුවද කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |
| කැනීම් ස්ථාන 30 කට අදාලව | 3,680,000 | බැංකු ඇපකර වලංගු කාලය ඉක්මවීමට මසකට පෙර ප්‍රාදේශීය කාර්යාලවලට ඉදිරිපත් කර තිබුණද අදාල ඉඩම් පරීක්ෂා කර නොතිබුණි. |
| කැනීම් ස්ථාන 42 කට අදාලව | 4,720,000 | බැංකු ඇපකර වලංගු කාලය ඉක්මයාමට පෙර කාර්යාංශය විසින් පවරා ගැනීමට පියවර ගත යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. |
| කැනීම් ස්ථාන 03 කට අදාලව | - | බැංකු ඇපකර වලට අදාල ක්ෂේත්‍ර පරීක්ෂණ නිරීක්ෂණ අනුව අත්හිටුවන ලද බැංකු ඇපකර සම්බන්ධ ඇපකර කාර්යාංශය වෙත පවරා ගැනීමට හෝ ඉඩම් පුනරුත්ථාපනය කිරීමට පියවර ගෙන නොතිබුණි. |

## 4.3 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජන වත්කම්

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) 2007 වර්ෂයේදී ඔරුගොඩවත්ත ප්‍රදේශයෙන් ඉඩමක් මිලදී ගැනීම සහ එහි ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා මුල්ගල තැබීමේ සමාරම්භක උළෙල වෙනුවෙන් රු. 130,476,703 ක් වැය කර ඇතත්, එම කාර්යය අත්හැර දමා තිබුණි.

(ආ) 2010 වර්ෂයේදී බත්තරමුල්ල ප්‍රදේශයෙන් තිස් අවුරුදු බදු පදනම මත නාගරික සංවර්ධන අධිකාරියෙන් තවත් ඉඩමක් මිලදී ගැනීම වෙනුවෙන් රු. 55,241,300 ක් වැය කර තිබුණද, එහි කිසිදු ඉදිකිරීම් කාර්යක් ආරම්භ කර නොතිබුණි. තවද රු.1,200,000ක මුදලකට ඉංජිනේරු සේවා සැපයීම සඳහා ගිවිසුමකට එළඹ තිබූ අතර එයින් රු. 600,000 ක් ගෙවීම් කර තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට කාර්යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 381 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 262 ක් විය. තනතුරු 119 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු පිරවීමකින් තොරව, භූවිද්‍යාඥයන්, ලිපිකරුවන්, කැණීම් ඉංජිනේරුවරුන්, රියදුරන්, ක්ෂේත්‍ර සමීක්ෂණ සහකාරවරුන්, මිලදී ගැනීමේ නිලධාරීන්, තාක්ෂණික නිළධාරීන්, කා.කා.ස, ආදී තනතුරු සඳහා 12% ක වැට් ප්‍රතිශතයක් ඇතුළත් කර තාක්ෂණික සේවා සමාගමකින් කුළී පදනම මත ලබා ගත් සේවාවන් වෙනුවෙන් රු.16,193,362 ක් සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබුණි.

(ආ) කාර්යාංශයේ සේවයේ නියුතු නිලධාරීන් සම්බන්ධයෙන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් අනුමත කරවාගෙන අදාල වැටුප් තල වල පිහිටු වීමට කළමණාකරණය අපොහොසත් වී තිබුණි.

### 4.5 වාහන උපයෝජනය

කාර්යාංශය සතුව වාහන 38 ක ඇණියක් පවතින අතර ඒ වෙනුවෙන් කාර්යාංශය සතු ස්ථිර රියදුරන් 28 ක් හා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ තාක්ෂණික සේවා සමාගමෙන් කුලී පදනම මත ලබාගත් රියදුරන් 07 දෙනෙකු සේවය සඳහා යොදවාගෙන තිබුණි.සමාලෝචිත වර්ෂයේ වාහන අළුත්වැඩියා සඳහා දරන ලද වියදම රු. 4,403,377ක් විය.තවද පෞද්ගලික කටයුත්තක් සඳහා ධාවනයේ යෙදීමේදී අනතුරට පත් කැබ් රථය සඳහා ඇස්තමේන්තු කළ වියදම රු. 1,743,169 ක් වූ අතර වර්ෂයට අධික කාලයක් එය අළුත් වැඩියා කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දින හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 වගන්තිය අනුව සංයුක්ත සැලැස්ම හා අයවැය ලේඛණය, තථ්‍ය කාර්යය සාධන, දත්ත සමඟ කාලානුරූපීව සමාලෝචනය කර විචලනයන් පිළිබඳ පියවර ගැනීමට අධ්‍යක්ෂක මණ්ඩලය කටයුතු කර නොතිබුණි. 5:1:3 වගන්තිය අනුව යාවත්කාලීන කළ සංයුක්ත සැලැස්ම වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2012 -2015 සඳහා සකස් කර තිබූ සංයුක්ත සැලැස්ම 2012 ජුනි 22 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණි.

### 5.2 අයවැය පාලනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ක්‍රියාකාර සැලැස්මට අනුව රු. 319,900,000 ක් ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු වියදමක් දරා නොතිබුණු අවස්ථා 08 ක් ප්‍රාග්ධන වියදම් යටතේ නිරීක්ෂණය විය.

(ii) ප්‍රාග්ධන වියදම් යටතේ වැය විෂයයන් 07ක ප්‍රතිපාදන වෙන්කිරීමකින් තොරව රු. 2,141,736 ක වියදම් දරා තිබුණි.

### 5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

ඉහත චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව මූල්‍ය වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව භාෂා තුනෙන්ම පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2008, 2009 හා 2010 වර්ෂ සඳහා එසේ කටයුතු කර නොතිබුණි.

### 5.4 අභ්‍යන්තර විගණනය

ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු සහ සහායක නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර තිබුණි.

### 5.5 උපසමාගම්වල ආයෝජනයන්

කාර්යාංශය රු:මිලියන 4 ක ආයෝජනයක් සහිතව (60%ක කොටස් ප්‍රාග්ධන හිමිකමක් සහිතව ) එහි උපසමාගමක් ලෙස ජීඑස්එම්බී තාක්ෂණික සේවා පෞද්ගලික සමාගම ( GSMB Technical services (pvt) Ltd)සමාගම් පනත යටතේ පිහිටුවා තිබුණි. 2011 මාර්තු 31 දිනට කාර්යාංශය විසින් ආයෝජිත ප්‍රාග්ධනය වෙනුවෙන් ප්‍රකාශිත ලාභාංශය රු. 2,000,000 කි.

### 5.6 ඒකාබද්ධ අරමුදලට මුදල් බැර කිරීම

| වර්ෂය | මුළු ආදායම | මුළු අතිරික්තය /(ඌනතාවය) | ඒකාබද්ධ අරමුදලට බැර කල මුදල් ප්‍රමාණය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2009 | 627,169,486 | 385,563,862 | බැර කර නොතිබුණි. |
| 2010 | 767,587,528 | 469,504,024 | 622,749,479 |
| 2011 | 961,801,534 | 618,549,416 | 1,000,000,000 |

### 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය

(ඇ) අත්තිකාරම් පියවීම

(ඈ) ස්ථාවර වත්කම්

(ඉ) මහජන පැමිණිලි පරීක්ෂාව

(ඊ) සේවක කලමනාකරණය

(උ) කුලී පදනම මත සේවාවන් ලබා ගැනීම

(ඌ) ණයගැති/ණයහිමි පාලනය

(ඩ) වාහන භාවිතය

(ඪ) පලාත් කාර්යාල පරිපාලනය

(ඹ) රාජ්‍ය භාග අත්තිකාරම්

(ඹි) කැණීම් මත බලපත්‍ර අත්තිකාරම්

(ක) කාර්යාංශයේ බලපත්‍ර නිකුත් කිරීම

(ග) ප්‍රවාහන බලපත්‍ර ලබාදීම

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති

## විගණකාධිපතිගේ වාර්තාව සඳහා පිළිතුරු - 2011

මගේ අංකය : GM/AD/9

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ 2011 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (ඇ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව හා සම්බන්ධ කාර්යාංශයේ පැහැදිලි කිරීම

2. මූල්‍ය ප්‍රකාශන

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස්

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය සමග අනුකූල නොවීම (ශ්‍රී.ලං.ගි.ප්‍ර.)

(අ)මේවා විද්‍යාත්මක භාණ්ඩ වන හෙයින් මේ සම්බන්ධයෙන් කුසලතාවයක් සහිත පුද්ගලයන් සොයා ගැනීම දුෂ්කර වී ඇත. කෙසේ වුවද අවශ්‍ය පුද්ගලයන් ලබා දෙන ලෙස දැනුම් දෙමින් මොරටුව විශ්ව විද්‍යාලය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ලිපි යවනු ලැබ ඇත.

(ආ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 36 ට අදාළ කරුණු

විගණකාධිපතිවරයා විසින් පෙන්වා දෙනු ලැබ ඇති මෙම කරුණ කෙරෙහි අවධානය යොමු කරනු ලැබ ඇති අතර මෙම කරුණ නිවැරදි කිරීමට යථා කාලයේදී පියවර ගනු ලබනු ඇත. ණය ශේෂයන්ට අදාළ බොල් ණය සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට පියවර ගැනීමට අවධානය යොමු කර ඇත.

2.2.2. ගිණුම්කරණ අඩුපාඩු

(i) විගණනය මගින් පෙන්වා දී ඇති ආකාරයට වාහනවල ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වාහන ස්ථානගත ස්ථානය සොයා ගත හැකි උපකරණ පද්ධතිය මිලදී ගැනීමට අදාළ මුදල් ප්‍රමාණය ලබා දිය යුතුව තිබේ. මෙම කරුණ නිවැරදි කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

(ii) කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය සඳහා බදු කුලිය ලෙස ගෙවන ලද අත්තිකාරම් දීමනාව ප්‍රවර්තන වත්කම් යටතේ පෙර ගෙවුම් වියදම් ලෙස ඇතුළත් කර නොමැත. මෙම වරද නිවැරදි කිරීමට සටහන් කර ගෙන ඇත.

2.2.3. නොසැසඳූ පාලන ගිණුම

විගණකාධිපතිවරයා විසින් පෙන්වා දී ඇති පරිදි, 2011-12-31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන තුළ පෙන්නුම් කර ඇති ආදායම් සහ රාජ්‍ය භාග අත්තිකාරම් ගිණුම් සහ කැනීම් අංශය මගින් පිළියෙල කරන ලද මාසික සාරාංශ වාර්තා වල ශේෂ සැසඳීමේදී ශේෂයන් වෙනස් වනුයේ රු. 15,533,678 කින් නොව රු. 11,315,813 කින් පමණි. මීට අදාල පැහැදිලි කිරීම පහත දැක්වේ.

2011 සඳහා රාජ්‍ය භාගය - මාසික සාරාංශ වාර්තා සකස් කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් ආදායම

ලෙස ලැබුණු රු. 9,00046.28 ක මුදල කැනීම් අංශය විසින් සැලකිල්ලට ගෙන නොමැත. එහෙයින් කැනීම් අංශයේ වාර්තාවල රාජ්‍ය භාග ආදායම් ගිණුමේ ශේෂය මූල්‍ය ප්‍රකාශනවල රාජ්‍ය භාග ආදායම් ගිණුමේ ශේෂයට වඩා අඩුය. මෙම කාරණය කැනීම් අංශයේ අවධානයට යොමු කිරීමට පියවර ගනු ඇත.

රාජ්‍ය භාග අත්තිකාරම - ප්‍රමාණය රු. 2,941,426.00 කි. මේ ගැන සොයා බලා අදාළ කරුණ නිවැරදි කිරීමට සටහන් කර ගෙන ඇත.

බලපත්‍ර ගාස්තු - කාර්මික කැනීම් බලපත්‍ර ගිණුමේ රු. 24,400 ක හිඟයක් දක්නට ලැබෙන අතර මෙයට හේතුව මිල ලේඛන පරිගණකගත කිරීමේ දෝෂයකි. කාර්මික කැනීම් බලපත්‍ර බී ගිණුම රු. 19520 ක වෙනසක් පෙන්නුම් කරන අතර මෙයට හේතුව වී ඇත්තේ රු. 9760 බැගින් වූ මිල ලේඛන දෙකක් කාර්මික කැනීම් බලපත්‍ර බී අත්තිකාරම් ගිණුමෙන් හර කළ යුතුව තිබූ නමුත් මෙම ගිණුමෙන් හර කිරීමයි. මෙම හේතුව නිසා කාර්මික කැනීම් බලපත්‍ර බී ගිණුම රු. 19520 කින් අඩු වී ඇත.
(ඉන්වොයිස් අංක : 2011/6/28 දිනැති අංක 5742 සහ 2011/10/28 දිනැති ඉන්වොයිස් අංක 57461)

කාර්මික කැනීම් බලපත්‍ර සී කාණ්ඩයේ ගිණුම රු. 4880 ක අඩුවක් පෙන්නුම් කරයි. මෙයට හේතුව 2011 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී මිල ලේඛන ඇතුලත් කිරීමේදී කාර්මික කැනීම් බලපත්‍ර 'සී' අත්තිකාරම් ගිණුමෙන් හර කළ යුතුව තිබූ රු. 4880 ක මිල ලේඛනයක් කාර්මික කැනීම් බලපත්‍ර ආදායම් ගිණුමෙන් හර කිරීමයි. මෙම හේතුව නිසා කාර්මික කැනීම් බලපත්‍ර සී ආදායම් ගිණුම රු. 4880 ක අඩුවක් පෙන්නුම් කළේය. (ඉන්වොයිස් අංක 2011/10/28 දිනැති අංක 57414 කි) මෙම වරද නිවැරදි කිරීමට සටහන් කර ගෙන ඇත.

| | | |
|---|---|---|
| කාර්මික කැනීම් බලපත්‍ර බී ආදායම් ගිණුම | - | 19520.00 |
| කාර්මික කැනීම් බලපත්‍ර සී ආදායම් ගිණුම | - | 4880.00 |
| සම්පූර්ණ වෙනස | - | 24400.00 |

වෙළඳ බලපත්‍ර - වෙළඳ බලපත්‍ර බී සහ වෙළඳ බලපත්‍ර ඩී ට අදාළව වෙළඳ බලපත්‍ර ශේෂයන්ගේ වෙනස්කම් දක්නට ලැබුණි. වෙළඳ බලපත්‍ර බී හි ආදායමෙහි ශේෂය වෙනස්වීමට අදාළ පැහැදිලි කිරීම 03 (අ) උපලේඛනය තුළ දක්වා ඇත. රු. 1400 ක ලදුපතක් වැරදීමකින් වෙළඳ බලපත්‍ර ඩී ආදායම් ගිණුමට බැර කොට ඇත. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල සිදු කළ යුතුව තිබෙන වෙනස රු. 1400 ක් පමණි. එය වෙළඳ බලපත්‍ර ආදායම් ඩී ගිණුමෙන් හර කොට රාජ්‍ය භාග - වැලි ආදායම් ගිණුමට බැර කළ යුතුය. අනිකුත් වැරදි කැනීම් අංශය විසින් සිදු කොට ඇති ඒවා ය. මෙම කාරණය කැනීම් අංශයේ අවධානයට යොමු කිරීමට පියවර ගනු ලබනවා ඇත.

ප්‍රවාහන බලපත්‍ර - කැනීම් අංශය විසින් පිළියෙල කරන ලද මාසික සාරාංශ වාර්තාව තුළ මාර්තු මාසය සඳහා ප්‍රවාහන බලපත්‍ර ගාස්තු ලෙස රු. 5400.00 ක මුදලක් වැරදීමකින් වැඩිපුර සඳහන් වී ඇත. ඒ අනුව මාසික සාරාංශ වාර්තා තුළ ප්‍රවාහන බලපත්‍ර ගාස්තු ලෙස සඳහන් විය යුතු නිවැරදි මුදල් ප්‍රමාණය වන්නේ රු. 33,663,510 කි. තවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් ආදායම ලෙස ලැබුණු රු. 2,287,665 ක මුදලක් කැනීම් අංශයේ මාසික සාරාංශ වාර්තා සකස් කිරීමේදී සැලකිල්ලට ගෙන නොමැත. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන වල සඳහන් කර ඇති ශේෂය නිවැරදි වේ.

පරීක්ෂා කිරීමේ ගාස්තු - කැනීම් අංශයේ පරීක්ෂා කිරීම් ගාස්තු ලෙස සඳහන් වන ගාස්තු ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම් ගාස්තු සහ විශේෂ ක්ෂේත්‍ර පරීක්ෂා කිරීමේ ගාස්තු ලෙස වර්ග 2 ක් දක්නට ලැබේ. කෙසේ වුවද මෙම ගාස්තු වර්ග දෙක ගිණුම් අංශයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලබන්නේ වෙන වෙනම ගිණුම් දෙකකය.

උදා : ගිණුම් කේතය

30301 - ක්ෂේත්‍ර පරීක්ෂා කිරීමේ ගාස්තු ගිණුම
30302 - විශේෂ ක්ෂේත්‍ර පරීක්ෂා කිරීමේ ගාස්තු ගිණුම
ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල සඳහන් සම්පූර්ණ ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම් ගාස්තු පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| 30301 - ක්ෂේත්‍ර පරීක්ෂා කිරීමේ ගාස්තුව | - | 126769543.19 |
| 30302- විශේෂ ක්ෂේත්‍ර පරීක්ෂා කිරීමේ ගාස්තු | - | 1384200.00 |
| | | 128153743.19 |

කැනීම් විවිධ ආදායම් - කැනීම් වලින් ලැබෙනා වෙනත් ආදායම් සහ පැරණි බලපත්‍ර නොතිබීම හේතු කොට ගෙන අය කරනු ලබන දඩ මුදල් ආදායම කැනීම් විවිධ ආදායම් ලෙස කැනීම් අංශයේ වාර්තාවල දැක්වේ. කෙසේ වුවද ගිණුම් අංශයේ මූල්‍ය ප්‍රකාශන වල මෙම ආදායම් වර්ග දෙක වෙන වෙනම ගිණුම් වල පෙන්නුම් කෙරේ.

උදා : ගිණුම

303310 - වෙනත් කැනීම් ආදායම් ගිණුම
30314 - පැරණි බලපත්‍ර නොතිබීම හේතු කොට ගෙන අය කරනු ලබන දඩ මුදල් ආදායම

ඒ අනුව මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන මුළු කැනීම් විවිධ ආදායම පහත දැක්වෙන පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| 30310 | - වෙනත් කැනීම් ආදායම් ගිණුම | - | 13350706.91 |
| 30314 | - පැරණි බලපත්‍ර නොතිබීම හේතු කොට ගෙන අය කරනු ලබන දඩ මුදල් ගිණුම | - | 2863577.14 |
| | | | 16214284.35 |

රු. 154,549.38 මුදල සම්බන්ධයෙන් සොයා බැලීමට සටහන් කර ගෙන ඇත.

පරීක්ෂන පිපිරවීම් ආදායම

මෙම ආදායම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරනු ලබන ශේෂය ඒ සම්බන්ධයෙන් කැනීම් අංශයේ මාසික වාර්තාවේ පෙන්නුම් කරනු ලබන ශේෂයට වඩා රු. 30825 කින් අඩු ය. මෙය මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කළ යුතුය.

2.2.4. ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

(අ)මේ දක්වා අය කර ගැනීමට නොහැකි වී ඇති ණයගැති ශේෂයන් සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය පියවර ගන්නා ලෙසට නීති අංශයට දැනුම් දී ඇත. එලෙස තමනට ලැබිය යුතු මුදල් ලබා ගන්නා ලෙසට අදාළ ණය හිමි ආයතන වෙත ලිපි මගින් දැනුම් දී ඇති අතර එලෙස කටයුතු නොකරන්නේ නම් ඔවුන්ගේ මුදල් රජයේ ගිණුමට බැර කරනු ඇත.

(ආ) කැනීම් බලපත්‍ර අත්තිකාරම් ගිණුමට අදාළ සාරාංශය මේ සමග ඉදිරිපත් කරනු ලබන අතර අදාළ උපලේඛන පිළියෙල කිරීම 1994 වසරේ සිට අදාළ දත්ත එකතු කිරීමෙන් පසුව සිදු කළ යුතු කාර්යයකි. මේ සම්බන්ධයෙන් ගත යුතු පියවර සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගනු ඇත.

2.2.5. විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

ඉහත ගනුදෙනු පිළිබඳ තොරතුරු සහිත උපලේඛන විගණන සමාලෝචනය සඳහා භාර දී ඇති අතර අනිකුත් ලේඛන යථා කාලයේදී භාර දෙනු ලබනවා ඇත.

2.2.6. නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ සමග අනුකූල නොවීම

(අ)මූල්‍ය රෙගුලාසි සංග්‍රහය

(I) මූල්‍ය රෙගුලාසි අංක 104(4)

සමාලෝචිත වර්ෂය තුල කාර්යාංශයේ වාහනවලට සිදුවූ අලාභ හානි වලට අදාළ ලේඛන විගණනය සඳහා භාර දී ඇත. පිටපතක් ද යවා ඇත.

(II) මූල්‍ය රෙගුලාසි අංක 135

විගණකාධිපතිවරයා විසින් පෙන්වා දී ඇති කරුණු කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයට අදාළ වේ. රාජකාරි නිසි ලෙස බෙදා දෙමින් මූල්‍ය පාලනය සම්බන්ධ සියලුම නිල රාජකාරි සිදු කළ යුතුය යන කරුණ පිළිබඳව සියළුම ප්‍රාදේශීය කාර්යාලවලට දැනුම් දීමට පියවර ගනු ඇත.

(III) මූල්‍ය රෙගුලාසි අංක 144

විගණනය මගින් පෙන්වා දී ඇති ආකාරයට ක්‍රියා කිරීමට සියළුම ප්‍රාදේශීය කාර්යාල වෙත දැනුම්දීමට පියවර ගනු ඇත.

(IV) මූල්‍ය රෙගුලාසි අංක 177

ප්‍රමාදයකින් තොරව මුදල් බැංකුගත කරන ලෙස සියළුම ප්‍රාදේශීය කාර්යාල වෙත දැනුම්දීමට පියවර ගනු ඇත.

(V) මූල්‍ය රෙගුලාසි අංක 454 (1)

භාණ්ඩ ලැයිස්තුව විගණනය සඳහා ඉදිරිපත් කිරීමට යතා කාලයේදී පියවර ගනු ඇත.

(VI) මූල්‍ය රෙගුලාසි අංක 763

මේ සම්බන්ධයෙන් සොයා බලා මෙහි අභ්‍යන්තර පරිපාලනය සඳහා අවශ්‍ය විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගනු ඇත.

(VII) මූල්‍ය රෙගුලාසි අංක 1647 (අ)

වාහන සම්බන්ධයෙන් පූර්ණ සමීක්ෂණයක් සිදු කිරීමට පියවර ගනු ඇත.

(VIII) රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ දෙවන පරිච්ඡේදය

1994 ජුනි මස 14 දිනැති අංක 95 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛය
මහා භාණ්ඩාගාරයේ අනුමැතියට යටත්ව කාර්යාංශය විසින් දිරි දීමනා ගෙවනු ලැබේ. අදාළ රාජ්‍ය චක්‍රලේඛනවලට අනුකූලව ප්‍රසාද දීමනා ගෙවනු ලැබ ඇත.

(IX) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිකුත් කරන ලද 2009 ජනවාරි මස 08 දිනැති අංක 56/05/2008 දරන චක්‍රලේඛය
(කල් ඉකුත් වූ ප්‍රවාහන බලපත්‍ර කාර්යාංශය විසින් නැවත භාර ගැනීම)

කාර්යාංශය සතු ගබඩාවක් පන්නල පිහිටා නැත. දඩ මුදල් අය කිරීම සම්බන්ධයෙන් විගණනය විසින් පෙන්වා දෙන ලද කරුණු පිළිබඳව සොයා බැලීමට නිසි පියවර ගනු ලබනවා ඇත.

(X) 2003 ඔක්තෝබර් මස 28 වැනි දිනැති අංක 17 දරණ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තු චක්‍රලේඛය

මේ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය පියවර ගැනීමට සටහන් කර ගෙන ඇත.

2.2.7. මතභේදයට තුඩු දෙන ගනුදෙනු

අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරනා නිලධාරීන් හට දිරි දීමනා ගෙවා නොමැත. කෙසේ වුවද ඔවුනට ගෞරව දීමනාවක් ගෙවනු ලැබ ඇත. ගෞරව දීමනාව ලෙස ගෙවන ලද මුදල වැරදීමකින් දිරි දීමනා ගිණුමෙන් හර කරනු ලැබ ඇත. ඉහත කී දීමනාව අඩු කළ යුත්තේ වෙනත් ගිණුමකිනි.

3. මූල්‍ය සමාලෝචනය

3.1. මූල්‍ය ප්‍රතිඵල

රාජ්‍ය භාග ගෙවීම් අය කර ගැනීමට කාර්යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුළදී ගන්නා ලද ක්‍රියාමාර්ග හේතු කොටගෙන එකී ක්ෂේත්‍ර වල ආදායම වැඩි වී ඇත.

සමාලෝචිත වර්ෂය තුළ කාර්ය මණ්ඩලය වැඩි වීම නිසා පරිපාලන වියදම් වල කිසියම් වැඩිවීමක් සිදු වී ඇත.

3.2. විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) ආදායම් විශ්ලේෂණය

ප්‍රාදේශීය කාර්යාලවල කටයුතු විධිමත් කිරීම මගින් ආදායම වැඩි කරගැනීමට හැකි විය.

3.3. කාරක ප්‍රාග්ධනය කළමනාකරණය කිරීම

කාර්යාංශයේ අතිරික්ත මුදල් රාජ්‍ය ආයෝජනයන් සඳහා යෙදවිය හැකි හෙයින් එම මුදල් සුදුසු ආයෝජනයන්හි යොදවා ඇත.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1. කාර්ය සාධනය

(අ) (ආ) විගණනය විසින් පෙන්වා දී ඇති කරුණු කෙරෙහි කාර්යාංශය විසින් සිය අවධානය යොමු කර ඇති අතර අදාළ කටයුතු වල මූල්‍ය සහ භෞතික ප්‍රගතිය විගණනය වෙත යථා කාලයේදී ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට සටහන් කර ගෙන ඇත.

4.2. කළමනාකරණ අකාර්යක්ෂමතාවයන්

(4) කාර්යාංශයේ තොරතුරු තාක්ෂණ අංශයේ නිසි ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය කාර්යාංශයේ සේවක සංඛ්‍යා සැලැස්මට ඇතුළත් කර ඇත. වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම වෙත යැවීම පිණිස එම සැලැස්ම අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

(w) විද්යුත් - රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

එස් පී / එස් බී / 03 / 10 චක්‍රලේඛය ප්‍රකාරව විද්යුත් රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා කාර්යාංශය දැනටමත් ක්‍රියා කරමින් සිටියි. මෙය කෙටි කාලයකින් සම්පූර්ණ කළ නොහැකි නිසා මෙය සම්පූර්ණ කිරීම සඳහා සැලකිය යුතු කාලයක් අවශ්‍ය බව කාර්යාංශයේ මතයයි. මේ සම්බන්ධයෙන් කාර්යාංශය විසින් පහත සඳහන් පියවර ගෙන ඇත.

- අදාල කාර්ය ක්‍රියාත්මක කිරීම සඳහා පද්ධති අධ්‍යයනය සිදු කිරීමට සුදුසුකම් ලත් පුද්ගලයින් පිළිබඳව තොරතුරු ලබාගැනීමට පුවත්පත් දැන්වීමක් පළ කිරීම
- තොරතුරු තාක්ෂණ සන්නිවේදන ආයතනයේ සහ පරිසර අමාත්‍යාංශයේ නියෝජිතයින් එක්ව අදාළ තොරතුරු එවූ ආයතන අතුරින් ආයනත හතරක් නිර්දේශ කිරීම
- ඉහත කී ආයතන 4 න් ටෙන්ඩර් කැඳවීම
- තොරතුරු සන්නිවේදන තාක්ෂණ ආයතනයේ, පරිසර අමාත්‍යාංශයේ සහ කාර්යාංශයේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් විසින් ඉහත කී ටෙන්ඩර් ඇගයීමට ලක් කිරීම. මෙම අවස්ථාවේදී අදාළ ආයතන සමග සාකච්ඡා වට කිහිපයක් පවත්වා ඔවුන් විසින් සිදු කරන ලද ඉදිරිපත් කිරීම් නිරික්ෂණය කරන ලදී.
- වඩාත්ම සුදුසු ආයතනය කමිටුව විසින් තෝරා ගැනීම
- තෝරා ගනු ලැබූ ආයතනය විසින් මෙම ක්‍රියාවලිය පිළිබඳ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම (ප්‍රයිස් වෝටර් කූපර්ස්) මෙම අවස්ථාවේදී ඉහත කී ආයතනය විසින් කාර්යාංශය එක් එක් අංශය සමග වෙන වෙනම සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී. එලෙසම ප්‍රාදේශීය කාර්යාලවල නිලධාරීන් සමගද සාකච්ඡා පවත්වන ලදී.
- ප්‍රයිස් වෝටර් කූපර්ස් විසින් වරින් වර ඉදිරිපත් කරන ලද අනු වාර්තා කාර්යාංශය විසින් ඇගයීමට ලක් කිරීම
- ඉහත කී වාර්තාව කාර්යාංශය විසින් යථා කාලයේදී පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම වෙත ඉදිරිපත් කරනු ලබන අතර එය අනුමත වූ පසුව ඉහත කී කාර්යය ඉටු කිරීම සඳහා මෘදුකාංග නිර්මාණකරු තෝරා ගැනීම සඳහා මිල ගණන් කැඳවනු ඇත.

(ඇ) මහජන පැමිණිලි විමර්ශනය කිරීම

පෙන්වා දෙන ලද කරුණු පිළිබඳව කාර්යාංශයේ දැඩි අවධානය යොමු වී තිබෙන අතර, ඉහත කී කරුණු ගැන සොයා බලා මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගනු ඇත.

(ඈ) (ඊ) ඉහත කී කරුණු සම්බන්ධයෙන් විගණනය මගින් පෙන්වා දෙන ලද කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන නැත්තේ මන්ද යන්න සොයා බැලීමට සටහන් කර ගෙන ඇති අතර එම කරුණ සම්බන්ධයෙන් නිසි පියවර ගනු ලබනවා ඇත.

4.3. අක්‍රිය සහ උපයෝජනය නොකළ වත්කම්

(අ) (ආ)කාර්යාංශය විසින් තම ප්‍රධාන කාර්යාලය පිහිටුවීම සඳහා ඔරුගොඩවත්තේ පිහිටි ඉඩමක් මිලට ගන්නා ලදී. කෙසේ වුවද මෙම ප්‍රදේශය වෙනත් සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා යෝජනා කොට තිබූ හෙයින් මෙම ඉඩම තුළ අපගේ ප්‍රධාන කාර්යාලය ඉදි කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබාගැනීමට නොහැකි විය. කෙසේ වුවද මේ සම්බන්ධයෙන් අප විසින් තවදුරටත් නාගරික සංවර්ධන අධිකාරියෙන් විමසා ඇති අතර ඔවුන්ගේ තීරණය ලද පසු අවශ්‍ය පියවර ගනු ලබනවා ඇත. 2010 වර්ෂයේදී ද තම ප්‍රධාන කාර්යාලය ඉදි කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක් කාර්යාංශය විසින් ලබා ගන්නා ලද අතර එම අවස්ථාවේදීද එම ඉඩමට අදාළ නීතිමය හිමිකම ලබා ගැනීමේදී දුෂ්කරතාවයන්ට මුහුණ දීමට කාර්යාංශයට සිදු විය. නාගරික සංවර්ධන අධිකාරිය සමග මේ සම්බන්ධයෙන් තවදුරටත් සාකච්ඡා සිදු කරනු ලබමින් පවතී.

4.4. කාර්ය මණ්ඩලය පාලනය කිරීම

(අ) දැනට පුරප්පාඩු නොමැති තනතුරු සඳහා (උදා : රියදුරු, ලිපිකරු) සහ අදාළ වසරේදී පුරප්පාඩු පිරවීමට තිබූ තනතුරු සඳහා (උදා : ක්ෂේත්‍ර නිලධාරී, කාර්මික නිලධාරී) කාර්යාංශය විසින් අනියම් පදනම මත බඳවා ගැනීම් සිදු කරන ලදී.

(ආ) මේ සම්බන්ධයෙන් අදාළ ලිපිවල පිටපත් යථා කාලයේදී ඉදිරිපත් කිරීමට සටහන් කර ගෙන ඇත.

4.5. වාහන ඌන උපයෝජනය කිරීම

විගණන වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂය තුළ වාහන අළුත්වැඩියා කිරීම සඳහා වැය කරන ලද මුදල රු. 4,403,377.00 කි. රියදුරන්ට නිල ඇඳුම් ලබා දීම සඳහා වැය කරන ලද රු. 299,175.34 ක මුදල ද එම මුදල් ප්‍රමාණයට ඇතුළත් කර ඇති හෙයින් වාහන අළුත්වැඩියා වියදම් ලෙස දක්වා ඇති මුදලෙන් එම මුදල අඩු කළ යුතුය. ඒ අනුව වාහන අළුත්වැඩියා කිරීම සහ අනෙකුත් අළුත්වැඩියා කටයුතු සඳහා වැය කරන ලද සත්‍ය මුදල වනුයේ රු. 4,104,202.03 කි.

අංක ජඅ-9000 දරණ කැබ් රථයට සිදු වූ අනතුරු හේතු කොටගෙන එම වාහනයේ සම්පූර්ණ වැසියම ජපානයෙන් ආනයනය කිරීමට සිදු විය. ඒ අනුව ටොයොටා ලංකා සමාගමට එම වාහනය අළුත්වැඩියා කිරීමට අවුරුද්දකට වැඩි කාලයක් ගත වූ අතර අළුත්වැඩියා කටයුතු සම්පූර්ණ කරනු ලැබීමෙන් පසුව දැන් එය හම්බන්තොට ප්‍රාදේශීය කාර්යාලයට අනුයුක්ත කරනු ලැබ ඇත.

විගණන වාර්තාවේ සඳහන් කරන ලද වාහන අතුරින් ජඅ-8999ල ජඅ-8997 සහ ජඅ-7878 යන අංක දරණ වාහනවල අළුත්වැඩියා කටයුතු නිම කොට ඇත. අංක 7425 දරණ වාහනයේ අළුත්වැඩියා කටයුතු තවම නිම කොට නොමැත.

කාර්යාංශයට සිදු කිරීමට ඇති රාජකාරි ගමන් බිමන් සංඛ්‍යාව වැඩි හෙයින් සුළු අනතුරුවලදී වාහන අළුත්වැඩියා කර ගැනීමේදී ප්‍රමාදවීම් ඇති විය. කෙසේ වුවද මෙම කාරණය සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කිරීමට ක්‍රියා කරනු ඇත.

5. ගිණුම්කරණය සහ යහපාලනය

5.1. ආයතනික සැලැස්ම

2012 - 2015 කාලපරිච්ඡේදයට අදාළ ආයතනික සැලැස්මට 2012.06.22 දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දෙන ලදී. එය මේ සමග විගණන සමාලෝචනය සඳහා ඉදිරිපත් කරනු ඇත.

5.2. අයවැය පාලනය

| | රු. මිලියන |
|---|---|
| ප්‍රධාන කාර්යාලය ඉදි කිරීම (පළමු අදියර) | 270 |
| කලාපීය කාර්යාලය ඉදි කිරීම (ගම්පහ) | 25 |
| ප්‍රාදේශීයකාර්යාල සඳහා ඉඩම් මිලදී ගැනීම | 5 |
| විදීම් උපකරණ | 1 |
| ERP පද්ධතිය නිර්මාණය කිරීම | 10 |
| දෘඪකාංග නිර්මාණය කිරීම | 5.5 |
| මෘදුකාංග නිර්මාණය කිරීම | 3.4 |
| | 319.9 |

ප්‍රධාන කාර්යාල ඉදි කිරීම සඳහා රු. මිලියන 270 ක් වෙන් කර දී ඇත. ඉඩම පවරා දීම තවමත් නිම කොට නොමැති හෙයින් ගොඩනැගිල්ල ඉදි කිරීම හා සම්බන්ධ මූලික කටයුතු තවමත් සිදු කරනු ලබමින් පවතී. රු. මිලියන 25 ක් යක්කල ප්‍රාදේශීය කාර්යාලය සඳහා වෙන් කර දී ඇත. ඉහත කී කාර්යය මේ වන විට ආරම්භ කර ඇත. මේ වන විට ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 4.4 ක් මුදා හැර ඇති අතර ඉතිරි ගෙවීම් කටයුතු ව්‍යාපෘතිය සම්පූර්ණ කළ පසු ගෙවනු ඇත.

ප්‍රාදේශීය කාර්යාල සඳහා ඉඩම් මිලදී ගැනීමට කාර්යාංශය විසින් ප්‍රතිපාදන වෙන් කර දී ඇත. මේ සඳහා මිල ගණන් කැඳවමින් පුවත්පත් දැන්වීම් පළ කර ඇති මුත් සුදුසු මිල ගණන් තවමත් ලැබී නොමැත. විදිම් උපකරණ මිලදී ගැනීම සඳහා ද කාර්යාංශය විසින් මිල ගණන් කැඳවනු ලැබුවද තවමත් සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගැනීමට නොහැකි වී ඇත.

ERP පද්ධතිය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ කටයුතු දැනටමත් ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. කාර්ය අධ්‍යයන කාර්ය සාධනය සහ සුදුසු ආයතනයන් තෝරා ගැනීම වැනි කටයුතු දැනටමත් ක්‍රියාත්මක කර ඇත.

5.3. වාර්ෂික වාර්තා සභාගත කිරීම

2008 සහ 2009 යන වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුව වෙත යැවීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර 2010 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවට අදාළ කටයුතු සම්පූර්ණ කරනු ලැබ ඇත.

6. පද්ධති සහ පාලන

විගණනය මගින් පෙන්වා දී ඇති පරිදි පද්ධති සහ පාලන යන ක්ෂේත්‍රවල වැඩි දියුණු කිරීම් සිදු කිරීමට විශේෂ අවධානය යොමු කිරීමට සටහන් කර ගෙන ඇත.

ආචාර්ය එන්. පී. විජයානන්ද
සභාපති
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

පිටපත් - 01. විගණන අධිකාරී, ජී. එස්. එස්. පී. පෙරේරා
02. ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය
03. ලේකම්, පරිසර අමාත්‍යාංශය

## භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ආයතනික සමාජ වගකීම්

රටෙහි ඛනිජ සම්පත් අනාවරණය කර ගැනීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ සහ භූ විද්‍යා හා කැනීම් කටයුතු පිළිබඳ පාලන කටයුතු සිදු කරනා ජාතියේ ප්‍රධානතම රාජ්‍ය ආයතනය වන භූ විද්‍යා සමීක්ෂන හා පතල් කාර්යංශය ලොකු කුඩා සැමට අවශ්‍ය උපදෙස් එක සේ අපක්ෂපාතී ලෙස සපයයි. කැනීම් හා ඒ ආශ්‍රිත කටයුතු මගින් ස්වාභාවික සහ සමාජ පරිසරයන්ට සාමාන්‍යයෙන් ඇති කරන්නේ අහිතකර බලපෑම්ය. පාලන ක්‍රමෝපායන් මගින් මෙම බලපෑම් අවම කිරීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය කැප වී සිටියි. ඉඩම් අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන සහ පොලීසිය වැනි අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ පුළුල් සහභාගිත්වය ඇතිව රාජ්‍ය නිලධාරීන්, කැනීම්කරුවන් සහ ප්‍රජාව වෙත දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රදර්ශන ආදිය පැවැත්වීම මගින් මෙම කාර්යය ශක්තිමත් කෙරේ. සමාජ වගකීම් පිළිබඳ අපගේ යහපත් පරිචයන් පහත සඳහන් වේ.

- කැනීම් මගින් හානියට පත් ප්‍රදේශ ප්‍රතිසංස්කරණය කිරීම
- පාරිසරික ලෙස යථා තත්ත්වයට පත්වීම පිළිබඳ අධ්‍යයනයන්/ ඒ සඳහා ක්‍රියා කිරීම
- දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ/ ප්‍රදර්ශන/ අධ්‍යාපන වැඩසටහන්/ දැනුවත් කිරීමේ පෝස්ටර්
- භූ අවදානම් සිදුවීම් වලදී යොදනා ප්‍රතිකර්ම සඳහා සක්‍රිය ලෙස සම්බන්ධ වීම
- වෙනත්

  (අ) නිවසක් ඉදි කිරීම
  (ආ) පාසල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම
  (ඇ) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ සුභසාධන සංගමය හරහා
  (ඈ) භූ විද්‍යා සමීක්ෂණ හා පතල කාර්යාංශයේ බෞද්ධ සංගමය හරහා

## පතල් කැනීම් නිසා හානියට පත් වූ ප්‍රදේශ පුනරුත්ථාපනය කිරීම

### (අ) මාඔය පුනරුත්ථාපන වැඩසටහන

කෑගල්ලෙන් ආරම්භ වී ගලා යන මා ඔය ගම්පහ අඹේපුස්ස ප්‍රදේශවලින් ගලා ගොස් කොච්චිකඩේ ප්‍රදේශයේදී මුහුදට එක් වෙයි. බස්නාහිර පළාත සඳහා ප්‍රධාන වශයෙන්ම වැලි සපයනු ලබන්නේ මෙමගින් වන අතර වාර්ෂිකව වැලි ටොන් විශාල සංඛ්‍යාවක් මෙමගින් ලබා ගනු ලැබේ. අක්‍රමවත් සහ අනවසර වැලි කැනීම් සහ මැටි කැනීම් හේතු කොට ගෙන ඇතිවන අහිතකර බලපෑම් සහ වෙනත් ස්වාභාවික හේතු ද මත මා ඔයෙහි ඇති සුන්දරත්වය විනාශ වී ඇත. හානියට පත් වූ ප්‍රදේශ කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවය මෙමගින් අවධාරණය කරනු ලැබුණි. වැලි කැනීම් සිදු කරනා පුද්ගලයින්ගේද සහයෝගය ඇතිව 2008 වර්ෂයේදී මා ඔය ප්‍රතිසංස්කරණ කටයුතු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ආරම්භ කරන ලද අතර දැනට එය අදියර කිහිපයකින් ක්‍රියාත්මක වෙමින් පවතී.

**පළමු අදියර** දිවුලපිටිය පාරම්පරික වැලි කැනීම්කරුවන්ගේ සංගමයේ සහයෝගය ඇතිව ගං ඉවුර සහ අවට හානියට පත් ප්‍රදේශ ප්‍රතිසංස්කරණය කිරීමේ පළමු අදියර නිම කරන ලදී.













**දෙවන අදියර** මා ඔය ප්‍රතිසංස්කරණය කිරීමේ දෙවන අදියර දිවුලපිටිය සම්ප්‍රදායික වැලි කනින්නන් සහ ප්‍රවාහනය කරන්නන්ගේ සංගමයේ සහ 'යලි පිබිදෙන මා ඔය' නම් වූ පාරිසරික පදනමේ සහයෝගය ඇතිව පහත සඳහන් අරමුණු පෙරදැරි කරගෙන 2010 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

- හානියට පත් වූ සහ විනාශයට පත් වූ ගං ඉවුරු යළි සකස් කිරීම
- කැනීම් කටයුතු නිසා ඇති වූ විශාල වලවල් පස් දමා පිරවීම
- නිසි ක්‍රමවේදයන් යොදාගෙන ඉවුරු සංරක්ෂණය කිරීම
- වාහන සහ යන්ත්‍රෝපකරණ ඇතුල් කිරීම මගින් නිර්මාණය වූ පිවිසුම් මාර්ග වසා දැමීම
- සුදුසු ජලාපවහන පද්ධතියක් නිර්මාණය කිරීම
- ප්‍රතිසංස්කරණය කරන ලද භූමි ප්‍රදේශවල වගා කටයුතු සිදු කරන ලෙස උපදෙස් දීම

## (ආ) පහත සඳහන් හානියට පත් ගංගා ඉවුරු ප්‍රතිසංස්කරණය සහ යථා තත්ත්වයට පත් කිරීම

- මහවැලි ගඟ - මහියංගනය ප්‍රදේශය
- කුමා ඔය- වැල්ලවාය
- හෙද ඔය - සියඹලාන්ඩුව
- කුඹුක්කන් ඔය - මොනරාගල
- මැණික් ගඟ - බුත්තල
- මදුර ඔය - බබල
- දහමල් ඔය - මැදගම
- වලවේ ගඟ - සෙවනගල

## (ඇ) බලපිටිය පාරිසරික ප්‍රතිසාදන අධ්‍යයන /සහභාගිත්ව වැඩසටහන යටතේ රට අභ්‍යන්තරයේ වැලි කැනීම් සිදු කරන ලද වලවල් ප්‍රතිසංස්කරණය කිරීම





## පාරිසරික ප්‍රතිපාදන අධ්‍යයන / සහභාගිත්ව වැඩසටහන

### (අ) පාරිසරික ප්‍රතිපාදන අධ්‍යයනයන්

2 ඩී ප්‍රතිරෝධතා විශ්ලේෂණය යොදා ගනිමින් කැලිකසල ගොඩනැගීම සිදු කරනා ස්ථාන කිහිපයක් යථා තත්ත්වයට පත් කිරීම සඳහා භූ - භෞත ගවේෂණයන් සිදු කරන ලදී. ආරම්භයේදී අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ ඉල්ලීම මත කැලිකසල ගොඩනැගීම සිදු කරන ස්ථානයේ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමේ යන්ත්‍රාගාරයක් ඉදි කිරීම සම්බන්ධව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරන ලදී. උප පෘෂ්ඨයෙහි ජලය රැඳීම, ජල ස්ථායිතාවය සහ සන්නායකතාවය ආදිය පිළිබඳ ද්විමාන සමීක්ෂණයක් මත පදනම්ව මෙම අධ්‍යයනය සිදු කරන ලදී.










## ආ) දැයට සෙවන රුක් රෝපණ වැඩසටහන

දැයට කිරුළ වැඩසටහන යටතේ 2011 නොවැම්බර් මස 15 දින මොනරාගලදී රුක් රෝපණ වැඩසටහනක් පවත්වන ලදී.

ගම්පහ දිස්ත්‍රික්කයේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල්






කැනීමේ කාර්යාංශයෙහි භූමියෙහි භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට අයත් පැල තවානක් සකස් කරන ලදී. පැල 5000 ක් නිෂ්පාදනය කිරීමේ ශක්‍යතාවය මෙම පැලතවානට ඇත. පුනරුත්ථාපන කටයුතු සඳහා යොදාගැනීමට මෙම පැල ප්‍රාදේශීය කාර්යාල අතර බෙදා දීමට සැලසුම් කර ඇත. ප්‍රදේශය තුළ පවතින අවශ්‍ය ශාක විශේෂ වනුයේ මී, නා, කුඹුක්, සහ උණ ආදියයි.





## දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ/ ප්‍රදර්ශන/ අධ්‍යාපන වැඩසටහන්

### අධ්‍යාපන වැඩසටහන්

### (අ) කාර්මික වශයෙන් ගල්පර පිපිරවීමේ සහතිකපත්‍ර පාඨමාලාව

දීර්ඝ කාලයක් තිස්සේ පැවති අවශ්‍යතාවයක් සපුරාලමින් ශ්‍රී ලංකාව තුළ ගල්පර පිපිරවීමේ කර්මාන්තය තුළ නිරතව සිටින තාක්ෂණික සහ අධීක්ෂණ මට්ටමේ නිලධාරීන් සඳහා සැලසුම් කරන ලද ගල්පර පිපිරවීම් පිළිබඳ තුන්මාසික සහතික පත්‍ර පාඨමාලාවක් ආරක්ෂක අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරිය හා එක්ව 2011 ජුනි මාසයේදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් පවත්වන ලදී. දෙවන වැඩසටහන 2012 මැයි මාසයේදී පවත්වන ලදී.

ගල්වලවල්හි ගල්පර පිපිරවීම් හා සම්බන්ධ පිපිරවීම් උපකරණ පිළිබඳව වඩාත් හොඳ මට්ටමින් න්‍යායික සහ ප්‍රායෝගික දැනුම ලබා දීම එහිදී භාවිතා කරන ක්‍රමවේදයන් සහ සමාජ හා පාරිසරික බලපෑම් පිළිබඳව දැනුම ලබාදීම මෙම පාඨමාලාවේ ප්‍රධාන අරමුණ විය.

මෙම වැඩසටහන වාර්ෂිකව පවත්වනු ලබන අතර ආරක්ෂක ප්‍රමිතීන් සහ පිපිරවීම් ඵලදායිතාවය ඉහළ නැංවීම එමගින් අපේක්ෂා කෙරේ.





### (ආ) කැනීම් අංශය විසින් සංවිධානය කරන ලද වැඩමුළු සහ සම්මන්ත්‍රණ

කැනීම් කටයුතු හා සම්බන්ධ ප්‍රධාන කාර්මික ගැටළු නිරාකරණය කිරීමසඳහා සහ පතල් සහ ඛනිජ පනත ප්‍රකාරව කාර්යාංශය සතු නියාමන කාර්යයන් පිළිබඳව රාජ්‍ය ආයතන සහ බලපත්‍ර හිමියන් දැනුවත් කිරීම සඳහා පතල් කාර්යාංශය විසින් විවිධ දිස්ත්‍රික්කවලදී වැඩමුළු සහ සම්මන්ත්‍රණ කිහිපයක් පවත්වන ලදී. පතල් හා ඛනිජ ක්‍රියාත්මක පනත ක්‍රියාත්මක කිරීමේදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි වෙනත් රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම මෙම වැඩමුළුවල ප්‍රධාන අරමුණ විය. පතල් අංශය විසින් පවත්වන ලද වැඩමුළු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

## 2011 වසර

| වැඩමුළුව / දැනුවත් කිරීමේ වැඩසටහන | දිනය | තේමාව |
|---|---|---|
| උමා ඔය ව්‍යාපෘතියේ වැඩමුළුව - වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 2011.02.25 | උමා ඔය ව්‍යාපෘතියට අදාල භූ විද්‍යා සහ කැනීම් කටයුතු |
| මධ්‍යම පරිසර අධිකාරියේ දැනුවත් කිරීමේ වැඩසටහන | 2011.04.23 | ධක්‍ෂ ව්‍යාපෘතියට අදාළ පාරිසරික සහ සමාජ ගැටළු |
| පන්නල ප්‍රදේශයේදී ගරු අමාත්‍යතුමා සමග එක්ව පවත්වන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන | 2011.05.10 | කැනීම් බලපත්‍ර නිකුත් කිරීමේ ගැටළු වලට අදාල නීතිමය ක්‍රියා පටිපාටිය සහ සමාජ ගැටළු |
| සී/ස පාරිසරික පදනම ආයතනය සමග ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද වැඩමුළුව | 2011.06.10 | මාඔය ඉවුරු ප්‍රතිසංස්කරණය කිරීම |
| මන්නාරම දිස්ත්‍රික් කාර්යාලයේදී පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන | 2011.08.13 | මන්නාරම දිස්ත්‍රික්කය තුළ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි නියාමන කටයුතු |
| ගඩොල් සහ උළු නිෂ්පාදකයන් හට දිවුලපිටියේදී පවත්වන ලද වැඩමුළුව | 2011.08.20 | කැනීම් බලපත්‍ර නිකුත් කිරීම හා අදාල නීතිමය සහ ප්‍රායෝගික ගැටළු |
| විල්ගමුවේදී පවත්වන ලද වැඩමුළුව | 2011.09.08 | විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි මහවැලි නදිය ආශ්‍රිතව වැලි කැනීම |
| මධ්‍යම පරිසර අධිකාරියේ දැනුවත් කිරීමේ වැඩසටහන | 2011.10.01 | පතල් හා ඛනිජ පනතෙහි නීතිමය පැතිකඩ සහ පොලිස් දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය |
| වැලි කැනීම් සිදු කරන පුද්ගලයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන | 2010.11.15 | නීතිවිරෝධී වැලි කැනීම් කටයුතු අවම කිරීම |
| දංකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩමුළුව - පොලිස් දෙපාර්තමේන්තුව | 2011.03.22 | කැනීම් කටයුතු වලට අදාල නීතිමය පැතිකඩ |
| රත්නපුර වැඩමුළුව<br>හම්බන්තොට වැඩමුළුව<br>මොනරාගල වැඩමුළුව<br>කොළඹ / ගම්පහ වැඩමුළුව<br>මාතර වැඩමුළුව<br>බදුල්ල වැඩමුළුව<br>කළුතර වැඩමුළුව<br>කුරුණෑගල වැඩමුළුව<br>හම්බන්තොට වැඩමුළුව | 2011.04.27<br>2011.05.03<br>2011.05.10<br>2011.09.06<br>2011.06.03<br>2011.09.15<br>2011.09.16<br>2011.10.03<br>2011.10.27<br>2011.11.06 | ඛනිජමය නොවන කටයුතු සඳහා වැලි, පස් සහ බොරලු ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී අනුගමන බයුතු ක්‍රියා පටිපාටීන් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත හඳුන්වා දීම |

කැනීම් අංශය විසින් සංවිධානය කරන ලද ඉහත සඳහන් සම්මන්ත්‍රණ වැඩමුළුවලට අමතරව භූ විද්‍යා අංශයද පහත සඳහන් ආකාරයේ වැඩසටහන් ගණනාවකට සහභාගි විය.

- භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් සංවිධානය කරන ලද පාසල් විද්‍යා වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන්
- ශ්‍රී ලංකා භූ විද්‍යා සංගමය සහ වෙනත් විවිධ සංගම් විසින් සංවිධානය කරන ලද පාසල් වැඩසටහන්
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්

## ප්‍රදර්ශන

### (අ) දැයට කිරුළ ප්‍රදර්ශනය

2011 වර්ෂයේදී මොනරාගල දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා ඉතාම මැනවින් සැලසුම් කරන ලද වැඩසටහන් පවත්වන ලදී.






### (ආ) දැයට කිරුළ ප්‍රදර්ශනයට අමතරව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය පාසල් සහ වෙනත් සංවිධාන විසින් සංවිධානය කරන ලද ප්‍රදර්ශන ගණනාවකටද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සහභාගි විය.

**ඉහළ මට්ටමේ අවබෝධයන් ලබා දුන් ප්‍රදර්ශන කිහිපයක් වන්නේ**

2010 - පරිසර අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද 'දෑ අභිමානී වයඹ උදානය' ප්‍රදර්ශනය
2011 - (අ) ගම්පහ බණ්ඩාරනායක විදුහලේදී පවත්වන ලද ප්‍රදර්ශනය
(ආ) මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් සංවිධානය කරන ලද බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වූ මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනයේ ඛනිජ හා පාෂාණ ප්‍රදර්ශන කුටිය

## භූ අවදානම් සිදුවීම් වලට අදාළ ප්‍රතිකර්ම යෙදීමට ක්‍රියාකාරීව සහභාගි වීම

මනුෂ්‍ය ජීවිතයට තර්ජනයක් එල්ල විය හැකි ආකාරයේ ස්වාභාවික ව්‍යසනයක් හෝ භූමි විපර්යාසයක් රටේ කිසියම් ප්‍රදේශයකින් වාර්තා වුවහොත් (සුනාමි හෝ භූ චලන වැනි භූ අවදානම් හෝ භූ ව්‍යසන තත්ත්වයන්) එම තත්ත්වය විමර්ශනය කොට ජනතාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය නම් සුදුසු අවදානම් දුරලීමේ ක්‍රියාමාර්ගද සහිතව අදාළ බලධාරීන් දැනුවත් කිරීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය කඩිනම් පියවර ගනු ඇත.
උදා : සියඹලාන්ඩුව සහ කතරගම අවට මෑතකදී වාර්තා වූ භූ චලන සිදුවීම් ගණනාවක් සහ මාතලේ සහ බදුල්ල යන ප්‍රදේශවල නිවාස වල ඇති වූ ඉරි තැලීම් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් අධ්‍යයනය කර ඇත.

## භූමිකම්පා අනාවරණය කරගැනීමේදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි යාන්ත්‍රණය සහ මෙහෙයුම්

පුළුල් කලාප මධ්‍යස්ථාන 3 කින් 'සමන්විත භූ චලන අධ්‍යයන ජාලයකින් මුළු රටම ආවරණය කරනු ලැබේ. මෙම මධ්‍යස්ථාන මහකනදරාව (මධ්‍යස්ථාන සංකේතය - මල්ක්) පල්ලෙකැලේ (පල්ක්) සහ හක්මන (හල්ක්) යන ස්ථානවල ස්ථිර ලෙස ස්ථාපනය කර ඇත. මීට අමතරව, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි භූ චලන දත්ත මධ්‍යස්ථානය ලොව පුරා ඇති මධ්‍යස්ථාන 40 ක් සමඟ සම්බන්ධ වී ඇත.

මෙම සියලුම පුළුල් කලාප මධ්‍යස්ථාන ප්‍රධාන කාර්යාලයෙහි භූ කම්පන දත්ත සහ චන්ද්‍රිකා සන්නිවේදන තාක්ෂණය හරහා දවසේ පැය 24 පුරාම ක්‍රියාත්මක වන සුනාමි අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය සමග සම්බන්ධ වී ඇත. ඒ අනුව ප්‍රධාන කාර්යාලය වෙත නිසි කලට ලැබෙන භූ කම්පන දත්ත භූ කම්පන පරාමිතීන් හඳුනාග ැනීම සහ භූ කම්පන තොරතුරු පත්‍රිකා පිළියෙල කිරීම සඳහා කාර්ය නියුක්ත නිලධාරීන් විසින් විශ්ලේෂණය කරනු ලැබේ. අනුමැතිය ලද පසු භූ කම්පන තොරතුරු පත්‍රිකා අදාළ රාජ්‍ය ආයතන (ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ) සහ මාධ්‍ය වෙත නිකුත් කරනු ලැබේ.

## වෙනත්

### (අ) නිවසක් ඉදි කිරීම

2011 දැයට කිරුළ වැඩසටහනට සමගාමීව මොනරාගල දිස්ත්‍රික්කය තුළ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි බලපත්‍ර හිමියන්ගේ සහයෝගය ඇතිව මොනරාගල දිස්ත්‍රික්කය තුළ ජීවත් වන නිවසක අවශ්‍යතාවය ඇති පවුලකට ජීවත්වීම සඳහා නිවසක් ඉදි කර දෙන ලදී.





### (ආ) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි සුභසාධක සංගමය

කාර්ය මණ්ඩලය අතර හිතෛෂී සම්බන්ධතාවය ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි සුභසාධක සමිතිය ක්‍රියාත්මක වේ.



සියලුම ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයන් මෙහි සාමාජිකයන් ලෙස ඇතුලත් කරගෙන ඇත. එක් එක් සාමාජිකයාගෙන් අය කර ගනු ලබන සාමාජික මුදලට අමතරව සුබසාධක සමතියේ මුල්‍ය ශක්තිය වැඩි දියුණු කිරීම පිණිස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ද එක් එක් සාමාජිකයා වෙනුවෙන් මුදලක් සංගමය වෙත මාසිකව වෙන් කරනු ලැබේ.

## (ඇ* බෞද්ධ සමාජය



භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි සේවය කරන බොහෝ බෞද්ධයෝ මෙහි සාමාජිකත්වය දරති. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි සහ තම සාමාජිකයන්ගේ සුබසිද්ධිය උදෙසා බෞද්ධ ප්‍රතිපත්ති ඉගැන්වීම, අනුගමනය කිරීම සහ අවබෝධ කර ගැනීම දිරිගැන්වීම සඳහා බෞද්ධ වැඩසටහන් ගණනාවක් මෙමගින් සංවිධානය කෙරේ. 2011 වර්ෂයේදී අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටි ග්‍රාමීය විහාරයක් සඳහා ඇඳන් 50 ක් මෙට්ට 50 ක් සහ අනිකුත් අත්‍යවශ්‍ය භාණ්ඩ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි බෞද්ධ සංගමය විසින් පරිත්‍යාග කරන ලදී. මෙමගින් ප්‍රදේශයේ ජීවත් වන දිලිඳු බවින් පීඩාවට පත් ජනතාව වෙත සුවිශාල ආගමික සහ සමාජීය සේවාවන් රැසක් ඉටු කළද මෙම පරිත්‍යාගය සිදු කරන අවස්ථාව වන විට එම පන්සල තිබුණේ ගරා වැටුණු තත්ත්වයකය. සංගමයේ සාමාජිකයන්, සුභ පතන්නන් සභාපතිතුමා, අධ්‍යක්ෂවරුන්, සාමාන්‍යාධිකාරීතුමන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ බොහෝ සාමාජිකයන්ගේ සහභාගිත්වය ඇතිව මෙම පුණ්‍ය කර්මය ඉටු කරන ලදී.